අරගලයට අවි තනන

# Left

2024 ජනවාරි-මාර්තු
07 වෙළුම 04 කලාපය
ISSN 2279 - 1027
මිල රු.200/=



## සංස්කෘතික ජීවිතයක්

අරගලයට
අවි තනන
# Left
න්‍යායික දේශපාලන සඟරාව

2024 ජනවාරි-මාර්තු
07 වෙළුම
04 කලාපය
ISSN 2279 - 1027

**ප්‍රධාන සංස්කාරක**
ප්‍රසන්න පෙරේරා

**කර්තෘ මණ්ඩලය**
වෛද්‍ය එච්.පී. ධම්මික
සුජීව දිසානායක
වෛද්‍ය සුසිල් රණසිංහ
බිමල් රත්නායක
සුනිල් ගමගේ
ඇන්ටන් ජයකොඩි

**ආරාධිත ලේඛකයෝ**
මහාචාර්ය චන්දන අබේරත්න
මහාචාර්ය හිනිදුම සුනිල් සෙනෙවි

**පරිගණක පිටු සැකසුම**
බන්දුල පුෂ්පකුමාර

**මුද්‍රණය**
ටී.ඩී.එල්. ප්‍රින්ටර්ස්
43/43, වලව්වත්ත පාර,
ගංගොඩවිල, නුගේගොඩ.

**බෙදාහැරීම**
Lanka First Rate Publishers (Pvt) Ltd
0714 492 252

**විමසීම්**
298, කලපළුවාව, රාජගිරිය.
0777 802 707
magazineleft@gmail.com

## පෙළගැස්ම

| | |
|---|---|
| සංස්කෘතික මිනිසා | 04 |
| සංස්කෘතික පිරිහීම | 11 |
| ඇල්ගොරිදම්වලට නටන මිනිස්සු | 17 |
| යහපත් සංස්කෘතියක් වෙනුවෙන් | 25 |
| නව සංස්කෘතිකමය සමාජයක් | 34 |
| සංස්කෘතික ජීවිතයක් | 47 |
| දැනුමෙන් ඔබ්බට | 50 |
| කෙටි කතාව | 54 |
| කවි | 59 |
| වැව රවුම | 61 |



## "ප්‍රපාතයක මුවවිට සිටින මිනිසා හේතු නොසොයයි"

-වී. අයි. ලෙනින් -

'රෝම අධිරාජ්‍යයේ පරිහානිය සහ ඇදවැටීමේ ඉතිහාසය' (The History of the Decline and Fall of the Roman Empire) යන කෘතිය සම්පාදනය කළ ඉංග්‍රීසි ජාතික ඉතිහාසඥයකු වූ එඩ්වඩ් ගිබන් (Edward Gibban) ඉතිහාසය නැති නම්, මානව සමාජයේ ගමන ගැන මෙසේ ලියා තිබේ : "ඉතිහාසය යනු මිනිස් වර්ගයාගේ අපරාධ, මෝඩකම් සහ අවාසනාවන් පිළිබඳ වාර්තාවකට වැඩිමනත් දෙයක් නොවේ" (Histrory is little more than the register of the crimes, follies and misfortunes of mankind).

එක්සත් ජනපදය මෙතෙක් බිහි කළ ප්‍රධානම කාර්මික ධනපතියකු වූ හෙන්රි ෆෝර්ඩ් (Henry Ford) ඉතිහාසය නැතිනම්, මානව සමාජයේ ගමන ගැන ප්‍රකාශ කළේ : "ඉතිහාසය යනු බොරුවක්" ලෙසිනි. එය තවත් පැහැදිලි කළ ඔහු ප්‍රකාශ කළේ ඉතිහාසය යනු එක් පිස්සු වැඩකට පසු තවත් එවැනිම එකක් සිදුවන ක්‍රියාවලියට වඩා යමක් නොවන බවයි (Histiry is just one damned thing after another).

එමෙන්ම තවත් ප්‍රධානම ද්‍රව්‍යවාදී චින්තකයකු ලෙස සලකන ස්ටීවන් ජේ ගෝඩ් (Stephen Jay Gould) ප්‍රකාශ කළේ සත්ව පරිණාමයේ පහළ සහ ඉහළ යනුවෙන් දෙයක් නොමැති බවත්, ඇමීබාවාත්, මිනිසාත් යන දෙදෙනාම පරිණාමයේ සමාන ස්ථානයක සිටින සත්වයන් දෙදෙනකු ලෙස සැලකිය යුතු බවයි.

මිනිස් සමාජය සංවර්ධනය වේද? එය පහළ සිට ඉහළ අවධි දක්වා ගමනක නිරත වෙමින් සිටීද? එසේත් නැති නම්, එය එවන් සැලැස්මකට, නියාමයකට අනුව ගමනක නිරත නොවන 'ඔහේ එහේ මෙහේ යන' පුරෝකථනය කළ නොහැකි ගමන් පථයක යන්නේද? එසේත් නැතිනම්, එය පහළ සිට ඉහළට වර්ධනය වී නැවත පහළට ගමන් කරමින් තිබේද? එසේත් නැත්නම්, මිනිස් සමාජය නියාම පාලිත, පහළ සිට ඉහළ දක්වා වූ අඛණ්ඩ සර්පිලාකාර (ඓතිහාසික භෞතිකවාදී දැක්ම මඟින් යෝජනා කරන ආකාරයේ) ගමන් පථයක නිරත වේද? අද ලොව තුළ - දේශපාලන තලය තුළ - සාකච්ඡාවට ලක්වෙමින් තිබෙන 'දාර්ශනික' විවාදයක් වන්නේ මෙයයි.

ඉහත උපුටන ලද ඉතිහාසඥ ගිබන්ට අනුව මිනිස් සමාජය එකිනෙකට සම්බන්ධතාවක් නැති මිනිසාගේ අපරාධ, මෝඩකම් සහ අවාසනාවන් පිළිබඳ වාර්තාවක් පමණි. හෙන්රි ෆෝර්ඩ්ට අනුවද ඉතිහාසය කිසිදු පිළිවෙළක්, සබඳතාවක් නොමැති 'අහඹුවල එකතුවකි'. චින්තක ස්ටීවන්ට අනුව 'වර්ධනය' යනුවෙන් දෙයක් නැත. මේ සියලු තර්කවල පදනම වී ඇත්තේ, මිනිස් ඉතිහාසය පහළ සිට ඉහළට සංවර්ධනය වන, නියාම පාලිත, පුරෝකථනය කළ හැකි යමක් නොවන බවය.

නූතන ගිබන්ලා සහ ෆෝර්ඩ්ලා වන ගිරිමුදුනටම තමන් නැඟ ඇතැයි කියන ජෝ බයිඩ්න්ලා, එලෝන් මස්ක්ලා පිළිගන්නා සමාජ දර්ශනය මෙය වන බැවින්, ලෙනින් පැවසූ පරිදිම ඔවුන් ගිරිමුදුනෙහිම සිටින බැවින්, ඔවුහු තර්ක සහ හේතු සෙවීම නොකරති. ඉතිහාසයේ ගමන අවසාන (End of History) වී ඇති නිසා, තමන් ගිරිමුදුනට ම නැඟ ඇති නිසා දිනෙන් දින නාය යන ගිරිමුදුනේ කෙසේ හෝ පැවැත්ම වෙනුවෙන් ඔවුහු හිතෙන හිතෙන දේ කරති.

නමුත්, ඊට වඩා යමක් මිනිස් සමාජය තුළ සිදු නොවන්නේද? ගල් දුන්නත්, රොකට්ටුවත් සමානද? හෝමෝ ඉරෙක්ටස්ගේ සහ හෝමෝ සේපියන්ගේ හැකියාවනුත්, චින්තනයනුත් සමානද? 1800 වන තුරුත් ලොව ආයු අපේක්ෂාව වසර 40ක්ව තිබී වසර 200ක් තුළ 2023 වන විට එය වසර 73ක් වී තිබීම තේරුම් කරන්නේ කෙසේද? 1950 පමණ වන විටත් ජනගහනයට අවශ්‍ය කරන ආහාර ප්‍රමාණය නිපදවා ගැනීමට බැරිව තිබූ මිනිස් සමාජයක් ඉන් වසර 50කට පසු ජනගහනය කෝටි 815ක්ව සිටිය දී, කෝටි 1,400කට අවශ්‍ය කරන ආහාර නිෂ්පාදනය කිරීම තේරුම් කරන්නේ කෙසේද? අනෙක් අතට කෝටි 1,400කට සරිලන ආහාර නිපදවද්දීත්, කෝටි 300ක් දෙනා දිනපතා නිරාහාරව නින්දට යන්නේ ඇයි? ලෝකයේ වෛද්‍ය සහ සෞඛ්‍ය තාක්ෂණය, සංවිධානය මෙතරම් ඉදිරියට ගොස් තිබියෙදී, බටහිර යුරෝපයේ ආයු අපේක්ෂාව වසර 82.7ක්ව තිබියෙදී, බටහිර අප්‍රිකාවේ ආයු අපේක්ෂාව වසර 57.7ක් වශයෙන් වසර 25ක්ම අඩු වී ඇත්තේ මන්ද?

මිනිස් සමාජය තුළ මෙම කාලය තුළ සිදුවන බොහෝ දේ සමාජ, ආර්ථික, පාරිසරික ලෙස සැලකුවහොත්, බැලූබැල්මටම එම ක්ෂේත්‍රවල ගෝලීය පරිමාණයෙන් පසුපසට යාමක්, බිඳවැටීමක් තිබෙන බව පැහැදිලිය. පසුගිය දශක ගණනාවක් තිස්සේ පොදුවේ මෙම 'කඩාවැටීම', පසුපසට යාම, පිරිහීම ජීවමාන සාක්ෂිවලින් තහවුරු වී තිබේ. ධනවාදයේ අර්බුදකාරී අවධියේ දී එය එසේ වීම ඓතිහාසික භෞතිකවාදයට අනුව අරුමයක්ද නොවේ. නමුත්, ධනවාදී උගතුන් සහ බුද්ධිමතුන් එය එසේ පිරිහෙන, පසුපසට වැටෙන යමක් ලෙස පිළිගැනීමට අකැමැතිය. ඔවුහු මෙම 'පිරිහීම' දනිති; නමුත්, එයට බලපා ඇති හේතු සහ නියාමයන් පිළිබඳව නොදන්නවුන් සේ සිටිති. ඒ වෙනුවට ඔවුහු ඉතිහාසඥ ගිබන් මෙන් ෆෝර්ඩ් මෙන් ඉතිහාසයේ අවසානය ගැන න්‍යායයන් සම්පාදනය කරති. රෝම අධිරාජ්‍යයේ පිරිහුණු අවධිය (අවසාන වසර 300) තුළ පැනනැඟි ස්ටොයික්වාදී (Stoicism), සංශයවාදී (Skepticism), නරුමවාදී (Cynicism), නව ප්ලේටෝවාදී (Neoplatonism) ආදී න්‍යායයන් අතර සහ වත්මන් ධනවාදයේ පිරිහුණු අවධිය තුළ මතු කරමින් තිබෙන දෘෂ්ටිවාදයත් අතර ඇති සමානකම පුදුමසහගතය.

නමුත්, සත්‍යය වන්නේ රෝමය බිඳවැටුණු යුගයේ රජ කළ නරුමත්වය, සංශයවාදය, දැඩි විඥානවාදී දෘෂ්ටි බොරු කරමින්, මිනිස් සමාජය වසර 2,000ක් තුළ ඊට පෙර වසර ලක්ෂ 20 තුළම අත්පත් කර ගත් වර්ධනයන්ට වඩා වැඩි වර්ධනයක් පොදුවේ අත් කරගෙන තිබෙන බවයි. ඒ වර්ධනයේ මූලික න්‍යෂ්ටිය වන්නේ නිෂ්පාදන බලවේග, මිනිසා, විද්‍යාව සහ තාක්ෂණය වර්ධනය කර ගැනීමයි. ආයු අපේක්ෂාව වසර 40 සිට 73ක් දක්වා වැඩි වන්නේ එම නිෂ්පාදන බලවේගවල සමස්ත වර්ධනය නිසා මිස අන් කුමක් නිසාද?

නමුත්, අනෙක් අතට රෝම අධිරාජ්‍යය පැවැති යුගයේ සියලුම යුද්ධවලින් මිය ගිය ප්‍රමාණයට වඩා වැඩි පිරිසක් ලෝක යුද්ධ දෙක තුළ ඝාතනය විණි. අදද ඝාතනය කෙරේ. අතීත රෝමය තුළ මානසිකව විනාශ කෙරුණු, වහලුන් ලෙස හැඳින් වූ මිනිසුන් මෙන් දහස් ගණනක් මිනිසුන් වත්මන් පංති සබඳතා තුළ දිනපතා පරත්වාරෝපණයට, මිනිස් රොඩු බවට පත් කෙරේ. දරුවන් මරා දැමේ. කාන්තාවන් ලිංගික වහලියන් සේ විකුණනු ලැබේ. සංස්කෘතියේ මුදුන් මල්කඩවල් බඳු ස්ථාන බෝම්බ වරුසාවලින් 'රථගාල්' බවට පත් කෙරේ. ආයු අපේක්ෂාව වැඩි කළ ඖෂධම වෙනස් කර කෘත්‍රිම මත්ද්‍රව්‍ය නිපදවා වසර 35 තරුණයන් ජීවිතවලින් ඉවත් කෙරෙමින් තිබේ. වත්මන් ලෝකය අත්දකිමින් සිටින්නේ රෝමය බිඳවැටුණු යුගයේ ප්‍රතිඵලම බවට අන් කවර තර්කද?

මිනිසා සතු දැනුම, තාක්ෂණය, සංවිධාන සහ කළමනාකරණ ඥානය මිනිසාට එරෙහි මෙවලමක් කර ගනු ලැබ තිබේ. ඒ, ගිරිමුදුනට නැඟ ගත් හේතු නොසොයන ධනපතීන් පිරිසක් විසින් එම දැනුමේ, තාක්ෂණයේ, නිෂ්පාදනයේ අයිතිය පෞද්ගලික දේපළ ලෙස අත්පත් කර ගනු ලැබ තිබෙන බැවිනි. එම නිසා මිනිස් සමාජය තල්ලු කරනු ලබමින් තිබෙන්නේ නැවත වනචාරීත්වයේ දිශාවටය. 'සංස්කෘතික මිනිසා' නිමවිය හැකි උපකරණ සහ දැනුම 'වනචාරී සත්වයා' නිර්මාණය කිරීමට යොදා ගනු ලබමින් තිබේ. මාක්ස්වාදයේ න්‍යායාචාර්යවරුන් පැවසූ පරිදි මිනිස් වර්ගයා මංසන්ධියකට පැමිණ සිටී. ඔහුට යා හැකි මාවත් දෙකක් තිබේ. එකක්, ම්ලේච්ඡත්වයේ මාවතය. අනෙක සංස්කෘතියේ මාවතය. වසර 150ක් තිස්සේ මිනිසා මේ මංසන්ධියේ ද්වන්ධ යුද්ධයක පැටළී සිටී. මේ මොහොත ම්ලේච්ඡත්වය යම් යම් ජයග්‍රහණ අත්පත් කර ගන්නා මොහොතක් ලෙසද පෙනේ. එහෙත්, ඉතිහාසයේ රෝදය කරකැවෙන්නේ මිනිස් සමාජයේ නිශ්චිත නියාමවලට අනුව ම්ලේච්ඡත්වයේ දිශාවට නොවේ; සංස්කෘතියේ, සමාජවාදයේ දිශාවටය.

මෙවර 'Left' ම්ලේච්ඡත්වයට එරෙහිව සංස්කෘතිය වෙනුවෙන් සටන් වදින්නන් වෙනුවෙනි!

මෙවර 'Left' ගිරිමුදුනේ සිටින හේතු නොසොයන්නන් වෙනුවට ගිරිමුදුන සමබිමක් කර, ගිරිමුදුන වෙත මිනිස් වග කැටුව යාමට පොරබදන 'දන්කෝ' ලා වෙනුවෙනි!

මෙවර 'Left' මුළුමනින්ම මිනිසා වෙනුවෙනි! මිනිසුන්, මිනිසුන් කිරීමට කැප වන මිනිසුන් සහ ගැහැනුන් වෙනුවෙනි!



# සංස්කෘතික මිනිසා

## සත්ව ස්වභාවය ඉක්මවූ මිනිස් සත්වයා

***ධනුෂ්ක හර්ෂණ වික්‍රමරත්න***

මිනිසා නම් සත්වයා බිහි නොවන්නට විශ්වයේ අපූර්වත්වයක් නැත. ඒ, එහි අපූර්වත්වය පරාවර්තනය කළ හැක්කේ මිනිසාටම පමණක් බැවිනි. අනෙක් අතට විශ්වීය අපූර්වත්වයේ මිනිසාද පාර්ශ්වයකි. මිනිසා යනු සොබාදහම ඉක්මවූ සොබාදහමය. සත්ව සන්තතිය ඉක්මවූ සත්වයාය. සොබාදහම ඔහුට අවි ලෙස භාවිතා කළ හැකි අංගෝපාංග ප්‍රබලව ලබාදුන්නේ නැත. ඔහු එයට එරෙහිව දුන්න, ඊතලය, හෙල්ල, තුවක්කුව, මිසයිලය නිර්මාණය කළේය. සොබාදහම ඔහුට අධි වේගයෙන් දිවිය හැකි සහ අධික බර ඉසිලිය හැකි පාද ලබා දුන්නේ නැත. ඔහු ඊට එරෙහිව රෝදය නිමවා වැඩිදියුණු කළේය. දැන් ඔහු වේගවත්ව ගමන් බිමන් යයි. ඕනෑම බරක් ප්‍රවාහනය කරයි. සොබාදහම ඔහුට පියාපත් දුන්නේ නැත. ඔහු ගුවන්යානය, රොකට්ටුව නිර්මාණය කළේය. දැන් ඔහු අභ්‍යවකාශය තරණය කරයි. සොබාදහම ඔහුට වරල් දුන්නේ නැත. ඔහු හබල රුවල වැඩි දියුණු කොට මාළිගා වැනි නැව් තැනුවේය. දිය යට කිමිදෙන කිමිදුම් කට්ටල සහ සබ්මැරීන් තැනුවේය. ඔහු සොබාදහම දුන් දෙයට අමතරව ඉන් බොහෝ ඉදිරියට ගිය අවි නම් උපකරණ

සහ යන්ත්‍ර නිමවන ලදී. ඒ සියල්ලට හැකි වන සේ මිනිසා තම සිරුරද මනසද වැඩිදියුණු කළේය. සොබාදහම දුන් හස්තය වෙනුවට විශ්වය පැරද විය හැකි අපූර්ව හස්තයක් නිර්මාණය කළේය. එනම්, තමන්මද යළි නිර්මාණය කර ගත්තේය. මිනිසා බිහිවන්නේ එවන් අපූරු සත්වයකු ලෙසිනි.

මානව කල්ප වානරයාද උපකරණ භාවිත කරයි. මිනිසාද උපකරණ භාවිත කරයි. එහෙත් එය දෙයාකාරය. මානව කල්ප වානරයා (නූතන මිනිසා හෙවත් හෝමෝසේපියන්ගේ පූර්වජයා) සොබාදහම විසින් සපයන ලද උපකරණ පමණක් භාවිතයට සීමා විය. චිම්පන්සියෙකුට කොළ අත්තකින් කුහඹු ගුලක් ඇවිස්සිය හැක. ගලකින් තද ඇට වර්ග තළාගත හැක. එහෙත් මානව කල්ප වානරයාට උපකරණ නිර්මාණය කළ නොහැක. උපකරණ නිර්මාණය කරන්නේ මිනිසාය. ගල් අවි නිපදවූයේද මිනිසාය. එය පහසු කටයුත්තක් නොව අසීරු නිර්මාණශීලී කටයුත්තකි. ඒ සඳහා සුදුසු ගල් වර්ගය තෝරාගත යුතුය. එහි ඉවත් කළ යුතු කොටස් තෝරා ගත යුතුය. එසේ ඉවත් කිරීම සඳහා තවත් රළු මතුපිටක ඇතිල්ලීම, වෙනත් තද ගලකින් ගසා කඩා ගැනීම වැනි තාක්ෂණික ක්‍රම සොයාගත යුතුය. මහත් ශ්‍රමයක් (විසල් ස්නායු සෛල ක්‍රියාකාරිත්වයක් හා විසල් පේශී සෛල ක්‍රියාකාරිත්වයක්) යොදමින් එය සකසා මුවහත් කළ යුතුය. නැතිනම් උල් තුඩක් සකසා ගත යුතුය. අවසන එම උපකරණයට ලී මිටක් ගැටගසා සකස් කළ යුතුය. මෙම සමස්ත ක්‍රියාවම ශ්‍රමය වැගිරවීමයි. ස්වාභාවික උපකරණ භාවිත කරන මානව කල්ප වානරයාගේ එම ක්‍රියාව කලල රූපාවස්ථාවේ පැවැති ශ්‍රමයයි. වර්ධිත ශ්‍රමය වන්නේ තමන් විසින්ම උපකරණ සාදාගෙන කරනු ලබන නිෂ්පාදන ක්‍රියාවලියේ මෙහෙයුමයි. එය හුදකලා ශ්‍රම කාර්යයක් නොවේ. සාමූහික ශ්‍රම මෙහෙයුමකි. "ශ්‍රමය විසින් මිනිසා බිහි කරන ලදී" යනුවෙන් එංගල්ස් පවසන විට "සාමූහික ශ්‍රමය විසින් මිනිසාගේ පැවැත්ම තහවුරු කළ බවද" අපට කිව හැකිය. ඒ අනුව නිෂ්පාදනය අරමුණු කොට ගත් මිනිස් සාමූහිකත්වයක් ලෙස සමාජය බිහිවූ බව මාක්ස් ලෙනින්වාදය තහවුරු කරයි.

*"ගස් නගින වඳුරන්ගේ සිට මිනිසා දක්වා පරිණාමය වීමට මිනිසාගේ ජීවිතයේ එක් තත්පරයකට වඩා වැදගත් නොවන පෘථිවියේ ඉතිහාසය අනුව බලන විට නිසැක ලෙසින්ම වසර ලක්ෂ ගණනක් ගෙවී ගියේය. එහෙත් කෙසේ වුවද, එය අවසානයේ ඇති විය. වානර රංචුවක් සහ මිනිස් සමාජය අතර විශේෂ ලක්ෂණයක් ලෙස අප යළිත් දකින්නේ මොනවාද? ශ්‍රමයය. භූගෝලීය කොන්දේසි අනුව සහ අසල්වැසි රැළෙහි ප්‍රතිරෝධනය අනුව වානර රැළ තමාට වෙන්වී ඇති ප්‍රදේශයේ ආහාර කා දැමීමට සමත් විය. එය වෙනත් ප්‍රදේශවලට යාමටත්, ආහාර සඳහා සටන් කිරීමටත් ඉදිරිපත් විය. එහෙත් ඒ වානරයින්ට ස්වභාවදහම දුන් දේ හැර වෙනත් දේ ලබා ගැනීමට දක්ෂතාවයක් නොතිබිණි."*

(ෆෙඩ්රික් එංගල්ස් - (වානරයාගේ සිට මිනිසා දක්වා පරිවර්තනය වීමේදී ශ්‍රමය ඉටු කළ කාර්ය කොටස)

**මානව ප්‍රහර්ෂය උත්කර්ෂයට නංවන සංස්කෘතික මිනිසා**

මිනිසා මිනිසෙකු වන්නේද සිය පැවැත්ම තහවුරු කරගන්නේද නිෂ්පාදනය අරමුණු කොටගත් මිනිස් සාමූහිකත්වය ඇරැඹි තැන් සිටය. දැන් ඔහු සතුව සොබාදහමේ මෙහෙයුමෙන් ස්වාධීන වටිනාකම් පවතී. ඒවා නම් සොබාදහමින් මුණගැස්ස වූ එහෙත්



තමන් විසින් යළි නිමවූ අධ්‍යාත්මික හා භෞතික වටිනාකම්ය. මේ පාර්ශ්වයන් දෙක හා ඒ සමඟ බැඳි මානව සම්බන්ධතාවයන් ප්‍රකාශයට පත්වීම සංස්කෘතිය නම් වේ. මෙම භෞතික හා අධ්‍යාත්මික පාර්ශ්වයන් දෙක එකක් අනෙකෙන් ස්වායත්තව නොපවතී. මේ දෙක අතර වෙන්කළ නොහැකි ඒකත්වයක් හා අරගලයක් පවතී. රොබෝවරයෙකු වුව හුදු ද්‍රව්‍යමය ක්‍රියාකාරිත්වයක් පමණක් නොවේ. ඒ හා බැඳි මිනිස් සමාජ සම්බන්ධතා හා වෙනත් අධ්‍යාත්මික බැඳීම් සමුදායක් වේ. ඒ සියල්ල සංස්කෘතියය. මිනිසා බිහිවූ තැන් සිටම සංස්කෘතික සත්වයෙකු යැයි හඳුන්වනු ලැබිය හැකිය.

ඔහුට අන් සතුන්ට මෙන්ම කුසගින්න දැනේ. එහෙත් ඔහු ආහාර පුළුස්සා කෑමෙන් ඇරඹී ආහාර සකස් කොට කෑම මගින් දැවැන්ත ආහාර සංස්කෘතියක් බිහිකර ගනී. ආහාර පිළියෙල කිරීම යන්නට ආහාර විවිධත්වයද ආහාර හැඩ ගැන්වීමද රස ගැන්වීමද අයත්වේ. සොබාදහමේ ආහාරයට ගත හැකි ශාක කොටස් හඳුනා ගෙන එයින් ඉදිරියට නව එළවළු, පලතුරු, ධාන්‍ය නිර්මාණය කරගනී. ඔහුටද අන් සතුන්ට මෙන්ම පිපාසය (දියර අවශ්‍යතාවය) සංසිඳුවා ගත යුතුය. ඔහු හුදු ජලයෙන් තෘප්තිමත් නොවේ. ජලය අනුසාරයෙන් විවිධ රසවත් පානයන්, උත්තේජක පානයන්, පෝෂක පානයන් සකසා ගනී. එහි පිරිසිදුකමද සලකා බලයි. මේ සියල්ල සංකලනයෙන් ආහාර සංස්කෘතිය වර්ධනය කරයි. දැන් ඔහු ප්‍රිය සම්භාෂණ පවත්වයි. මානව සම්බන්ධතා පුළුල් කරයි. ඒවා මගින් ඔහු සතුටේ තෘප්තිය ඉහළ නංවා ගනී.

එපමණක් නොවේ ඔහුට තම පංචේන්ද්‍රියන් සහ අධ්‍යාත්මය එකවර තෘප්තිමත් කිරීමට අවශ්‍ය වේ. එවිට ඔහු සතුටේ විවිධ උල්පත් සොයා යයි. මේ මිනිස් ස්වභාවය විසින් ඔහු නව නිපයුම් සොයාගනී. ඒ වටා බැඳි නව සංස්කෘතික හැඩතලයන් සොයා ගනී. ඔහුට ජීවියකු ලෙස ලිංගික අවශ්‍යතා පැන නැගුනද සත්ව ස්වභාවය ඉක්මවා විරුද්ධ ලිංගිකයා පිළිබඳ අධ්‍යාත්මික හැඟීමක් බැඳීමක් ඇති කරගනී. එය ආදරය නම් අධ්‍යාත්මික බැඳීම දක්වා වර්ධනය කරගනී. ඔහු ඒ විරුද්ධ ලිංගික ආකර්ෂණය බැඳීමකට සහ විඳීමකට හරවා ගනී. ඔහුට සත්වයකු ලෙස නින්ද අවශ්‍යය. ඔහු වැටුණු තැන නොනිදයි. ඔහුට ඒ සඳහා සයනයක්, නිඳන කාමරයක් අවශ්‍යය; පොරෝනයක් අවශ්‍යය; සුගන්ධවත් පරිසරයක් අවශ්‍යය; වායුසමනය අවශ්‍යය. මේ නිසා ඔහු තාක්ෂණය දියුණු කරයි. ද්‍රව්‍යයේ නව ජාති ලක්ෂණ හඳුනා ගනී. ඒ ඔස්සේ මිනිසා තම සංස්කෘතික ජීවිතය ගොඩනගා ගනී.

සංස්කෘතිය තනි මිනිසකු ලෙස ගොඩනැගෙන්නේ නැත. සංස්කෘතිය මිනිස් සමූහයක් තුළ බිහිවන්නකි. සංස්කෘතියෙන් බැහැර වීම යනු ඔහු මිනිස් ස්වභාවයෙන් හුදු සත්ව ස්වභාවයට පසුබැසීමකි. ධනවාදය නිමවන්නේ හුදු ආත්මාර්ථකාමී හුදකලා මිනිසුන්ය. එකිනෙකා පරයා තරග වදින සමාජයක්ය. එවන් සමාජයක එවන් මිනිසුන් සංස්කෘතික වශයෙන් ගොඩනැගෙන්නේ නැත. ධනවාදය සිදුකරන්නේ මිනිසාගේ සංස්කෘතික අවශ්‍යතාවයන්ද විකුණා ගැනීමයි. ඒවාට අවශ්‍ය භාණ්ඩ නිපයුම මගින් දැවැන්ත ශ්‍රම සූරාකෑමක් සිදුකිරීමය. බහුජාතික සමාගම් සමාජය සිසිල් කළ උත්තේජක පානවලට ඇබ්බැහි කරවයි. එය සතුටම නොවේ. පිළිකා කාරක පවා යොදාගනිමින් ආහාර රස ගන්වයි; වර්ණ ගන්වයි. ලිංගික ආශාවන් විකුණන ලිංගික කර්මාන්තයන් පවත්වා ගෙන යයි. විලාසිතා කර්මාන්තයන් බිහිකරයි. එහි අනෙක් අතට සංස්කෘතික ජීවිතයක් කෙසේ වුවද මූලික මිනිස් අවශ්‍යතා පවා අහිමි කළ සතුන් වැනි ජීවිත ගෙවන කෝටි ගණන් ජනතාව තව තවත් වර්ධනය කරයි. එයට සමාන්තරව මානව සමාජ සම්බන්ධතා වෙනුවට හුදකලා නරුම මිනිස් සත්වයින් බිහිකරයි. ධනවාදය තුළ මිනිස් වටිනාකම් හෙවත් සංස්කෘතික බව අහිමි කළ සාතිශය බහුතරයක් වේ. එබැවින් ධනවාදය තුළ සංස්කෘතික මිනිසා සොයා යෑම යැයි තේමාවක් ගොඩ නැඟී තිබේ. එහි අරුත යළි මිනිස්කම පිහිට විය යුතු බවය.

**සංස්කෘතික විවිධත්වය යනු සංස්කෘතික ඒකත්වයකි**

රට රටවල එකිනෙකට වෙනස් සංස්කෘතීන් පවතී. එක් භූමියක් තුළද වෙනස් සංස්කෘතීන් පවතී. එකම භාෂාව තුළද සංස්කෘතික වශයෙන් උප බෙදීම් පවතී. විවිධ සංස්කෘතික ප්‍රාදේශීයකරණයන් පවතී. මෙය සංස්කෘතික විවිධත්වයයි. මානව සංස්කෘතිය බිහිවන්නේ මානව සමාජ පරිණාමයට සමාන්තරව නම් විවිධත්වයක් ඇතිවන්නේ ඇයි? උදාහරණයක් වශයෙන් ගන්නේ නම් ධනවාදී ලෝකය පුරාම එකම සංස්කෘතික මට්ටමක් නොමැත්තේ ඇයි? මෙයට බලපාන ප්‍රධාන සාධක දෙකකි. පළමුවැන්න නිෂ්පාදන මට්ටමේ විෂමතාවයයි. දෙවැන්න භූගෝලීය පැවැත්මේ විෂමතාවයයි.

සුදු කෙල්ලන්ද කළු කෙල්ලන්ද වඩා ප්‍රියමනාප යැයි ප්‍රශ්නයක්

ඇසුවොත් ඝර්ම කලාපීය රටවලින් ලැබෙන පිළිතුරත්, හිරු දුරස්ථ රටවලින් ලැබෙන පිළිතුරත් එකිනෙකට වෙනස්ය. බටහිර යුරෝපයේත් නැගෙනහිර යුරෝපයේත් එකම පිළිතුර ලැබෙනු ඇත. (අමතර කරුණක් වශයෙන් නව යටත්විජිත රටවල තම යටත්විජිත ස්වාමියාගේ වර්ණය වන සුදු වන්දනීය වර්ණයකි.) දේශගුණික සාධකයන්ගේ බලපෑමට ඔරොත්තු දීමට ඇතිවූ සමේ වර්ණය තම රුචිකත්වයේ පුරුද්ද වූ පසු එය තම ප්‍රියමනාප වර්ණය ලෙස සංස්කෘතික කැමැත්තක් බවට පත්වේ. මෙයට වර්ණ භේදවාදී විෂ පිඹහල පසු වර්ණයේ උස් පහත් බවක් ඇතිවේ. භේදවලින් මිදුන නිදහස් මිනිසෙකුට සුදුද කළුද දෙකම සුන්දර වන්නේ සෞන්දර්යාත්මක අරුතකින්ය. මෙලනින් වර්ණකය සමේ පැහැය අති කළු හෝ අති සුදු අතර සංචලන මාපකයක් වන්නේ සංස්කෘතික බලපෑම් හේතුවෙනි. එහෙත් ඒ සංස්කෘතික විවිධත්වයන් සෞන්දර්යය නම් මානුෂීය වින්දනය තුළ ඒකත්වයකි. එය සංස්කෘතික මිනිසාගේ ලක්ෂණයකි. සංස්කෘතික විවිධත්වය ඒකත්වයක් වන්නේ දියුණු සංස්කෘතියක් තුළදීය. දියුණු සංස්කෘතික ඇසකට කළුම කළු හෙවත් නිලට හුරු පෙම්වතෙකු සහ කහම කහ හෝ සුදුම සුදු පෙම්වතියක යන දෙදෙනා සුන්දර දසුනක් විය හැකිය.

## විවිධත්වය බිහිකරන සංස්කෘතික මූලයන් ද්විත්වය

ලොම්වලින් තොර නිරුවත් සිරුර මානව පරිණාමයෙන් ලද දායාදයකි. එබැවින් මිනිසාට විලිලැජ්ජාව හෝ නිරුවත් සිරුර වසා ගැනීමේ සදාචාර හැඟීමක් මුල් යුගයේදී ඇති වූයේ නැත. මුලින්ම මිනිස් ගැහැනිය සහ පිරිමියා ඇඳුම් ආයිත්තම් යොදා ගන්නේ සැරසිලි කරන ආභරණයක් ලෙසිනි. මුලදී ඔවුහු මුහුණ, පපුව, ලිංගේන්ද්‍රය, තට්ටම් ආදිය වර්ණ ගන්වන්නට වූහ; පබළු, කොළ අතු, සම් පොතු, සිප්පි කටු ආදියෙන් සරසා ගත්හ; පසුව සොබාදහමෙන් එන පීඩාවන්ගෙන් සම ආවරණය කරගන්නට උගත්තෝය. එතැන් පටන් සොබාදහම අධික සීතල වේශයෙන් හෝ අධික සූර්යතාපය වේශයෙන්, කෘමි සතුන් වේශයෙන් නිරුවත් සමට පහර දෙන විට ඔහුට පොරෝණයක් අවශ්‍ය විය. පසුව ඇඳුමක් බවට පත්වන්නේ එයයි. එනිසා මිනිසාට ඇඳුම් යනු පළමුව සැරසිල්ලකි; දෙවනුව ආරක්ෂක උපාංගයකි. දැන් මෙය පුරුද්දක්ව පවතින නමුත් විලාසිතා අර්ථයෙන් හා සමේ ආවරණයක් යන අර්ථයෙන් හැර මිනිසා සිරුර වසා සිටීමට රුචි නොවේ. යුරෝපීය මිනිසා හිරු කිරණ දුටු තැන නිරුවත් සිරුර ඉන් සනහා ගන්නට කැමතිය. එය sun bath නම් වේ. ඝර්ම කලාපයකදී මිනිසා අධික රස්නයට එරෙහිව උඩුකය නිරුවත්ව තබා ගැනීමට උත්සාහ ගනී. මේ ඔහු හිරු එළිය නෑමට නොවේ. ශරීර උෂ්ණත්වය පාලනය කර ගැනීමටය. මෙයින් අපට පැහැදිලි වන්නේ සංස්කෘතික විවිධත්වයට බලපාන ප්‍රධාන සාධකයන් දෙකක් පවතින බවය.

## සමාජ සංවර්ධනයේ (නිෂ්පාදන උපකරණයන්ගේ) මට්ටම

මුල්ම මිනිස්සු වන දියදහරක් අසබඩ දණ ගසා දියමත තොල් තබා පිපාසය සංසිඳුවා ගන්නට ඇත. එය සත්ව ස්වභාවයමය. ඉන්පසුව අත්දැකීම් වර්ධනය විසින් දිය පහරෙන් එන ජලය බොකුටු කළ අත්ල අල්ලා හෝ අත්ලට ගෙන බොන්නට ඇත. පසුව ස්වභාවික වියළි ඵලයන්ගේ ලෙලි, කටු භාවිතා කොට ජලය පානය කරන්නට ඇත. මැටි භාණ්ඩ නිමවා ඒවා පුළුස්සා ගන්නට ඉගෙනගත් පසු මැටි භාජනයෙන් ජලය පානය කරන්නට



ඇත. පසුව බෙලෙක් භාජන සෙරමික් භාජන ප්ලාස්ටික් බඳුන් භාවිතයට පැමිණියේය. දැන් එය බීම බෝතලය, බීම බටය දක්වා ඉදිරියට පැමිණ ඇත. දැන් මුහුදු හතු සීනි මිශ්‍රිත ආහාර දවටනයකට ජලය පුරවා පරිසර හිතකාමී ජල බඳුන් සකසා ඇත. මිනිසා බඳුන්වලින් ජලය බීමේ උත්සාහය විසින් තම තොල් පෙතිද ඉදිමුනු පලල් ඒවා බවට පත්කොටගෙන ඇත. තොල්වල විකරණය පසෙක තබා ජල බඳුනේ පරිණාමය සලකා බලන විට එය සමාජ සංවර්ධනයට අනුරූපීව වර්ධනයව ඇති බව දිස්වේ. එසේත් නැතිනම් ස්වභාවික ජල බඳුනේ සිට කෘත්‍රිම ජල බඳුන දක්වා කතන්දරයක් එහි ගැබ්ව ඇත. කෘෂිකර්මාන්තය අරමුණු කොට ආසියාතික සමාජයේ වාරි සංස්කෘතියක් බිහිවිය. පානීය ජලය වුව වගා ජලය වුව පිරිසිදු කිරීමට යොදා ගන්නා ජලය වුව සියල්ල වටා සංස්කෘතියක් බිහිවී වර්ධනය වේ. මෙම ජල සංස්කෘතියේ වර්ධනයන් සමාජ නිෂ්පාදන උපකරණවල දියුණුවේ මට්ටමට සාපේක්ෂය. එයින් කියවෙන්නේ ධනවාදය තුළ කිසිසේත්ම බොකුටු කළ අත්ලට වතුර ගෙන පානය කරන මිනිසෙකු කිසිදා දැකිය නොහැකි බව නොවේ. පංති සමාජයක් වන ආසියාතික නිෂ්පාදන රටාවේ කෙණ්ඩිය සහිත ජල කොතලය වංශවතුන්ටද අත්ලට වත්කොට ජලය පානය කුල හීනයන්ටද හිමි විය. පසුකරන ලද සමාජ ආර්ථික ක්‍රමයන්හි කැළැල් ඉදිරි සමාජයකද දැකිය හැකිය. එබැවින් ධනවාදී සමාජ සංස්කෘතිය තුළ පසුකළ සංස්කෘතික ලක්ෂණද නෂ්ටාවශේෂ වශයෙන් පැවැතිය හැකිය. නමුත් අතීත සමාජය ඉක්මවා පැමිණි නව සමාජයට අනන්‍ය නව ප්‍රධාන සංස්කෘතියක් වේ. ඒ සියල්ල සැකසෙන්නේ නිෂ්පාදන උපකරණවල මට්ටම අනුවය. ප්‍රාථමික සාමූහික සමාජයේද වහල්හිමි සමාජයේද වැඩවසම් සමාජයේද ආසියාතික සමාජයේද ධනවාදී සමාජයේද කොමියුනිස්ට් සමාජයේද එයට අනුරූපී ප්‍රධාන සංස්කෘතියක් පවතින අතර ඒවා එකක් පසුපස එකක් බැවින් වර්ධිත සංස්කෘතීන් බවට පත්වේ.

**භූගෝලීය සාධකයන්ගේ බලපෑම**

ඝර්ම කලාපීය මිනිසාට අතුපතර විහිදි විසල් ගසක් වුව සෙවණකි. ඔහු එම ගසයට තම වාසස්ථානය කරගැනීම ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්නයක් මිස අධික සීතල වැනි බාධක එහි නැත. එනිසා එවන් රටවල නිවාස වැඩි විවෘත බවකින් හා සාලය මැද ගිනි උඳුන් භාවිතයෙන් තොරය. එහෙත් අධික හිම පතනය සහිත ධ්‍රැවාසන්න මිනිසා ගෝලාකාර ආවරණික නිවසක් සාදා ගනී. එම නිවස තුළ ඇඳුම් හැඳ සිටිය නොහැකි තරම් උණුසුම්ය. යුරෝපා නිවාස එතරම් කුඩා නැත. ඒවා වාතාශ්‍රය සහිත පළල් සාලයන්ද සීතලට ආවරණය වූ කාමරද සහිත නිවාසයන්ය. නිවාස සංස්කෘතිය සැකසෙන්නේ භූගෝලීය සාධක අනුවය. අරාබි කාන්තාර පෙදෙස්වලට අධික සූර්යතාපයට ඔරොත්තු දෙන වැලි කුණාටුවලට ඔරොත්තු දෙන නිවාස අවශ්‍යය. චීන්නු උණ පතුරෙන්ද යුරෝපීන් ලෝහමය පතුරෙන්ද ආහාර ගන්නා සංස්කෘතිය නිර්ණය වන්නේ තමන්ට සුලබ ද්‍රව්‍ය ඇසුරෙන්ය. ලී පතුර සොයාගැනීමේ සිට එය සකස් කරගැනීම දක්වාද එය පරිහරණයේ හුරුබුහුටිකමද ආදී වශයෙන් විවිධ සංස්කෘතික පසුබිමක් මේ වටා නිර්මාණය වේ. ලෝහ භාවිතයෙන් හැන්ද ගෑරුප්පුව සාදාගැනීමේ සිට එය භාවිතයේ ආචාර ධර්ම දක්වා සංස්කෘතික පසුබිමක් නිර්මාණය වේ. එහෙත් මෙම සංස්කෘතික පසුබිමට මුල් වන ද්‍රව්‍යමය සාධකය සපයන්නේ භූගෝලීය පරිසරයයි.

*"මිනිසා ආහාරයට සුදුසු සෑම දෙයක්ම පරිභෝජනය කිරීම ඉගෙන ගත් පරිද්දිම, ඔහු ඕනෑම දේශගුණයක ජීවත් වීමටද ඉගෙන ගත්තේය. ලෝකයේ ජීවත් විය හැකි සෑම පරිසරයකම වාසය කිරීමට පටන් ගත් මිනිසා ස්වශක්තියෙන් එසේ කළ හැකි එකම සත්වයාද විය. සියලු දේශගුණයන් යටතේ ජීවත් වීමට පුරුදු වූ අනික් සත්තු හීලෑ සතුන් සහ පරපෝෂිතයින් පණුවන් ආදීන් - මිනිසා කැටුව යමින් එලෙස ජීවත් වූහ. මිනිසා තමාගේ මුල්ම ජන්ම භූමිය වන උණුසුම් දේශගුණයේ සිට වසරක් ගිම්හානය හා ශීත කාලය ලෙස බෙදුණු ශීත ප්‍රදේශවල වාසය කිරීමට පැමිණීමත් සමඟ අලුත් අවශ්‍යතාවයන් පැන නැගිණි. ශීත සහ තෙතමනයෙන් ආරක්ෂා වීම සඳහා නිවාස සහ ඇඳුම් අවශ්‍ය විය. එනිසා තවදුරටත් මිනිසා සතුන්ගෙන් වෙන් කරවන ක්‍රියාකාරීත්වයේ නව රූපාකාරයන්ද ශ්‍රම ක්ෂේත්‍රයන්ද ඇති විය."*

(පෙඩ්රික් එංගල්ස් - "වානරයාගේ සිට මිනිසා දක්වා පරිවර්තනය වීමේදී ශ්‍රමය ඉටු කළ කාර්ය කොටස")

**සංස්කෘතික පසුගාමිත්වය**

පසුගාමිත්වය යනු පැන නැගි නව සමාජ ආර්ථික ක්‍රමයෙහි සමාජ සම්බන්ධතා ක්‍රමය ඉක්මවා පසුකළ පැරැණි සමාජ ආර්ථික ක්‍රමයේ සම්බන්ධතාවන්ගේ ප්‍රකාශ වීම් ඉස්මතු වීමයි. එනම් අලුතෙන් බිහිවූ සමාජ ආර්ථික ක්‍රමයේ නව නිෂ්පාදන බලවේගයන්ට අනුරූපී නව නිෂ්පාදන සම්බන්ධතා පැවතියද සමාජ චින්තනය පූර්ව

සමාජයට අනුරූපව පවතී. එයට හේතුව වන්නේ පැරණි සමාජ ක්‍රමය තුළින් පැන නැඟි විප්ලවයක් මඟින් පැරණි අත්තිවාරම බිඳ හෙළනු වෙනුවට පැරණි සමාජ ආර්ථික දේහය මතට නව සමාජය කඩා වැටීමයි. එහිදී සිදුවන්නේ පැරණි සමාජයේ විප්ලවීය ලෙස ඉවත්විය යුතු යල්පැන ගිය අංග ඉවත්වනු වෙනුවට නව සමාජයේ අංග කිහිපයක් පමණක් පිහිටු වීමයි. එබැවින් නිෂ්පාදන බලවේගයන්ට අනුරූපී නිෂ්පාදන සම්බන්ධතාවයන් ගොඩනැගීම විකෘතිව ගොස් යල්පැන ගිය සම්බන්ධතා සහ චින්තනයන්ද බරක් වශයෙන් සමාජ දේහයේ එල්ලී පවතී.

උදාහරණයක් ලෙස ගන්නේ නම් ශ්‍රී ලංකාව මේ වන විට පවතින්නේ පසුගාමී ධනේශ්වර සමාජ ආර්ථිකයක් ලෙසය. පසුගාමීත්වය ධනේශ්වර සමාජ මට්ටමෙන් මෙහා පවතින්නකි. නූතන ධනවාදි ලාංකේය ජනතාව ප්‍රකෘතිය හා සමාජය පිළිබඳව දකින්නේ අතීත ශ්‍රී ලංකාවේ පැවැති ආසියාතික නිෂ්පාදන රටාවේ පැවැති චින්තනයේ පුරුද්ද මත පදනම්වය. ආසියාතික සමාජ ක්‍රමයේ මිනිසා පොළව කණින, අස්වනු නෙළන, දැව උපකරණ කිහිපයක් සහ නගුලට, පෝරුවට, චාලක බලය සපයන සහ ගොවි ශ්‍රමය ප්‍රතිනිෂ්පාදනයේදී පෝෂණ මූලාශ්‍රයක් වන ගවයා මූලික නිෂ්පාදන උපකරණය වශයෙන් පැවැති කෘෂිකාර්මික සමාජයක් මත පදනම්ව තම ලෝක දෘෂ්ටිය සකසා ගන්නා ලදී. භූමියේ පෞද්ගලික හිමිකමක් නොමැති තත්වයක් තුළ, පරම අධිපතියකු වන රජුගේ ඉඩම්, ශරීරයෙන් සහ අස්වැන්නෙන් ගෙවන බදු ක්‍රමයට වගා කළ ලාංකේය ආසියාතික මිනිසාට තම පංති ප්‍රතිවිරෝධය වන රජු පෘථිවියට ආලෝක වර්ෂ 4.2ක් දුරින් පිහිටි අල්ෆා සෙන්චරි තාරකාව සේ දුරස්ථය. සමාජ සංවර්ධනයට අනුව සමාජ විප්ලවය අනිවාර්ය නමුත් ඉහත දැක්වූ විෂය මූල තත්වය (සමාජ භූමිකාව) හේතුවෙන් එය එක තැන පල්වෙන සමාජයක් බවට පත්ව තිබිණ. ගවයා ප්‍රධාන නිෂ්පාදන උපකරණය වන සමාජයක අවිහිංසාවාදය මුල් කොටගත් ආගමික දර්ශනයක් තහවුරු වීම ඉතා ස්වභාවිකය. ඉතා අඩු දියුණු උපකරණ මගින් ස්වභාවික බලවේගයන් හා ගැටෙන සමාජයක ස්වභාවික බලවේගයන්ට දේවත්වය ආරූඪ කිරීම පුදුමයක් නොවේ. දෙවියන් යැයි හඳුන්වන රජකු නොමැතිව පාලනය විය නොහැකි යැයි සිතන සමාජයක රජු දේවයන් වහන්සේය; පොදු ජනයා බලුගැත්තන්ය. මෙවන් චින්තන පුරුද්දක් සහිත නමුත් ධනවාදී උපකරණ පරිහරණය කරන වත්මන් පුද්ගලයකු අති නවීන මෝටර් රථයක් භාවිත කළද ඔහුට එහි ආරක්ෂාව සඳහා දෙහි ගෙඩිය හා මිරිස් කරල අත්‍යවශ්‍ය මානසික රක්ෂණාවරණයකි. ඔහු තවමත් සොබාදහමට යටත් වයි කෝටි අඳින අසරණ මානවයෙකි. දැන් ලාංකේය ධනවාදය යුරෝපයේ මට්ටමට වර්ධනය වන්නේ නැත. ඒ වෙනුවට සිදුවූයේ 1815 පැවැති සමාජ චින්තනය මතට ධනවාදී වෙළඳ භාණ්ඩ විසිරවීමයි. එබැවින් ලාංකේය ජන සමාජයේ සංස්කෘතික පසුගාමීත්වයක්ද පවතී.

**මානව සංස්කෘතික කළුකුහර**

නිරපේක්ෂ වශයෙන් සංස්කෘතියෙහි ලක්ෂණය වන්නේ ඉදිරියට වර්ධනය වීමයි. න්‍යායික සත්‍යය එය වුවද ප්‍රායෝගිකව ගත් කළ සාපේක්ෂ වශයෙන් සංස්කෘතික කඩා වැටීම් සිදුවේ. එහිදී සිදුවන්නේ නිශ්චිත නිෂ්පාදන මාදිලියක අදාළ සමාජ සංස්කෘතික ලක්ෂණ පරයමින් එයට වඩා පහත් මට්ටමේ සංස්කෘතික ලක්ෂණ මතු වීමයි. උදාහරණ වශයෙන් වසවිෂ යෙදූ ආහාර පානයන්, සැලසුම් සහගත මනුෂ්‍ය ඝාතනයන්, සැලසුම් සහගත ස්ත්‍රී දූෂණයන් ආදී තවත් බොහෝ ඒවා ගත හැකිය. මෙවැනි සංස්කෘතික අගාධයන් තමන් වෙතට සංස්කෘතික හරයන් සියල්ල ඇද ගනී. එවන් සංස්කෘතික කළු කුහරයන් සමාජය තුළ හමුවේ. එය පරාජය කළ හැක්කේද සංස්කෘතික වර්ධනයන් තුළින්මය. එවන් සංස්කෘතික ගොඩනැංවීමක් විසින් සංස්කෘතික පරිහානිය පරාජය කළ හැකිය.

මානව පවුලේ විකාශනය අනුව එය ඒකභාර්යා වෘතය (එක් බිරිඳක තබාගැනීම) දක්වා වර්ධනය වී තිබේ. එය ධනවාදි සමාජයේද කොමියුනිස්ට්වාදී සමාජයේද දැකිය හැකි විවාහයේ රූපකයකි. නමුත් මෙම සමාජක්‍රම දෙක තුළම ඒක භාර්යා වෘතය පවතින්නේ සමාන ගුණයෙන් නොවේ. ධනවාදය එක බිරිඳක් තබාගන්නේ පුරුෂයාගේ දේපළ දරුවන්ට හිමිවීමේ උරුම පෙළපත සැකසෙන්නේ එම ක්‍රමයට නිසාය. කොමියුනිස්ට් සමාජය ඒක භාර්යා වෘතයට යන්නේ පොදු දේපළ ක්‍රමයක් තුළ දේපළ බැඳීමෙන් තොර අධ්‍යාත්මික විවාහයක අරුතින්ය. ධනවාදී ගැහැනිය පිරිමියාගේ පරපුර රකින ගර්භාෂයයි. අමතරව පිරිමියාගේ ලිංගික තෘප්තිය සනහන සජීවී උපකරණයයි. විවාහයකට මෙය අනිවාර්ය කොන්දේසියක් නොවේ. මන්ද පිරිමියෙකුට තම බිරිඳගෙන් තොරවද ලිංගික තෘප්තිය වෙනත් ගැහැනියක තුළින් ලද හැකිවීමයි.

කොමියුනිස්ට් සමාජයේ ගැහැනිය පිරිමියාගේ පරපුර රකින ගර්භාෂය නොවේ. ඇය ඔහුගේ අධ්‍යාත්මික බැඳීමයි. ජීවිතයේ ලෞකික හා අධ්‍යාත්මික සතුටයි. එම පරම සතුට ලැබිය හැක්කේ ඔවුන් දෙදෙනාටම පමණි. මේ සම්බන්ධය බිඳෙන්නේ බැඳීම් වෙනස් වන විටය. මෙම විවාහ ක්‍රම දෙක වටා ගොඩනැගෙන සංස්කෘතික පසුබිම එකිනෙකට වෙනස්ය. කොමියුනිස්ට් සමාජය තුළ විවාහය ධනවාදී පවුල දක්වා කඩා වැටෙන්නේ නම් එය පිරිහීමකි. එහෙත් එය එසේ වන්නේ නැත. එබැවින් සංස්කෘතිය යනු සමාජ සංවර්ධනයට අනුරූපව වර්ධනය වන්නකි. ඉදිරිගාමී සංස්කෘතීන් තුළ පසුගාමී අම්බලම් හමුවිය හැකිය. එහෙත් සංස්කෘතියේ පොදු ඉරණම එහි අඛණ්ඩ වර්ධනයයි.

අවසාන වශයෙන් සංස්කෘතිය යනු මානව වංශ කතාවයි. මිනිසා සත්ව ලෝකයෙන් වෙන්වූ කතාවයි. මිනිසා සොබාදහමට එරෙහිව දිනාගත් සියල්ලෙහි එකතුවයි. එය මිනිසාගේ පැවැත්මේ ලෞකික හා අධ්‍යාත්මික පාර්ශ්වයන් දෙකයි. නිෂ්පාදන උපකරණයන්ගේ වර්ධනයේ මට්ටමෙහි ප්‍රකාශනයයි. ඔහු භූගෝලීය පරිසරයට හැඩගැසීමේ ප්‍රවණතාවයන්ගේ ප්‍රකාශනයයි. සංස්කෘතිය යනු ස්ථිතික පාෂාණයක් නොවේ; එය ගතික ප්‍රවාහයකි. සමාජ සංවර්ධනයේ අර්බුදයන් විසින් සංස්කෘතික පසුගාමිත්වයන් සකසයි. එහෙත් සංස්කෘතියේ ඒකායන ඉරණම වර්ධනයයි. මානව පැවැත්ම හා අවිච්ඡේදනීය බැඳීමක් පවතින සංස්කෘතිය අන් කවරක්වත් නොව මනුෂ්‍ය හරයෙන් යුත් සංස්කෘතික මිනිසුන්ගෙන් සැදි සාමූහිකත්වයයි. මානව වංශයේ උසස් නිදහස් ජීවිතයයි. සැබැවින්ම සියලු සංස්කෘතික ප්‍රාදේශීයකරණයන් හා විවිධ සංස්කෘතික ප්‍රභේදනයන් මිශ්‍රවීමෙන් ශුද්ධ දුබල සංස්කෘතීන් වෙනුවට පුළුල් සවිමත් මානව සංස්කෘතියක් බිහිවේ.

*"මුලදී මිනිස් වර්ගවල සංවර්ධනයට අලුත් පෙදෙස්වල පදිංචිවීම බොහෝ වැදගත්කමක් ගෙන දුන්නේය. මේ පෙදෙස්වල ජීවත්වීමට හැඩගැසුණු මිනිස්සු විවිධ ස්වභාවික තත්වයන්ට මුහුණ පාමින් එක් එක් වර්ගයකින් වෙන්වී දීර්ඝ කාලයක් ජීවත් වූහ. ආහාරය සහ පෝෂණය අනුව ඔවුන් අතර ප්‍රභේදනයක් ඇති විය. එහෙත් කල් යත් යත්ම, ජනගහනය සංඛ්‍යාවෙන් වැඩිවූයෙන්, විවිධ වර්ග අතර සම්බන්ධකම් ඇති විය. මේ නිසා ඔවුන් අතර මිශ්‍රවීමක් ඇතිවීමේ ක්‍රියාදාමයකට මඟපෑදිණ."*

**("මිනිසාගේ සම්භවය" එම් නේස්තුර්හ් - පිටුව 341)**





# සංස්කෘතික පිරිහීම

## ගෝලීයකරණ යථාර්ථයෙන් ඔබ්බට...

**මංජුල පද්මකුමාර**

වසර දෙදහස් පන්සීයකට අධික කාලයක් පුරා මේ රටේ ජනතාව ගොඩනැගූ අභිමානය වර්තමාන තරුණ පරපුර විසින් බිමට සමතලා කරමින් තිබේ. අතීතයේ සිටි පාලකයන් මේ රටේ ආර්ථිකය ගොඩනැගීමට සාපේක්ෂව සංස්කෘතිය සාරධර්ම හා සමාජ තත්වයන් ඇති කිරීමටද බොහෝ වෙහෙස මහන්සි වී කටයුතු කළ අතර මේ නිසාම ශ්‍රී ලංකා නාමය ලෝකයේ ඉහළින්ම වැජඹුණු නාමයක් විය. එහෙත් අද වන විට මෙරට සමාජයේ ඉහළ සිට පහළටම ගුණ දහම්, සාරධර්ම, සමාජ යුතුකම්, එකිනෙකාට ගරු කිරීම්, අන් මතවලට ගරුකිරීම්, එකිනෙකාට උදව් පදව් කර ගැනීම යන සියල්ලම පිරිහෙමින් ඇත.”

ඉහතින් දැක්වූයේ එක්තරා ජාතික පුවත්පතක 2023 වර්ෂයේ මැද පළවූ ලිපියකින් උපුටා ගත් කොටසකි. මෙහි සඳහන් අදහස මේ වචනවලින්ම නැතත් වෙනත් වචනවලින් හෝ නොඇසූ කෙනෙක් සිටීමට නොහැකි තරම්ය. එතරම්ම මෙය ලාංකේය සමාජයේ වැඩිහිටියන්ට පොදු අදහසකි. මෙහිදී වැඩිදෙනාගේ අදහස වන්නේ අතීතයේ පැවති දේවල් අතහැර දැමීම සංස්කෘතික පිරිහීමක් ලෙසය. නමුත් සමාජයක ඉදිරි ගමන සිදුවන්නේ පැරණි දේ අභාවයට යවමින් නව දේ පැවැත්මට ඒම තුළය. එහෙත් එය සිදුවිය යුත්තේ පැරණි දේ තුළ පවතින වඩා යහපත් දේ රැක ගනිමින් සහ අයහපත් දේ බැහැර කරමින්ය. එසේ ඇතිවන මානව සමාජ සම්බන්ධතා සමාජයේ පොදු පැවැත්මට බාධාකරන්නේ නම් එය සංස්කෘතික පිරිහීමක් ලෙස දැකිය හැකිය. ඒ නිසා සැබැවින්ම මේ කියන සංස්කෘතික

පිරිහීම යනු කුමක්දැයි වඩාත් විශ්ලේෂණාත්මකව විමසා බැලීම වැදගත්ය.

එබැවින් සංස්කෘතික පිරිහීමක් යනු අතීතයේ පැවති සියලුම දේ වර්තමානයේ නොපැවතීම නොවේ. සංස්කෘතික පරිහානියක මූලය වන්නේ සමාජ සංවර්ධනය තුළ මිනිසා විසින් නිර්මාණය කරන ලද දැනුම, තාක්ෂණය, විද්‍යාව, කලාව ආදී සියල්ල මානව වර්ගයාගේ පොදු පැවැත්මට, මානව වර්ගයාගේ ජීවිත ඉහළ නැංවීමට යොදා නොගෙන ඒවා මානව සමාජයේ අයහපතට, මානව වර්ගයාගේ පැවැත්මට හා එහි සාමූහිකත්වයට හානිකර ලෙස යොදා ගැනීමය. එය කිසියම් රටක පවතින සමාජ ආර්ථික නිෂ්පාදන රටාව සමග සම්බන්ධව පවතින බවද ඉතා පැහැදිලිය.

## ක්‍රමය තුළ අනිවාර්යයක් බව

අප ජීවත් වන්නේ ධනවාදී සමාජ ක්‍රමයක් තුළය. ධනවාදයේ මූලිකම ලක්ෂණය වන්නේ ධන හිමියන් විසින් සිය ලාභය උපරිම කර ගැනීමට කටයුතු කිරීමයි. ඒ නිසා නිෂ්පාදනය කරන භාණ්ඩයේ ගුණාත්මකභාවයට වඩා වෙනත් සාධක කෙරෙහි නිෂ්පාදකයා අවධානය යොමු කරයි. එනම් අඩු වියදමකින් නිෂ්පාදනය කර ගැනීම සහ එය අලෙවි කර ගැනීමේ හැකියාව වැඩිකර ගැනීමයි. අඩු වියදම් නිෂ්පාදනය යනු පැහැදිලිවම භාණ්ඩයේ අදාළ ගුණාත්මකභාවය නොසලකා හැරීමයි. අලෙවි හැකියාව වැඩිකරගැනීම යනු හැකිතාක් වෙළඳ ප්‍රචාරණයන්ට වැඩි බර තැබීමයි. ඒ සඳහා පාරිභෝගිකයන් පෙලඹවීම මෙන්ම රැවටීමද සිදුකරන අතර මේවා සිදුවන්නේ දැවැන්ත වෙළඳ ප්‍රචාරක ආයතන හරහාය. ඒ නිසා පවතින ලාභය උපරිම කර ගැනීම ප්‍රමුඛ අරමුණ කරගත් සමාජයක් තුළ මානව සමාජයේ යහපැවැත්ම පිරිහීමට ලක්වීම බලාපොරොත්තු විය යුත්තකි.

**එබැවින් සංස්කෘතික පිරිහීමක් යනු අතීතයේ පැවති සියලුම දේ වර්තමානයේ නොපැවතීම නොවේ. සංස්කෘතික පරිහානියක මූලය වන්නේ සමාජ සංවර්ධනය තුළ මිනිසා විසින් නිර්මාණය කරන ලද දැනුම, තාක්ෂණය, විද්‍යාව, කලාව ආදී සියල්ල මානව වර්ගයාගේ පොදු පැවැත්මට, මානව වර්ගයාගේ ජීවිත ඉහළ නැංවීමට යොදා නොගෙන ඒවා මානව සමාජයේ අයහපතට, මානව වර්ගයාගේ පැවැත්මට හා එහි සාමූහිකත්වයට හානිකර ලෙස යොදා ගැනීමය.**

නියාමනය අත්හරින ප්‍රමාණයට පිරිහීම ඉහළ යයි

ධනවාදය තුළත් නව ලිබරල්වාදී ආර්ථික මොඩලය යනු මෙකී පිරිහීම තවත් උත්සන්න කරන ක්‍රමයකි. මන්දයත් නව ලිබරල් උපායමාර්ගයේ දී පරිධියේ රටවල රාජ්‍ය නියාමනය හැකිතාක් ලිහිල් කරමින් බහු ජාතික සමාගම්වල කොල්ලකාරී ක්‍රියාවලියට එම රටවල් වඩ වඩාත් විවෘත කරන නිසාය. ඒ තුළ අනිවාර්යයෙන්ම පාරිභෝගික අයිතිවාසිකම් බරපතළ ලෙස කප්පාදුවීම නොවැළැක්විය හැක්කකි. එසේම වැඩකරන ජනතාවගේ පවතින වෘත්තීය අයිතිවාසිකම් කප්පාදුවට ලක්කිරීමත්, වැටුප් වැඩිකිරීම් ලබා නොදීම හෝ වැටුප් කප්පාදු කිරීමත් සිදුවීමද අනිවාර්යය වේ.

තමන්ගේ පරිභෝජනය සඳහා ආහාරයක් සකස්කරගන්නා විට ගුණාත්මකබව සුරකිමින්ද, නාස්තිය වලකා අරපිරිමැස්මෙන්ද සිදුකරන බව අත්දැකීමෙන් බොහෝ දෙනා දනිති. වෙළඳාම මූලික වී හුවමාරුව සඳහාම භාණ්ඩ නිපදවීම සිදුවන්නේ ධනවාදයේදීය. ඊට පෙර පැවති ආදි කාලීන සමාජයේ තම පරිභෝජනය සඳහා නිපදවා ගනිද්දී එහි වඩාත් සදාචාරසම්පන්න බවක් පැවතුණි. දඩයක්කරුවකු සතුන් දඩයම් කරද්දී පැටවුන් සහ දෙනුන්ව නොමරා තම දඩයම තෝරා බේරාගෙන සිදුකරයි. තම වාසභවන තනාගැනීමට කැලේ ගසක් කපා ගනිද්දී ඒ සඳහා අවශ්‍ය ගස හෝ අත්ත පමණක් කපා ගනී. එහෙත් අලෙවිය සඳහා දඩයම් කරද්දී සියලු සදාචාරයන් පසෙක දමා දඩයම් සිදුකරන ආකාරය නිතර වාර්තා වේ. වස වර්ග යොදා සතුන් මරා දැමීම එවැනි එකකි. මාළු ඇල්ලීමේදීද ඩයිනමයිට් භාවිතා කිරීමද මෙවැන්නකි. දැව ව්‍යාපාර සඳහා කැලෑ කපන විට කිසිදු ඉවක් බවකින් තොරව වනාන්තර විනාශ කිරීම අද විශාල ගැටලුවකි. අපේ රටේ පමණක් නොව ලොව පුරාමත් මෙම ප්‍රශ්නය

උත්සන්න වී ඇත.

ඒ නිසා ගැටලුව මතුවන්නේ වෙළඳ භාණ්ඩය පැමිණීමෙන් බවත්, එහිදී ලාභ උපරිම කරගැනීමට දරන ප්‍රයත්නය නිසා බවත් තේරුම් ගැනීම අපහසු නැත.

## ප්‍රමිතියෙන් තොර ආහාර

අද අපට වෙළඳපොළේ හමුවන ආහාරපානවලින් වැඩි ප්‍රමාණයක ශරීරයට අහිතකර දෑ අඩංගු බව හෙළිවී තිබෙන කරුණකි. කෘෂිකාර්මික කටයුතුවලදී අධිකව කෘමිනාශක, වල් නාශක සහදිලීර නාශක ලෙස කෘෂි රසායනික යෙදවුම් භාවිතා වේ. මහා පරිමාණ වගාවේදී මෙම යෙදවුම් නොමැතිව ව්‍යාපාර පවත්වා ගත නොහැකිය. එහෙත් ඒ සඳහා නිර්දේශිත කාල සීමාවන් පවතින අතර එසේ අදාළ ප්‍රමිතියෙන් පලිබෝධනාශක භාවිතා කරන්නේ නම් පාරිභෝගිකයන්ට ඇතිවන අහිතකර බලපෑම් අවම කරගත හැකිය. විශේෂයෙන් දින කිහිපයකට වරක් අස්වැන්න නෙළන බෝංචි, මෑ, වම්බටු, බණ්ඩක්කා, වැටකොළු, කරවිල වැනි භෝග වර්ගද පලා වර්ගද සඳහාද ප්‍රමිතිය නොසලකා දිලීර නාශක යෙදීමට ගොවීන් පුරුදුවී සිටිති. ලීක්ස් සහ ගෝවා වගාවටද පලිබෝධනාශක යෙදවෙන අතර වෙළඳපොළට පැමිණෙද්දී මෙම රසායනිකයන් කිසියම් ප්‍රමාණවලින් අඩංගුවීම වැලැක්විය නොහැකිය. ප්‍රශ්නය වන්නේ ඒවා පරීක්ෂා කිරීමට නිසි ක්‍රමවේදයක් අප රට තුළ ක්‍රියාත්මක නොවීමයි. එසේම වී වගාවද ඇතුලු බොහෝ වගාවන්ට යෙදවෙන කෘෂි රසායනිකයන් ජලයට මුසුවීම නිසා සිදුවන පාරිසරික බලපෑමද සුළුපටු නොවේ. මේවා ගැන අවබෝධයක් ගොවීන්ට ලබාදීමෙන් සහ නිසි නියාමනයන් පවත්වාගැනීමෙන් මේවායේ හානිකර බව අවම කරගත හැකි නමුත් එවැනි ක්‍රියාවලියක් නොමැති තරම්ය. මෙහි තවත් පාර්ශ්වයක් වන්නේ විවිධ නම්වලින් ව්‍යාජ පලිබෝධනාශක වෙළඳපොළේ පැවතීමයි. ඒවා පරීක්ෂාකරන ක්‍රමවේදයක් හෝ නීතිය ක්‍රියාත්මකවීමක් සිදුනොවන නිසා මෙකී ජාවාරම් බහුල වී ඇත.

නිසි ගබඩා පහසුකම් නොමැතිවීමත් ප්‍රවාහන ක්‍රමවේදයේ පවතින ගැටලු නිසාත් ඇපලටොක්සීන් වැනි පිළිකාකාරක දිලීර කෘෂි භෝග සමග වර්ධනය වන අතර මේවා පරීක්ෂාවට ලක්වන යාන්ත්‍රණයක් නොමැත.

පලතුරු සම්බන්ධව වැඩිපුර දක්නට ලැබෙන ගැටලුව වන්නේ පවතින වෙළඳපොළ ක්‍රමවේදය සහ තරගය නිසා පලතුරු අස්වැන්න නෙලීමේදී අදාළ ප්‍රමිතියට පැසුණු පලතුරු නෙළීම වෙනුවට වගවිභාගයකින් තොරව පලතුරු වෙළඳ පොළට සැපයීමයි. මේ නිසා මෙම පලතුරු ඉදවීමට කෘතිමව එන්සයිම ලබාදීමට සිදුවන අතර එය පලතුරුවල රස සහ ගුණයටද අහිතකර ලෙස බලපායි.

ජල දූෂණය, මත්ස්‍ය කර්මාන්තයට අයහපත් ලෙස



බලපා තිබේ. ජලයට මුසුවන ක්ෂුද්‍ර ප්ලාස්ටික් (micro plastic)සහ අපද්‍රව්‍ය සමග ඇති රසදිය ඇල්ගීවලට මුසුවීමත්, ඒවා මත්ස්‍ය ආහාර බවට පත්වීමත්ය. මෙවැනි දේ අඩංගු මාළු ආහාරයට ගැනීමෙන් මධ්‍ය ස්නායු පද්ධතියේ ආබාධ ඇතිවීමත් ගැබිනි මවුවරුන්ට ඔටිසම් ආබාධය සහිත දරුවන් බිහිවීමත් ආදී තත්වයන් ඇතිකරන බව තහවුරු වී ඇත. මේ නිසා විශේෂයෙන් යුරෝපා රටවලට මාළු අපනයනය කිරීමේදී මේවා දැඩි ලෙස පරීක්ෂාවට ලක්කරයි. එහෙත් දේශීය වෙළඳපොළට සැපයෙන මාළු මේ කිසිදු පරීක්ෂාවකට ලක්වන්නේ නැත.

ආහාර සඳහා යොදා ගැනෙන පොල් තෙල් කර්මාන්තය තුළද ඇත්තේ මෙවැනිම ගැටලුවකි. පිරිසිදු පොල්තෙල් වෙනුවට වෙළඳ පොළේ වැඩිපුර භාවිතා වන්නේ විවිධ වෙනත් තෙල් වර්ග මුසුකරන ලද පොල්තෙල්ය. ලංකාවේ වාර්ෂික පොල්තෙල් පරිභෝජනය සැලකූවිට පිරිසිදු පොල්තෙල් භාවිතාවන්නේ 20% පමණ බවත් එය ටොන් 20,000ක් පමණ බවත් පොල්තෙල් කර්මාන්ත ආරංචි මාර්ග ප්‍රකාශ කරයි. ඉතිරි 80%ම පාම් ඔයිල් ඇතුලු වෙනත් තෙල් වර්ග කවලම් කරන ලද පොල් තෙල්ය. මෙහි ඇති වැදගත්ම කරුණ වන්නේ මේ හරහා විශාල ජාවාරමක් සිදුවීමයි. එනම් කවලම් කිරීමට යොදා ගන්නා තෙල් වර්ග ආනයන වියදම බෝතලයක් සඳහා රු. 200/=ක පමණ මුදලකි. එහෙත් පොල්තෙල් බෝතලයක් වෙළඳ පොළේ අලෙවි වන්නේ රු 450/=ත් 800/=ත් අතර මිලකටය. ඒ නිසා කවලම් කිරීමෙන් විශාල ලාභයක් නිෂ්පාදකයාට හිමිවෙයි.

## බාල ඖෂධ ගෙන්වීම

ඇතැම් ඖෂධ භාවිතයෙන් පසු විවිධ සංකූලතා ඇති වීම් සහ පුද්ගලයන් මිය යෑමේ සිදුවීම් වාර්තා වීම මෑත කාලීනව ඉහළ යන්නට විය. 2023 වසරේ මුල් මාස 7 තුළ ප්‍රමිතිය සම්බන්ධ ගැටලු හේතුවෙන් ඖෂධ 65 ක් භාවිතයෙන් ඉවත්කර ඇතැයි සෞඛ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයාම ප්‍රකාශ කළේය.

ඉන්දියාවෙන් ගෙන්වූ හදිසි හෘදයාබාධ හඳුනා ගැනීමේ කටයුතු සඳහා භාවිත කෙරෙන ට්‍රොපනින් (Tropanin 1) පරීක්ෂණ කට්ටල ද තත්වයෙන් බාල බව තහවුරු වීම නිසා වහාම රෝහල්වලින් ඉවත්කර පරීක්ෂණාගාර සැපයුම් ඒකකය වෙත යැවීමට පියවර ගෙන තිබුණි.

පසුගිය ඔක්තෝබර් 03දා ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් නිවේදනයක් නිකුත් කරමින් කියා සිටියේ එක්තරා ආයතනයක් විසින් ගෙන්වා බෙදාහැර ඇති Human immunoglobulin IV 5g vial නම් ඖෂධය තත්වයෙන් අසමත් බවත්, එය ගෙන්වීමේදී රේගු නිෂ්කාශන සඳහා ව්‍යාජ ලේඛන සකසා ඉදිරිපත් කර ඇති බවත්ය. මෙම ඖෂධයට ජාතික ඖෂධ නියාමන අධිකාරියේ කිසිදු අවසරයක් ලබාදී නැත. එහෙත් එසේ අවසර දුන් බවට ව්‍යාජ ලේඛන සකස් කර ඇත.

තමන්ගේ ලාභ රේට්ටුව ඉහළ දමා ගැනීම සඳහා රෝගීන්ගේ ජීවිත තුට්ටුවකටවත් මායිම් නොකර මෙසේ හැසිරීම කවර නම් මිනිස්කමක්දැයි සිතා බැලිය යුතුය.

## ආයුධ නිෂ්පාදනය සහ යුද්ධ නිෂ්පාදනය

අද වන විට ලෝකයේ අංක එකේ ව්‍යාපාරය බවට පත්ව ඇත්තේ යුද අවි ජාවාරමයි. අවි ගැටුම් නිසා දිනකට ලෝකයේ මියයන මිනිසුන් සංඛ්‍යාවේ සාමාන්‍යය 1500 කි. යුද්ධ, සන්නද්ධ මිනීමැරුම්, නීත්‍යානුකූල නොවන මරණ දඬුවම් පැමිණවීම්, රාජ්‍ය ආරක්ෂක අංශ මගින් කෙරෙන, නීතියට පටහැනි අවි බලය යෙදවීම් හේතුවෙන්, වසරකට ලොව පුරා මිනිසුන් පන්ලක්ෂයක් පමණ මරණයට පත්වේ. ලොව පුරා සිදුවන සන්නද්ධ ගැටුම් හේතුවෙන් වසරකට ලොව පුරා සාමාන්‍ය මහජනතාව මිලියන 26ක් පමණ අවතැන් වෙයි. ගුවනින් හෙළන මහා පරිමාණ බෝම්බ, මිසයිල, කාලතුවක්කු, රොකට් වෙඩි, යුද ටැංකි නිසා භූමියේ ඇති යටිතල පහසුකම්වලට බරපතල හානි සිදුවන අතර මහජනතාවට සෙත සැලසීමට ඇති අවස්ථා අහිමිවීමෙන්, දුප්පත්කම වර්ධනය වෙයි.

ලොව පුරා වසරකට පතරොම් බිලියන අටත් දොළහත් අතර ප්‍රමාණයක් නිපදවනු ලැබේ. මෙම පතරොම් ප්‍රමාණය, ආසන්න වශයෙන්, ලෝකයේ සිටින සෑම පුද්ගලයකුම, දෙවරක් ඝාතනය කිරීමට ප්‍රමාණවත්වේ. මේ වනවිට ලෝකය පුරා සාමාන්‍ය තුවක්කු මිලියන 875 ක් පමණ තිබන අතර, විවිධ වර්ගයේ සහ ප්‍රමාණයේ මැෂින් තුවක්කු මිලියන 8ක් වසරකට අලුතෙන් නිපදවන බව අනාවරණය වේ.

එසේම වර්තමානයේදී සන්නද්ධ ගැටුම් වලට මැදිව සිටින සමහර රටවල රජයේ අනුග්‍රහය ඇතිව කිසිදු නීතියක් ගැන නොසලකා වගකීම් විරහිතව බාල වයස්කාර ළමයි සන්නද්ධ සෙබළුන් ලෙස සටනට යොදවා තිබේ. එමෙන්ම සමහර ත්‍රස්තවාදී සංවිධාන සහ සන්නද්ධ කල්ලි ඒ ආකාරයටම ක්‍රියාකරයි. එයින්

ළමා අයිතිවාසිකම් අමු අමුවේ උල්ලංඝනය වෙයි.

මුළු ලෝකයටම අවි ආයුධ, පතරොම්, බෝම්බ, යුද ගුවන් යානා, යුද ටැංකි, ආදිය නිපදවා සපයන්නේ ප්‍රධාන වශයෙන් රටවල් හයක් විසින්. ලෝකයේ මුළු ආයුධ නිෂ්පාදනයෙන් ඉදිරියෙන්ම ඉන්නේ එක්සත් ජනපදයයි. ඒ ප්‍රමාණය 34.84%කි. රුසියාව 14.86% කි. ජර්මනිය 7.43%කි. එක්සත් රාජධානිය 6.57% කි. චීනය 6.29% කි. ප්‍රංශය 4% කි.

මෙහි අනෙක් පැත්ත නම් මෙසේ නිපදවන අවි අත්හදා බැලීමටත් අලෙවි කිරීමටත් යුද්ධ අවශ්‍ය වන අතර ඒවාද අධිරාජ්‍යවාදී රටවල් විසින්ම සැලසුම් කිරීමයි. වර්තමාන යුක්රේන - රුසියා යුද්ධයත්, පලස්තීන ජනතාව සහ ඊශ්‍රායලය අතර යුද්ධයත් මෙයට කදිම උදාහරණ වේ.

## මත්ද්‍රව්‍ය ජාවාරම

අවි ජාවාරම හැරුණු විට ලොව එයට පමණක් දෙවනි වන ජාවාරම වන්නේ මත්ද්‍රව්‍ය ජාවාරමයි. විවිධ සමීක්ෂණ වාර්තාවලට අනුව දකුණු ආසියාව මත්ද්‍රව්‍ය ප්‍රවාහනය කරන කේන්ද්‍රයකි. බංගලිදේශය, ඇෆ්ගනිස්ථානය, ඉන්දියාව, ශ්‍රී ලංකාව නේපාලය හා පාකිස්ථානය අතර ඉතා ශක්තිමත් ජාලයක් පවතින බව හෙළිදරව් වී තිබේ.

මෙක්සිකෝව යනු තහනම් මත්ද්‍රව්‍ය ලෝකයට බෙදාහරින බල කේන්ද්‍රය ලෙස හැඳින්විය හැකිය. මෙම ජාවාරම්කරුවන්ගේ සංවිධාන කෙතරම් දුරට බලවත් ද යත්, ඔවුන්ට බාධා කරන්නන් මිලදී ගැනීම හෝ ඝාතනය කිරීම ඔවුන්ගේ ක්‍රමයයි. එසේම ලෝකයේ සියලුම කලාපවලට මත්ද්‍රව්‍ය ප්‍රවාහනය කරයි. ප්‍රවාහනයේදී මුහුදින් වේවා, ගොඩබිමින් වේවා, ගුවනින් හෝ අනෙකුත් ඕනෑම මාර්ගයක් ඔස්සේ ප්‍රවාහනය කිරීමට තරම් සූක්ෂම සහ සංවිධානාත්මක ජාලයක් මෙම සංවිධාන සතුය. මෙක්සිකෝව මත්ද්‍රව්‍ය බහුලව භාවිත කරන රට වුව ද ලෝකයේ මත්ද්‍රව්‍ය අගනුවර ලෙස සඳහන් වන්නේ ඇෆ්ගනිස්ථානයයි. එසේම මත්ද්‍රව්‍ය යනු ලෝකයේ කළු සල්ලි සුදු කරන අංක එකේ ව්‍යාපාරය බවට අද පත්ව තිබේ.

ඕනෑම වූ මත්ද්‍රව්‍යයක් භාවිතය නිසා ලෝකයේ ජනතාව අතරින් සෑම තත්පර දහයකට වරක් මරණයක් සිදුවන බව වාර්තාවල සඳහන් වේ. ස්නායුගත රෝග, ඒඩ්ස් සහ සමාජ රෝගවලින් විඳවන පිරිස ද බොහෝය. ඒ, වෙන කිසිවක් නිසා නොව මත්ද්‍රව්‍ය භාවිතය නිසාය.

අප රට තුළද තරුණ පරපුර අතර විශේෂයෙන් පාසල් දරුවන් අතරද විෂ මත්ද්‍රව්‍ය ව්‍යාප්තිය බරපතළ ගැටලුවක් බවට පත්ව තිබේ. මත්ද්‍රව්‍ය භාවිතය අතුරු ප්‍රශ්න ගණනාවක් ඇති කරනු ලබයි. ශාරීරිකව බරපතළ ආබාධ ඇතිවීම, මත්ද්‍රව්‍ය සඳහා විශාල ලෙස මුදල් වැයවීම සහ මුදල් සෙවීමට සොරකම්වලට යොමුවීම, පවුල තුළ/ආයතන තුළ මානව සබඳතා බිඳවැටීම, අත්අඩංගුවට පත්වීම නිසා ඇතිවන බලපෑම් ආදී අර්බුද රැසකට මුහුණපෑමට සිදුවෙයි. මේ හරහා සදාචාරාත්මක වශයෙන් බරපතළ සමාජ පිරිහීමක්



ඇතිවීම අනිවාර්ය තත්වයකි.

### වෙළඳ දැන්වීම්

කොකා කෝලා ඇතුලු පැණි බීම වර්ග, කිරිපිටි වර්ග, ආදී බොහෝ වෙළඳ දැන්වීම් හරහා පාරිභෝගික මනස පොළඹවා වස විස අඩංගු අහිතකර ආහාර වර්ග අලෙවිය සිදුකර ගනී. ධනවාදයේ අර්බුදයේ ප්‍රතිඵලයක් වන සමාජ අනාරක්ෂිතභාවය යන්නම යොදාගෙන ජීවිත රක්ෂණ ඇතුලු අනෙකුත් රක්ෂණාවරණ ජනප්‍රිය කරමින් පවතී.

තරුණ පරපුර අතර ඔන්ලයින් ක්‍රම හරහා මුදල් සෙවීමේ පිරමීඩ ජාවාරම් ජනප්‍රිය වෙමින් ඇත. කෙතරම් නීති රීති පනවා තිබුණත් ඒවායින් රිංගා යමින් මෙම ජාවාරම් ජයටම සිදුකෙරේ.

### ලිංගික සූරාකෑම

පවතින සමාජ ක්‍රමය තුළ මිනිසුන්ට අහිමි කර ඇති බොහෝ දේ අතර ලිංගික නිදහසද වෙයි. එහෙත් ඊනියා සදාචාරය නිසාවෙන් ඒ පිළිබඳ හරවත් කතිකාවක් සමාජය තුළ මතුවන්නේ නැත. පුරුෂාධිපත්‍යය නිසාවෙන් ස්ත්‍රියට සිදුවන හිංසනය සුළු පටු නොවේ. සංක්‍රාන්ති ලිංගික ප්‍රජාව පිළිබඳ අවබෝධය මෙන්ම ඔවුන්ගේ අයිතිවාසිකම් පිළිබඳවත් පොදු සමාජයට පුළුල් අවබෝධයක් ඇත්තේ නැත. ඔවුන්ව හෙළා දකිමින් නින්දා අපහාස කිරීම ලාංකීය සමාජයේ සුලභය.

පවතින රාමුව තුළ සම්මතය විවාහයයි. එහෙත් විවාහයට පවා අවශ්‍ය වටපිටාව නොමැති කම විසින් විශාල සමාජ අසහනයක් වර්ධනය වී ඇත. මේ අර්බුදය තුළ හොඳින්ම අලෙවි කළ හැකි භාණ්ඩයක් බවට ලිංගිකත්වය පත්ව තිබේ. මේ නිසා ලිංගික දර්ශන සඳහා යොදාගනු ලබන නළු නිළියන් භාවිතා කරමින් සිදුකරන වීඩියෝ සහ චිත්‍රපට නිෂ්පාදනය අද විශාල ආදායම් උපයන ජාවාරමකි. මෙම ලිංගික දර්ශන සඳහා සිදුකරන රංගනයන් අතිශය අමානුෂිකය. ඔවුන්ගේ ජීවිත විශාල ඛේදවාචකයන්ගෙන් පිරී ඇත.

### පුද්ගල නිදහස බිඳවැටීම

ධනවාදය බිහිවන්නේම විශාල ලෙස පුද්ගල නිදහස පිළිබඳ අදහසක් සහිතවය. වැඩවසම් සහ ආසියාතික සමාජවලට සාපේක්ෂව ගත්විට ධනවාදය මානව නිදහස දෙසට තැබූ යෝධ පියවරක් බව සැබෑය. එහෙත් ධනවාදයේ අර්බුදය විසින් ඇතිකරන්නේ ඒ සාපේක්ෂ නිදහස ක්‍රමානුකූලව සීමා කරන ක්‍රියාවලියකි. ස්මාට් ජංගම දුරකථනය හරහා සූරාකෑම පුද්ගලබද්ධවම සිදුකිරීමට හැකියාව ලැබී තිබේ. එසේම සමාජ පිරිහීම විසින්ම කෙනෙක් මානසික හිරකරුවකු කිරීමටත්, යටත් කොට පාලනය කිරීමටත් (Black mail) දුරකථනය බහුලව භාවිතා වේ. විශේෂයෙන් කාන්තාවන්ට හිංසා පීඩා කිරීමටත්, ලිංගික බලහත්කාරකම් කිරීමටත් යොදාගත් සිදුවීම් නිතර අසන්නට ලැබේ. ධනවාදය ඊනියා නිදහසක් ගැන කතා කළද මිනිසාගේ මූලික අයිතියක් වන පුද්ගලිකත්වය පවා විනාශ කරන්නේ එසේය.

කිසියම් දෙයක මිල දන්නා, එහෙත් එහි වටිනාකම නොදන්නා පුද්ගලයා "නරුමයා" ලෙස හැඳින්විය හැකි බව ඔස්කාර් වයිල්ඩ් ප්‍රකාශ කළේය. වත්මන් සමාජ ක්‍රමය තුළ සෑම දෙයක් සඳහාම මිලක් නියම වන්නේය. මාක්ස් කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රකාශනයේ සඳහන් කළ පරිදිම ධනවාදය විසින් සියල්ලට මිලක් නියම කරයි. ඒ තුළ වටිනාකම් තූ තූ කොට විනාශ කෙරේ.

මේ නිසා සමාජ පිරිහීම ධනවාදය තුළ ධනවාදයේ අර්බුදයත් සමග සමාන්තරව සිදුවන්නක් වන අතර එය සංස්කෘතික පිරිහීමක් ලෙසද ප්‍රකාශයට පත්වේ.

**"ධනපති පංතිය ආධිපත්‍යය ලැබූ හැම තැනෙකම, සිය රදලවාදී පීතෘ මූලික, පරමාදර්ශී (චාම් ගැමි ජීවිත) සබඳකම් විනාශ කළේය. "ස්වාභාවික ස්වාමිවරුන්ට" මිනිසා බැඳ තිබුණු අනේක විධ රදලවාදී බන්ධනයන් අනුකම්පා විරහිත ලෙස සිඳ බිඳ දැමූ ධනපති පංතිය, මිනිහෙකු සහ මිනිහෙකු අතර නග්න ස්වාර්ථකාමය හැර, අනුකම්පා විරහිත ලෙස මුදල් ගෙවීම හැර වෙනත් කිසිදු සබඳකමක් ඉතිරි නොකළේය. ආගමික භක්තියද, ධීර - වීර උනන්දුවද, අවරසිකවාදී අනුරක්තතාවයද අරහයා වූ ස්වර්ණමය ආනන්දයන් ආත්මාර්ථකාමී ගණන් බැලීම නමැති අයිස් වතුරෙහි ගිල්වා දමන ලදි. එය පෞද්ගලික අගය හුවමාරු වටිනාකම බවට පෙරළන ලදී. එමෙන්ම සංඛ්‍යා විරහිත, උදුරා ගත නොහැකි, වර සහිත නිදහස් අයිතීන් වෙනුවට හෘද සාක්ෂියට කොහෙත්ම එකඟ නොවන එකම නිදහස වන වෙළඳාම් කිරීමේ නිදහස පිහිටුවාලීය. වචනයකින් කියතොත් ආගමික සහ දේශපාලනික මායාවන්ගෙන් වසා තිබුණු සූරාකෑම වෙනුවට එය විවෘත, ලජ්ජා විරහිත, සෘජු, කෲර සූරාකෑම ආදේශ කළේය."**

**-කාල් මාක්ස්, ෆෙඩ්රික් එංගල්ස්**
**-කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රකාශනය**



# අල්ගොරිදම් වලට නටන මිනිස්සු

**බිමල් රත්නායක**

*නූතන මිනිසාගේ සංස්කෘතික ජීවිතය හැඩගැස්වීමේලා විශාල වැඩකොටසක් සිදු කරන්නේ නූතන ජනමාධ්‍ය විසිනි. ඒවා අතරින්ද සමාජ මාධ්‍යයන්හි භූමිකාව සුවිශේෂී වේ. සමාජ මධ්‍යයන්හි ප්‍රබල තාක්ෂණික හැසිරවීමක් වන 'අල්ගොරිදම්' ජන විඥානය හැඩගැස්වීම සඳහා හිතාමතා පාවිච්චි කෙරෙනු හඳුනා ගත හැකිය. විශේෂයෙන් ධනේශ්වර ක්‍රමය තුළ සමාජ මාධ්‍ය හිමිකරුවන්ගේ ලාභ තීරු ඉහළ නැංවීම වෙනුවෙන් මිලියන සංඛ්‍යාත පරිශීලකයින්ගේ පෞද්ගලික සහ සමාජ ජීවිතය වෙනස් කෙරෙමින් ඇති බවටද එය අවසාන වශයෙන් මානව සංස්කෘතියේ සැලසුම් සහගත විනාශයක් බවටද මෙම ලිපිය ඔබට යෝජනා කරයි.*

අන්තර්ජාලය අපේ මනස පුළුල් කරනවාද නැතිනම් පටු කරනවාද?

අන්තර්ජාලයෙන් මම ඉවුම් පිහුම්, භාජන සහ භාජන ගැන බොහෝ දේ ඉගෙන ගෙන ඇත.

එතකොට ඔබට පාපන්දු ගැන දැනගන්න ඕනේද?

දකුණු අප්‍රිකාවේ ජනාධිපති කවුද? ඉතින් අපිට මේ වගේ ගොඩක් දේවල් දැනගන්න ඕන වෙනවා.

ඉතින් අද අපි දාර්ශනිකව මෙහෙම අහනවා.

"අන්තර්ජාලය ඔබේ මනස පුළුල් කරයිද? එසේත් නැතිනම් එය ඔබට පටු අදහස් ඇති කරයිද?"

දැන්, ඔබ "ඒක ගැඹුරු ප්‍රශ්නයක්." යැයි සිතයි.

"ඔව් ඒක තමයි" මමද එසේ කියමි. නමුත්, එම ප්‍රශ්නයට පිළිතුරු දීමට, ඔබ දකින දේ ඔබ දකින්නේ ඇයිද යන්න ගැන අප කතා කළ යුතුයි.

**අල්ගොරිදම්**

ඔබේ සමාජ මාධ්‍ය හසුරුවන (ඒක ෆේස්බුක් ද, Instagramද, tiktokද ඒ කුමක් වුණත්) අල්ගොරිදම් කියන්නේ මොනවාද?

අල්ගොරිදම් ගැන බොහෝ දේ කතා කිරීමට ඇත. මූලික වශයෙන්, අල්ගොරිදමයක් යනු සූත්‍රයක් හෝ ගැටලුවක් විසඳීමට උපදෙස් මාලාවකි. (හරියට කෑමක් උයනකොට යොදා ගන්න ආහාර වට්ටෝරුව, recipe එක වගේ. උයන විදිය පියවරෙන් පියවරට තියෙනවා වගේ දෙයක්)


අල්ගොරිදම් ලබා දී ඇති සමාජ මාධ්‍ය යෙදුමක් ඔබට පෙන්විය යුතු දේ තීරණය කරන ආකාරයයි. පොදුවේ අල්ගොරිදම් යනු පරිගණක උපදෙස් වේ. උදාහරණයක් කිව්වොත් ලෝකෙ පුරාම එක විනාඩියක දී පැය 500ක වීඩියෝ යූටියුබ් වෙත අප්ලෝඩ් කෙරේ. ලොව පුරා සෑම මිනිත්තුවකම එය දිනකට පැය 7,20,000ක වීඩියෝ! ඒ අවුරුදු 82.2ක කාලයයි. ඒක සම්පූර්ණයෙන් ජීවිත කාලයක්.

දිනකට Tiktokවල වීඩියෝ බිලියනයකට වඩා නරඹනු ලැබේ. බැලීමට වීඩියෝ විශාල ප්‍රමාණයක් ඇත. ඇතැම් විට ඔබ ඔවුන්ගේ හැම වීඩියෝවක් ගැනම උනන්දුවක් නොදක්වයි. කුරුලෑ මතු වීම පිළිබඳ වීඩියෝ, රූපලාවන්‍ය ගැන ඇති වීඩියෝ! එවිට අල්ගොරිදම් අපේ ඉල්ලීමකට කටයුතු කරන්නේ කොහොමද? එය ඔබ ඉල්ලා සිටින අන්තර්ගතය හඳුනා ගැනීමට උදවු කරයි.

ඇලෙක්සැන්ඩර් න්වාලා පරිගණක විද්‍යාඥයෙකි. සමාජ මාධ්‍යවල තොරතුරු පැතිරෙන ආකාරය ඔහුගේ විෂය ක්ෂේත්‍රයයි. මෙය වඩා හොඳින් තේරුම් ගැනීම සඳහා අපි ඔහු සමඟ කරන ලද සාකච්ඡාවක් ඇසුරෙන් මෙම ලිපිය සකස් කළෙමු.

**සමාජ මාධ්‍යයක අල්ගොරිදම් හැසිරීම**

සමාජ මාධ්‍ය ඔබ ගැන ඉගෙන ගැනීම සඳහා ඔවුන් තොරතුරු රැස් කළ යුතුයි. එබැවින්, ඔවුන් ඔබ බ්‍රවුස් (browse) කරන සමහර පිටු එකතු කරන විට, ඔබ සොයන සමහර අන්තර්ගතයන්, අල්ගොරිදම් විසින් සැලකිල්ලට



ගනී. ඉන්පසුව, ඔවුන් බොහෝ සංකීර්ණ යාන්ත්‍රික ඉගෙනීම්වලට (machine learning) ලක්කරයි, මෙම තිරය පිටුපස බොහෝ ගණිතමය ගණන්බැලීම් පවසන්නේ, "හරි අපි හිතනවා ඔයා මේකට කැමති වෙයි කියලා" යන අදහසයි.

එසේ හිතන ඔවුන් අපට බැලීමට හා කියවීමට වීඩියෝ හෝ රූප හෝ ලිපි සපයයි. අපි එම අන්තර්ගතය සමඟ සම්බන්ධ වන්නේ නම්, ඔවුන්, සමාජ මාධ්‍ය අල්ගොරිදම් ඔස්සේ ඔබට ඒවායින් වැඩි වැඩියෙන් ලබා දෙයි. ඔබ අල්ගොරිදමයට කියන අයුරින්, ඔබ එයට යම් ප්‍රතිපෝෂණ ලබා දෙයි. "මට මේකෙන් තව දෙන්න, මට මේකෙන් තව දෙන්න, මට මේකෙන් වැඩිපුර දෙන්න."

මෙම සමාගම් අපගේ සෑම පියවරක්ම බොහෝ දුරට නිරීක්ෂණය කරයි. ඔවුන් ඔබ නරඹන දේ පිළිබඳ දත්ත රැස් කරයි, ක්ලික් කිරීම, කැමැති වීම, අදහස් දැක්වීම, බෙදා ගැනීම, මිලදී ගැනීම, අපි කොපමණ කාලයක් යමක් නරඹනවාද? අප ජීවත් වන ස්ථානය, අපේ වයස කීයද යනාදිය. අප කැමැති යැයි ඔවුන් සිතන අන්තර්ගතය අපට ලබා දීම වෙනුවෙන් පුරෝකථන සැකසීමට එම දත්ත සියල්ලම භාවිත කරයි.

ඒ අල්ගෝරිදමය මෙසේ තීරණය කරනවා විය හැකිය.

"මොහු අවුරුදු 27ක පිරිමියෙක්, ජීවත් වන්නේ රත්නපුරයේයි, ඔහු සපත්තුවලට සහ ඉවුම් පිහුම්වලට කැමැතියි. නමුත් ඔහු වෛද්‍ය උපදෙස් වීඩියෝවලට වෛර කරයි. එබැවින්, ඔහුට තවත් පෙන්විය යුත්තේ ඉවුම් පිහුම් අන්තර්ගතයන්ය, ඒ වගේම ඔහුට වෛද්‍ය උපදෙස් දෙන වීඩියෝ නොපෙන්විය යුතුය."

මෙම දත්ත සමඟ, ඔවුන්ට සුපිරි ඉලක්කගත දැන්වීම් අපටද අලෙවි කළ හැකිය. ඔබ එහි වැඩි කාලයක් රැඳී සිටියහොත්, ඔවුහු දැන්වීම් ආදායම මගින් වැඩිපුර මුදල් උපයති. ඔවුන් වැඩිපුර මුදල් උපයන්නේ ඔබ ගැන එකතු කරන තොරතුරු මගිනි. නමුත් මුළු අදහසම විකිණීමට මාර්ගයක් සොයා ගැනීමයි; ඔබව දැන්වීම් තුළ රඳවා තබා ගැනීමයි. ඒ වෙනුවෙන් ඔවුන් ඔබට ආයාචනා කරමින් සිටියි.

දවස අවසානයේදී, මෙම සමාජ මාධ්‍ය, සමාගම් ව්‍යාපාර මුදල් හොයමින් සිටියි. ඔබ යෙදුමේ වැඩි වේලාවක් ගතකරන තරමට, ඔබට වැඩි දැන්වීම් පෙනෙනු ඇත. 2021දී TikTok දැන්වීම්වලින් ඩොලර් බිලියන 04ක් උපයා ඇත. මේ වසරේ එය ඩොලර් බිලියන 12ක් දක්වා තුන්ගුණයකින් වැඩි කිරීමට ඔවුන්ට අවශ්‍ය වී තිබේ. 2020 දී, Instagram දැන්වීම් විකිණීම මගින් ඩොලර් බිලියන 17.4ක් උපයා ඇත. එය අතිවිශාල මුදලකි.

සියලු සමාජමාධ්‍ය සමාගම් මෙම අල්ගොරිදම් සිය අභ්‍යන්තර ක්‍රියාකාරීත්වයේ තබා ගනී. එය ඔවුන්ගේ රහස් සෝස්ය. උදාහරණයක් ලෙස, TikTok එය සැලකිල්ලට ගන්නා බව ප්‍රසිද්ධියේම පවසන්නේය. ඔබ නරඹන දේ සහ ඔබ කොපමණ කාලයක් යමක් නරඹනවාද? ඔබ හුවමාරු (share) කරන ඒවා අදහස් (comment) දක්වන ඒවා විවිධ emoji දාන ඒවා මේ සියල්ල හරියටම එම සමාජ මාධ්‍යයටම ආවේණික බර තැබීම් ක්‍රමයක් අනුව වර්ගීකරණය කෙරේ. එය සමාගම පමණක් දන්නා රහසක් නිසා එය සිදු කරන ආකාරය කෙසේ දැයි අපි නිශ්චිතවම නොදනිමු. නමුත් ඔවුන් එසේ කරන බව අපි නිශ්චිතවම දනිමු. ඔබ ඉල්ලා ඇති ඇති අන්තර්ගතය ඔබට ලබා දීමට ඔවුන් කටයුතු කිරීමට පටන් ගන්නේ එසේය.

එහෙත්, සමාජ මාධ්‍ය ඔබ නිරත වන දේ පමණක් නොව අල්ගොරිදම් නිර්දේශද සැලකිල්ලට ගනී. අනෙක් සියල්ලන්ම කැමැති like සහ බෙදා ගන්නා දේ share කිරීමට ඔවුහු නැඹුරු වෙති. වැඩිම ලයික් ප්‍රමාණයක් තිබෙන වැඩිම comments ප්‍රමාණයක් තිබෙන වැඩිම shares ප්‍රමාණයක් තිබෙන, තොරතුර වැරදි හෝ බොරු වුවද අල්ගොරිදම් අපට පෙන්වීමට

**ඔබ නරඹන දේ පිළිබඳ දත්ත රැස් කරයි, ක්ලික් කිරීම, කැමැති වීම, අදහස් දැක්වීම, බෙදා ගැනීම, මිලදී ගැනීම, අපි කොපමණ කාලයක් යමක් නරඹනවාද? අප ජීවත් වන ස්ථානය, අපේ වයස කීයද යනාදිය. අප කැමැති යැයි ඔවුන් සිතන අන්තර්ගතය අපට ලබාදීම වෙනුවෙන් පුරෝකථන සැකසීමට එම දත්ත සියල්ලම භාවිත කරයි.**

නිර්දේශ කරයි.

**කැමැත්තට කොටු කිරීම**

ඉදින් ආපසු අපි මුල් ප්‍රශ්නයට යමු. "අන්තර්ජාලය ඔබේ මනස පුළුල් කරයිද? එසේත් නැතිනම් එය ඔබට පටු අදහස් ඇති කරයිද?" එක් අතකින්, ගිණුම් අනුගමනය කිරීමෙන් සහ වීඩියෝවලට කැමැති වීමෙන්, ඔබ දකින දේ සම්බන්ධයෙන් ඔබට විශාල පාලනයක් නොලැබෙයි. උදාහරණයක් ලෙස ඔබ සැබැවින්ම මැහුම්ගෙතුම් කිරීමට කැමැති යැයි සිතමු. නමුත්, ඔබේ සැබෑ ජීවිතයේ මිතුරන් කිසිවෙක් එසේ නොකරති. එබැවින්, ඔබ වැඩිපුර බලන සමාජ මාධ්‍යයේ ඔබ කැමති දේවල් අනුගමනය කිරීමට පටන් ගනී. ඉන්පසුව ඔබට සම්පූර්ණයෙන්ම නව ප්‍රජාවකට සම්බන්ධ වී මැහුම්ගෙතුම් කටයුතු ගැන ඉගෙන ගත හැකිය.

අල්ගොරිදම්වලින් නිර්දේශ කරනු ලබන දේවල අන්තරායයන් ඔබ දැන නොසිටිනු ඇත. නමුත්, අනෙක් පැත්තෙන්, මෙම අල්ගොරිදම් ඔබගේ මනාපයන් ඉගෙන ගන්නා බැවින්, ඔබේ දේවල් ගැන උනන්දු යැයි ඔවුන් කිසිදා ඔබට පෙන්වන්නේ නැත. නමුත් ඔවුන් හදිසියේම වගේ, "ඔයා ගෙතුම්වලට කැමැතියි නේද? ඔබ ඒ ගැන සෙවීමට උත්සාහ කළාද?" යනුවෙන් ඔබෙන් ඇසිය හැකියි. අවසාන වශයෙන් එය ඔබ නොදැනුවත්ව ඔබව විවිධ ක්ෂේත්‍රවලට පුළුල්ව නිරාවරණය කිරීම සීමා කළ හැකිය.

පර්යේෂණ මඟින් පෙන්වා දී ඇත්තේ, Information bubble හෝ echo කුටි තුළ පරිශීලකයන් උගුලට හසු විය හැකි බවයි. මේ algorythemවලින් ඔබට අන්තර්ගතය සපයයි. එය ඔබ දැනටමත් විශ්වාස කරන දේ ශක්තිමත් කරයි. එවැනි තොරතුරු නිරන්තරවම ලැබෙන විට ඒ පිළිබඳව දරන අදහස විශේෂයෙන් ශක්තිමත් වෙයි. ඔබ පරිභෝජනය කරන දේශපාලන විශ්වාසයන් හෝ ප්‍රවෘත්තිවලට දැඩි විශ්වාසයක් ඇති වේ. ඔබ ඇත්තටම යමක් ගැන විවේචනාත්මකව සිතන්නේ නැත්නම්, එය අභියෝගයට ලක් නොකරන්නේ නම් ඔබ අන්තර්ගතය සමඟ අන්තර්ක්‍රියා කරන තරමට ඔබ උනන්දුවක් දක්වන දෙයක අන්තර්ගතය නොබලාම භාර ගනී.

**කඩේ යවන අල්ගොරිදම්**


ඉරෙටියොලු අකින්රිනාදේ (Iretiolu Akinrinade) ඩිජිටල් අවකාශයන්හි නවයොවුන් වියේ යහපැවැත්ම අධ්‍යයනය කරයි. මේ algorythem ක්‍රියා කරන ආකාරය නිසා, ඒවා සකස් කර තිබෙන්නේ ඔබව ඇදබැඳ තබා ගැනීමේ අරමුණින්ම නිසා ඔබට කිසිදා කුමක් සිදුවේදැයි බැලීමට අවස්ථාව නොලැබෙයි. සමහර තරුණ සමාජ මාධ්‍ය පරිශීලකයන් මෙය නිරීක්ෂණය කිරීමට නිර්මාණාත්මක ක්‍රම සොයාගෙන ඇති බව ඇය පැහැදිලි කරයි. කෙටියෙන්ම කිවහොත්, එය 'අල්ගොරිදම් අපව කඩේ යවන්නේ කෙසේද කියා බැලීමයි.'

මේ වගේ එක Tiktok පරිශීලකයෙක් දෙවන ගිණුමක් සෑදීය. ඔහු එසේ කළේ ඔහුට කොවිඩ් positive වී තිබෙන ආකාරයට Covid රෝගියෙක් ලෙසට ගිණුමක් හදාගනිමිනුයි. ඔහු ඒ පිළිබඳ තොරතුරු හොයා බලන්න උනන්දු වී තිබිණි. ඒ අනුව මේ ගිණුම අයිතිකරු Covid රෝගී කෙනෙකු යැයි අල්ගොරිදම්වලින් හඳුනා ගනු ලැබීය. ඒ නිසා ඔහුට කොවිඩ් වැළඳීමෙන් පසු අවශ්‍ය යැයි ඔවුන් තීරණය කළ විවිධ දේවල් අඩංගු ඡායාරූප, වීඩියෝ විශාල වශයෙන් එවන්නට පටන් ගෙන තිබිණි. මෙම සමස්ත ප්‍රවණතාව ඔහු විසින් සොයා ගත්තේ එහිදීයි.

කොවිඩ් ආසාදිත පරිශීලකයන් පොදු ස්ථානවලට ගොස් හිතාමතාම මිනිසුන්ට ආසාදනය කිරීම වාගේ තොරතුරු අඩංගු වීඩියෝ පවා ඔහුට එවනු ලැබීය. ඒ, algorythem විසින් ඔහුව හඳුනා ගත්තේ Covid positive රෝගියෙක් ලෙස බැවිනි. නමුත්, සැබැවින්ම ඔහු එහෙම අයෙකු වූයේ නැත. ඔහු එය ඇල්ගොරිදම් වැඩ කරන ආකාරය නිරීක්ෂණය වෙනුවෙන් fake account භාවිතයෙන් කළ අත්හදාබැලීමක් විය.

කෙසේ වෙතත්, ඔහු එම අත්දැකීම ඔහුගේ ප්‍රධාන ගිණුම මගින් අන්‍යයන් සමග බෙදාගත්තේය. එයින් ඔහු පෙන්වා දුන්නේ අප එකිනෙකාගේ කැමැත්ත, රුචිකත්වය, වුවමනාව මත ඇල්ගොරිදම්වලින් ලබා දෙන තොරතුරු සම්පූර්ණයෙන්ම විශ්වාස කළහොත්, අප ලෝකයේ පොදු යථාර්ථයෙන් ඈත් වෙන බවයි; අල්ගොරිදම්වලින් අපව අප කැමැති 'තොරතුරු බුබුළක' නොඑසේනම් ෆැන්ටසියක් තුළ සිර කරන බවයි.

ඒ නිසා මේ තොරතුරු බුබුළු echo chamber එක බිඳදැමීම සමාජ මාධ්‍ය පාවිච්චි කරද්දී ඉතාම වැදගත්ය. සමාජ මාධ්‍ය ඇල්ගෙ ාරිදම් පරිපූර්ණ නොවේ. echo chambersවලට සමාන, මෙම අල්ගොරිදම් භයානක ගුහා තුළට, වඩාත් ආන්තික අන්තර්ගතයන් කරා පරිශීලකයන් ගෙන යා හැකියි. රැඩිකල්කරණයට පවා තුඩු දෙයි. සුදු ආධිපත්‍යවාදීන් white supremacist වෙත හෝ එවැනි අන්ත දක්ෂිණාංශික මත කෙරෙහි පරිශීලකයන් යොමු කරවීමට සහ



ආශක්ත කරවීමට හැකියි.

සමාජ මාධ්‍ය සමාගම්වල අභ්‍යන්තර තොරතුරු දෙස බලද්දී ඔප්පු වන බරපතළ භයානක කරුණු තිබේ. Instagramහි අල්ගොරිදම් නවයොවුන් වියේ ගැහැනු ළමුන් කුමන ආකාරයේ විය යුතු දැයි ඉතාම දරුණු ආකාරයෙන් පෙළඹවීම් සිදුකරයි. නවයොවුන් වියේ තරුණියන් වැරැදි, මංමුළා කරවන ප්‍රවණතාවලට ලක්කරවන අල්ගොරිදම් ක්‍රියාත්මකය. ඔවුන්ගේ ශරීර රූප ගැන ඍණාත්මක හැඟීමක් ඇති කරවීම උදාහරණයක් ලෙස දක්විය හැකිය.

එමෙන්ම සමාජ මාධ්‍ය ආයතන ලාභ ලබන ව්‍යාපාර බව අමතක නොකළ යුතුයි. පහුගිය වසරවල ඒවායේ ලාභ අතිවිශාලයි. අද ලෝකයේ ධනවත්ම සමාගම් වී ඇත්තේ, මෙම සමාජ මාධ්‍ය සමාගමිය. ඔවුන් එම ලාභය උපයන්නේ සමාජ මාධ්‍ය තුළ දැන්වීම් පළ කිරීමෙන් සහ සමාජ මාධ්‍යවල කටයුතු කරන පරිශීලකයන්ගේ විවිධ තොරතුරු සහ දත්ත විවිධ වෙළඳ සමාගම්වලට විකිණීම මඟිනුයි.

සමාජ මාධ්‍ය සමාගම්වල ප්‍රධානම අරමුණ වී ඇත්තේ ලාභ ඉපයීම වන බැවින් ඔවුන් තම පරිශීලකයන් වැඩිම කාලයක් තමන්ගේ සමාජ මාධ්‍ය තුළ තබා ගැනීමට හැකි වන පරිදි ඒවායේ මෘදුකාංග සහ අල්ගොරිදම් සකසා තිබේ. එය මත්ද්‍රව්‍ය නිෂ්පාදකයන් මිනිසුන් මත්ද්‍රව්‍යවලට වැඩිපුර ඇබ්බැහි කරවා ගැනීමට යොදන රසායනික සහ ප්‍රචාරක උපක්‍රම වැනිය.

## සමාජ මාධ්‍ය උපක්‍රම

පරිශීලකයින් අල්ලා ගැනීම සඳහා සමාජ මාධ්‍ය විසින් යොදා ගනු ලබන උපක්‍රම රාශියක් තිබේ. ඉන් ප්‍රධානම උපක්‍රමයක් වී ඇත්තේ සමාජ මාධ්‍ය තුළ සිදු කරන ඕනෑම ක්‍රියාවක් සඳහා ඇගයීමක් (Rewards) ලබා දීමේ ක්‍රියාවලියයි. සරලව කිවහොත්, ඕනෑම සුළු දෙයකට like දැමීමට, comment දැමීමට, ස්ටිකර් තොගයක් දැමීමට අසීමාන්තික ඉඩක් හදා තිබීමයි. සමාජ මාධ්‍යවලට පරිශීලකයන් ඇබ්බැහි වීම පිළිබඳ කරන ලද පරීක්ෂණවල දී ඔප්පු වී ඇත්තේ මේ සෑම දෙයටම like, share, comment දැමීමට ඉඩකඩ තිබීම මඟින් මේ හැම ක්‍රියාවකදීම 'ඩොපමීන්' නම් හෝමෝනය නිපදවන බවයි. ඩොපමීන් යනු අපට සතුට ඇති කරවන රසායනිකයකි. ඒ නිසා එම සතුට දිගටම තබා ගැනීම වෙනුවෙන් මනුෂ්‍ය ශරීරය කටයුතු කිරීම ස්වාභාවිකයි. ලයික් එකක් දැමීමෙන් ඩොපමීන් ශ්‍රාවය වන විට මොළය තුළ ඇති කරන්නේ සතුටු හැඟීමකි. එම හැඟීම මඟින් දිගටම එම ක්‍රියාවලිය තුළ සිටීමට අපව පොළඹවයි.

අනෙක් කරුණ වන්නේ අපට අසීමාන්තිකව, කිසිදු ආයාසකින් තොරව පෝස්ට් දහස් ගණනක් Scroll කරමින් (තල්ලු කරමින්) බැලීමට හැකි වන පරිදි ස්මාර්ට් ජංගම දුරකථන සකස්කර තිබීමයි. අප බොහෝ දෙනෙකු කිසිදු අරමුණකින් තොරව ජංගම දුරකථනයේ විනාඩි ගණන් Scroll කරමින් සිටිමු. බොහෝ අය එසේ කරද්දී, තිබෙන post කියවන්නේ හෝ නැත. නමුත්, Scroll කිරීමට ලක්වන සෑම පෝස්ට් එකක් මඟින්ම ඒවායේ අඩංගු සෑම

දැන්වීමකටම මුදල් ලැබීමක් සිදුවෙයි. එමනිසා අසීමාන්තිකව Scroll කළ හැකි වන පරිදි මෘදුකාංග සකසනු ලැබ තිබේ.

එසේම අපගේ සෑම චර්යාවක්වම උපරිම වශයෙන් නිරීක්ෂණයට ලක්වේ. නිදසුනක් වශයෙන් අප විනාඩියකට වැඩි කාලයක් වැයකරමින් බලන වීඩියෝ මොනවාද, විනාඩියකට අඩුවෙන් බලන වීඩියෝ මොනවාද ආදී වශයෙන් සියලු දෙයක්ම පුළුල් හා සංකීර්ණ අල්ගොරිදම් මාර්ගයෙන් ඔවුන් විසින් විශ්ලේෂණය කරනු ලබයි.

ඒ අනුව අපගේ රුචිකත්වය අනුව වීඩියෝ ඡායාරූප සහ තොරතුරු අඛණ්ඩව හා අසීමාන්තිකව ලබා දෙයි. ඒ අතරම මෙම සමාගම්වල අල්ගොරිදම් සකස් කරන මෘදුකාංග ඉංජිනේරුවන්ට ලැබෙන දේශපාලන සහ සමාජ උපදෙස් අනුවත්, ඒවා සකස් කරන අයගේ මනසේ තිබෙන විවිධ අගතිගාමී ආකල්ප අනුවත් අල්ගොරිදම් සකස් වෙයි. ඒ අනුව අප කැමැති දේ මෙන්ම ඒවා ඔවුන් කැමැති ආකාරයකට වෙනස් කර බැලීමටද අපට සලස්වයි.

විශේෂයෙන්ම බටහිර අධිරාජ්‍යවාදී දේශපාලන හා සංස්කෘතික දැක්ම පැතිරවීම සඳහා මෙම අල්ගොරිදම් බහුලව යොදා ගැනෙයි. එමෙන්ම ජනප්‍රිය හා බලවත් පුද්ගලයන්ගේ පෝස්ට් සහ වීඩියෝ වැඩි පිරිසකට නැරඹීමට සැලැස්වීමටත්, ඒ අයුරින්ම ඒ අදහස් ඉදිරිපත් නොකරන බලවත් හෝ ප්‍රසිද්ධ නොවන අයගේ පෝස්ට් සහ වීඩියෝ ඉතාම අවම මට්ටමකින් ප්‍රචාරය කිරීමටත් මෙම සමාගම් සහ අල්ගොරිදම් කටයුතු කරනවා.

එමගින් ලෝකයේ ආධිපත්‍යවාදී දේශපාලන සහ සංස්කෘතික අදහස්, පාරිභෝජනවාදී අදහස්ද, පොදුවේ ධනපතියන් ප්‍රතිනිෂ්පාදනය කරන දෘෂ්ටීන් සහ ක්‍රියාවන් පුළුල් වශයෙන් සමාජය තුළ බෙදාහැරෙනු ලබයි. බොහෝ අවස්ථාවලදී අප රුචිකත්වයක් නොදක්වන අප ඉල්ලා නොසිටින ලද අපගේ මිතුරු ලයිස්තුවේ නොමැති ප්‍රබල පුද්ගලයන්ගේ අදහස් සහ ධනපති දෘෂ්ටිවාදයට ගැළපෙන ඡායාරූප සහ වීඩියෝ අප වෙත ලැබීමට සලස්වන්නේ ඒ අනුවයි.

සමාජ මාධ්‍ය නියාමනය කරන විවිධ උපදෙස් සහ රෙගුලාසි අනුව සමාජ මාධ්‍ය පරිශීලකයන්ට ඔවුන් කැමති ඒවා පමණක් නොව වෙනත් දේවල්ද ඉදිරිපත් කළ යුතු යැයි සම්මතයක් තිබුණත්, බොහෝ විට සිදුවන්නේ සමාජ මාධ්‍ය පරිශීලකයන් ඇබ්බැහි කර ගැනීමේ අරමුණින් ඔවුන් කැමැති වීඩියෝ සහ post 90%ක් පමණ ලබා දෙන අතර, සියයට දහයක් පමණ එසේ නොවන ඒවා ලබා දීමයි. මෙම තත්වය තුළ සිදුවන්නේ බොහෝ සමාජ මාධ්‍ය පරිශීලකයන් තොරතුරු ගුහාවල සිර කිරීමය.

### ලාභය වෙනුවෙන් රෝගී කරවීම

සමාජ මාධ්‍ය පමණක් නොව google, yahoo වැනි search engine සකස්කර ඇත්තේ මෙම ක්‍රමවේද මතමය. මිනිස් දැනුම පුදුමාකාර ආකාරයකින් පුළුල් කළ හැකිව තිබෙන අන්තර්ජාලය සහ අල්ගොරිදම්, ප්‍රධාන වශයෙන්ම ලාභය ඉපයීම සඳහා සමාගම් පරිශීලකයන් ඇබ්බැහි කර ඔවුන් රෝගී වන මට්ටමටම, ජංගම දුරකථනවලට සහ පරිගණකවලට ඇදබැඳ තබා ගන්නා මට්ටමට මෙම තාක්ෂණය ප්‍රාග්ධනයේ වුවමනාකම් වෙනුවෙන් යොදා ගැනෙමින් තිබේ. මේ වන විට අධික ලෙස ජංගම දුරකථනවල සමාජ මාධ්‍ය ඇසුරු කරන අය screen time රෝග විශාල ප්‍රමාණයකට ගොදුරු වන බවත්, එය නිශ්චිතවම ශාරීරික හා මානසික රෝග ඇති කරන බවත් ලෝක සෞඛ්‍ය සංවිධානය නිල වශයෙන් ප්‍රකාශ කර තිබේ.

පරිශීලකයන් මේවාට ඇබ්බැහි නොකර ඔවුන්ට දැනුම සහ රසවින්දනය ලබා ගැනීමට හැකි වන පරිදි ඉතා පහසුවෙන් මෙම අල්ගොරිදම් හා මෘදුකාංග නිර්මාණය කළ හැකිව තිබියෙදී, ඒවා බිලියන ගණනක් ජනතාව ඇබ්බැහි කරවා, ඔවුන් මායාමය යථාර්ථයක සිර කරවා, ඔවුන්ගෙන් ඩොලර් ට්‍රිලියන ගණන් උපයා ගැනීමට කටයුතු කෙරේ. ජනතාවගේ චර්යාවන් සහ මූලික තොරතුරු අමුද්‍රව්‍ය ලෙස යොදා ගනිමින්, ඔවුන් රෝගීන් කරවමින් සහ ඔවුන් ප්‍රයෝජනයක් නැති සයිබර් අවකාශයේ රස්තියාදු ගැසීම්වලට යොමු කරවා අධික ලාභ උපයන ක්‍රියාවලියක් බවට මෙම සමාජ මාධ්‍ය හා ඒවාට අදාළ මෘදුකාංග සහ අල්ගොරිදම් ධනපති ක්‍රමය විසින් පත් කර තිබේ.

### කෘත්‍රිම මත්ද්‍රව්‍ය

තාක්ෂණය ලාභ උපදවීම වෙනුවෙන් සහ මිනිසාගේ විනාශය වෙනුවෙන් භාවිත කරනු ලබන තවත් විනාශකාරී භාවිතයක් වන්නේ කෘත්‍රිම මත්ද්‍රව්‍ය නිෂ්පාදනයයි. ස්වාභාවික අමුද්‍රව්‍ය මත පදනම් වී නිෂ්පාදනය කරනු ලබන ඖෂධවල සංයෝගම කෘත්‍රිමව වෙනස් කිරීම මඟින් නිපදවනු ලබන සහ ශරීරයට කායික චිකිත්සක (Theraputic) සහ මානසික ක්‍රියාවලියට බලපෑම් කළ හැකි රසායනික ද්‍රව්‍ය කෘත්‍රිම ඖෂධ ලෙස හැඳින්වේ.

විශාල වශයෙන්, අඩු වියදමින්

**කෙසේ වුවද, මෙම මිනිස් දැනුමේ විශේෂ හැකියාවන් වන කෘත්‍රිම ඖෂධ නිෂ්පාදනය අද වන විට විශාල වශයෙන් කෘත්‍රිම මත්ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා යොදා ගන්නා දැනුමක් සහ තාක්ෂණයක් වී තිබේ. ලංකාවේ මෑතක සිට ප්‍රබලව ව්‍යාප්ත වන, වැඩි ඇබ්බැහි වීමේ ගුණයක් සහිත 'මෙතම්ෆැටමින්' (Methamphetamine) කෘත්‍රිම රසායනය මඟින් නිපදවනු ලබන 'අයිස්' (ICE) මත්ද්‍රව්‍යය මේ සඳහා ප්‍රබල උදාහරණයකි.**

නිපදවිය හැකි මෙම ඖෂධ විවිධ රෝග සඳහා යොදාගත හැකි වේ. එසේ වුවද, කෘත්‍රිම ඖෂධ නිෂ්පාදනය පිළිබඳව අවශ්‍ය තරම් පර්යේෂණ, විශේෂයෙන්ම මිනිසුන්ට අදාළව කර නැති නිසාත්, ඒවා පිළිබඳව අවශ්‍ය නීතිරීති, ප්‍රමිති සම්පාදනය කර නැති නිසාත්, මෙම කෘත්‍රිම ඖෂධ මාරාන්තික වීමේ ඉඩකඩද තිබේ.

කෙසේ වුවද, මෙම මිනිස් දැනුමේ විශේෂ හැකියාවන් වන කෘත්‍රිම ඖෂධ නිෂ්පාදනය අද වන විට විශාල වශයෙන් කෘත්‍රිම මත්ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා යොදා ගන්නා දැනුමක් සහ තාක්ෂණයක් වී තිබේ. ලංකාවේ මෑතක සිට ප්‍රබලව ව්‍යාප්ත වන, වැඩි ඇබ්බැහි වීමේ ගුණයක් සහිත 'මෙතම්ෆැටමින්' (Methamphetamine) කෘත්‍රිම රසායනය මඟින් නිපදවනු ලබන 'අයිස්' (ICE) මත්ද්‍රව්‍යය මේ සඳහා ප්‍රබල උදාහරණයකි.

කෘත්‍රිම කංසා ආශ්‍රිත නිෂ්පාදන මෙම කෘත්‍රිම මත්ද්‍රව්‍ය නිෂ්පාදනවල ප්‍රමුඛම ඒවා වේ. දැනට කෘත්‍රිම කංසාවලින් නිපදවනු ලබන මත්ද්‍රව්‍ය ප්‍රධාන කාණ්ඩ පහක් පමණ ඇති අතර, ඒවා නම්, Napthoylindocs, Napthyl-methylindoles, Napthyl-Methylindes, Phenylacetylindoles, Cyclohexylphenols වේ.

මෙම කෘත්‍රිම මත්ද්‍රව්‍ය රසායනිකව ස්වාභාවික කංසාවල සංයුතියට වඩා ව්‍යුහාත්මකව වෙනස් වේ. මෙම කෘත්‍රිම රසායනිකම සුදුසු පරිදි යොදාගෙන වෛද්‍ය විද්‍යාත්මකව විවිධ ප්‍රතිකාර සඳහා යොදා ගනු ලබන නමුත්, බහුලව යොදා ගනු ලබන්නේ විෂ මත්ද්‍රව්‍ය ලෙසය. එමඟින් මොළයේ ක්‍රියාකාරිත්වයට බාධා පැමිණීම, මධ්‍යම ස්නායු පද්ධතිය දුර්වල වීම, සිතීමේ ක්‍රියාවලිය දුර්වල වීම, හෘද රෝග ඇති කිරීම, උදරාබාධ (ගැස්ට්‍රයිටිස්) වැනි රෝගාබාධ ඇති කරන අතර, ඇබ්බැහි වීම නිසා ඇති කරනු ලබන සමාජ, ආර්ථික ප්‍රතිවිපාක විශාලය.

මෙම කෘත්‍රිම මත්ද්‍රව්‍ය සහ පොදුවේ මත්ද්‍රව්‍ය නිෂ්පාදනය මිනිස් දැනුම සහ පුළුල් තාක්ෂණයන් භාවිත කර අරමුණුසහගතව මිනිසා විනාශ කරමින්, අධික ලාභ ඉපයීම අරමුණු කර ගත් කර්මාන්තයකි. 2023 ජුනි මස නිකුත් කරන ලද එක්සත් ජාතීන්ගේ ලෝක මත්ද්‍රව්‍ය පිළිබඳ වාර්තාව කරුණු කිහිපයක් හුවාදක්වයි.

- ලොව පුරා මත්ද්‍රව්‍ය භාවිත කරනු ලබන ප්‍රමාණය කලින් ඇස්තමේන්තු කළ ප්‍රමාණයට වඩා වැඩි වන අතර, ඔවුන් සඳහා වන ප්‍රතිකාර සහ අනෙකුත් සේවාවන් ලබා දීම අවම මට්ටමක පවතී.
- 'ලාභ සහ පහසු' කෘත්‍රිම මත්ද්‍රව්‍ය මඟින් ලොවපුරාම මත්ද්‍රව්‍ය වෙළඳපොළ මරණීය ප්‍රතිඵල සහිතව ව්‍යාප්ත වෙමින් පවතී.
- මත්ද්‍රව්‍ය නිෂ්පාදනය සහ බෙදාහැරීම ලොව පුරා ම අපරාධ සහ පාරිසරික විනාශ වැඩි කරමින්, වර්ධනය වේ.

එම වාර්තාවට අනුව ලොව පුරාම මත්ද්‍රව්‍ය එන්නත් කර ගන්නා ප්‍රමාණය 2021දී මිලියන 13.2ක් වූ අතර, එය කලින් ඇස්තමේන්තුවලට වඩා සියයට 18ක වර්ධනයකි. 2021දී මිලියන 296ක් මත්ද්‍රව්‍ය භාවිත කරන්නන්ව සිටි අතර, එය පෙර දශකයට වඩා සියයට 23ක වර්ධනයකි. ලොව පුරාම මත්ද්‍රව්‍ය භාවිත කරන අයගෙන් අවශ්‍ය ප්‍රතිකාර ලැබෙන්නේ සියයට 20කට පමණි. මෙහිදී සාතිශය බහුතරය තරුණ ජනතාවය.

මෙම මත්ද්‍රව්‍ය මාෆියාව කොතරම් විශාලද යත්, එය මෙක්සිකෝව, කොලොම්බියාව, පීරු සහ බ්‍රසීලයේ ඇමෙසන් වනය ආශ්‍රිත ප්‍රදේශ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ගේ පුළුල් ආධිපත්‍යයට ලක් වී ඇති අතර, සාමාන්‍ය පාලනය බිඳවැටෙන මට්ටමට ඒවා ප්‍රබල වී තිබේ. මෙම රටවල විශාල ප්‍රදේශ මත්ද්‍රව්‍ය නිෂ්පාදන කල්ලි විසින් පාලනය කරනු ලබන අතර, ඒවාට එරෙහි වන සමාජ ක්‍රියාකාරීන් ඝාතනය කිරීම සුලභ ක්‍රියා වී තිබේ. ලොව


වැඩිම මිනීමැරුම් ඇති නගර හයම මෙක්සිකෝවෙන් වාර්තා වන අතර, 2023දී මෙක්සිකෝවේ සෙලායා (Celaya) නගරයේ මිනීමැරුම් ප්‍රමාණය ජනගහනයෙන් 1,00,000කට 109.4ක් විය. මේ සඳහා සෘජුව බලපා ඇත්තේ, මත්ද්‍රව්‍ය කල්ලි අතර වන ඝාතන සහ එම කල්ලි විසින් කරනු ලබන ඝාතනයන්ය.

ඇෆ්ගනිස්ථානය ලොව ප්‍රධානම හෙරොයින් නිෂ්පාදන කලාපයක් වී තිබූ අතර, එක්සත් ජනපද ආක්‍රමණකාරී පාලනය තුළ එය වඩාත් වැඩි විය. නමුත්, 2023දී තලේබාන් පාලනය පොපිමල් වගාව තහනම් කිරීමත් සමඟ ලෝක හෙරොයින් නිෂ්පාදනය බිඳවැටී තිබේ. මේ නිසාම ලොව පුරා කෘත්‍රිම මත්ද්‍රව්‍ය නිෂ්පාදනය ඉහළ ගොස් තිබෙන අතර, ඒවායේ සැපයුම් මාර්ගද වෙනස් වී තිබේ.

එමෙන්ම ලොව පුරා ම ඇති වී තිබෙන තවත් ප්‍රවණතාවක් වන්නේ මෙම කෘත්‍රිම මත්ද්‍රව්‍ය භාවිතය ආරම්භක අවස්ථාවේ අඩු බලපෑමක් ඇති නමුත්, ක්‍රමානුකූලව වඩා අන්තරායකාරී ඒවාට පොළඹවන මත්ද්‍රව්‍ය 'ඖෂධ' ලෙස නාමකරණය කර රාජ්‍ය ඖෂධ නීති වෙනස්කර සහ ඒවායේ සිදුරුවලින් රිංගා සාමාන්‍ය වෙළඳපොළට ඇතුල් කර තිබීමයි. 2021 වසරේ කංසා ආශ්‍රිත මත්ද්‍රව්‍ය වැඩිපුර ලබා ගැනීම නිසා උතුරු ඇමෙරිකාවේ සිදු වූ මරණවලින් 90,000ක්ම 'ෆෙන්ටනයිල්' (Fentanyl) නම් මත්ද්‍රව්‍ය නිසා සිදු වූ බවට ඔප්පු වී තිබේ. ඇමෙරිකා එක්සත් ජනපදයේ සමස්ත ආයු අපේක්ෂා කාලය 2015දී 78.8ක්ව තිබී 2021 වන විට (කොවිඩ් බලපෑමට පෙර) 76.1ක් දක්වා අඩු වීමටද මෙම අධික මත්ද්‍රව්‍ය භාවිතය නිසා සිදුවන මරණ බලපා තිබේ.

මත්ද්‍රව්‍ය නිෂ්පාදනය, කෘත්‍රිම මත්ද්‍රව්‍ය නිෂ්පාදනය, බෙදාහැරීම, මත්ද්‍රව්‍ය ආශ්‍රිත මූල්‍ය වෙළඳපොළ, සෞඛ්‍ය රෙගුලාසි වෙනස්කර මත්ද්‍රව්‍ය සමාජගත කිරීම, මත්ද්‍රව්‍ය ආශ්‍රිත විශාල පාතාල කල්ලි විසින් ආණ්ඩු පෙරළීම සඳහා අස්ථාවරභාවය ඇති කිරීම වෙනුවෙන් අධිරාජ්‍යවාදීන් විසින් යොදා ගනු ලැබීම, මත්ද්‍රව්‍යවලින් සිදු වන විනාශය පිළිබඳ පොදු ජනමතය දියාරු කිරීමට සුවිශාල ලෙස මාධ්‍ය සහ විශේෂඥයන් යොදා ගැනීම, මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීම වැළැක්වීමට අවශ්‍ය ක්‍රමවේද දුර්වල කිරීම ආදී ඉතා විශාල සැලසුම් සහගත ක්‍රියාවලියක් ක්‍රියාත්මක වේ. ධනවාදය තුළ මිනිසාගේ යහපත සඳහා යොදාගත හැකි සම්පත් සහ දැනුම අරමුණු සහගතව මිනිසාගේ විනාශය සඳහා යොදා ගැනීමත්, එය එන්න එන්නම වඩ වඩාත් වැඩි වන ආකාරයත් මඟින් ධනවාදය විසින් මිනිසා සංස්කෘතිකමය වශයෙන් පමණක් නොව ශාරීරිකවද විනාශ කරන ආකාරය මනාව ඔප්පු වේ.

මිනිස් වර්ගයා සතු මෙම විශාල දැනුම, හැකියාව සහ තාක්ෂණය මිනිස් වර්ගයා විනාශ කිරීම සඳහා දැනුවත්ව භාවිත කෙරෙන අතර, දැනුමේ හා තාක්ෂණයේ අයිතිය ප්‍රාග්ධනය හිමි ධනවතුන් සුළු පිරිසක් අතින් ගලවාගෙන මිනිස් දැනුම හා තාක්ෂණය පොදු ජන පාලනයකට, ප්‍රජාතන්ත්‍රීය පාලනයකට යටත් කිරීමෙන් පමණක් මිනිසා අති මහත් විනාශයෙන් ගලවාගත හැකි වනු ඇත.





# යහපත් සංස්කෘතියක් වෙනුවෙන් මිනිසාගේ අනවරත අරගලය

**චන්ද්‍රික අධිකාරි**

1936 ජූලි 18 සහ 1939 අප්‍රේල් 01 අතර ස්පාඤ්ඤ ජනරජ ආණ්ඩුව සහ ෆ්‍රැන්සිස්කෝ ෆ්‍රැන්කෝගේ හමුදා ජුන්ටාව අතර ඇති වූ ගැටුම ස්පාඤ්ඤ සිවිල් යුද්ධය නමින් ප්‍රකටය. ෆ්‍රැන්කෝගේ හමුදාවලට එරෙහිව සටන් කිරීම සඳහා ජනරජ ආණ්ඩුවට සමාජවාදී, කොමියුනිස්ට්වාදී, වාමාංශික සියලු කණ්ඩායම්වල සහය ලැබුණි. එයට සෝවියට් දේශයේද සහය ලැබුණි. ජර්මනියේ සහ ඉතාලියේ ෆැසිස්ට් ආණ්ඩු ෆ්‍රැන්කෝට යුදමය සහ අනෙකුත් සැපයුම් මඟින් ආධාර කරන ලදී. එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, ප්‍රංශය, බෙල්ජියම, ජර්මනිය, ඉතාලිය ආදී රටවල බොහෝ දෙනෙක් ෆ්‍රැන්කෝට එරෙහිව සටන් කිරීමට ස්වේච්ඡාවෙන්ම එක්වූහ. සමහරවිට ඒ ඔවුන්ගේ රටවල නියෝගවලටද එරෙහිවය. සුප්‍රකට ලේඛකයින් වන ජෝජ් ඕවල්, අර්නස්ට් හෙමින්වේ ආදීන්ද මෙම ස්පාඤ්ඤ ජනරජයට සහය දැක්වූ බව සඳහන් වේ. කෙසේ වෙතත් 1939 අප්‍රේල් 01 දින ජනරජ හමුදා පරාජයට පත් කරමින් ෆ්‍රැන්කෝ රටේ පාලනය අත්පත්

කරගන්නා ලදී.

මෙම යුද්ධයෙන් ලක්ෂ 05 කට අධික ජනතාවක් මියගිය අතර එම යුද්ධය දෙවන ලෝක යුද්ධයේ පෙරහුරුවක් වශයෙන්ද හැඳින්වේ. 1937 අප්‍රේල් 26 වන දින හිට්ලර්ගේ නාසි පාලන තන්ත්‍රයේ සහයෝගය සහිතව ෆ්‍රැන්කෝ ගුවර්නිකාවට බෝම්බ හෙළන ලදී. ලීජන් කෝන්ඩෝර් නම් නාසි ගුවන් හමුදාව විසින් සිවිල් ජනයා මත මෙම බෝම්බ හෙළීම සිදු කරන ලදී. මෙම බිහිසුණු සිදුවීම ලෝකයම කම්පනයට පත් කරන ලද අතර ඊට එරෙහිව කලාකරුවෝ විවිධ නිර්මාණ සිදු කළහ.

1937 අප්‍රේල් - ජූනි මාසවල ස්පාඤ්ඤ ජනරජ ආණ්ඩුවේ ඉල්ලීමක් පරිදි පැබ්ලෝ පිකාසෝ විසින් මෙම ගුවර්නිකා බෝම්බ හෙළීම පදනම් කරගනිමින් එහි බිහිසුණු බව කුරිරු බව ලොවට කියාපෑමට "ගුවර්නිකා" නම් වූ ලෝක ප්‍රකට චිත්‍රය නිමවන ලදී. එය ලෝකයේ විශිෂ්ටතම යුද විරෝධී සිතුවමක් වශයෙන් සැලකේ.

වඩා යහපත් ලෝකයක් ගොඩනගා ගැනීම සඳහා යහපත් සංස්කෘතියක් ගොඩනගා ගැනීම සඳහා මිනිසා විසින් විවිධ මාධ්‍ය උපයෝගී කරගනිමින් කටයුතු කිරීම අනාදිමත් කාලයක් තිස්සේ සිදු වෙමින් පවතී. ඒ පිළිබඳ අපමණ උදාහරණ ලෝකය පුරා දක්නට ලැබේ. අපගේ උත්සහය මේ විවිධ මාධ්‍ය තුළ යහපත් සංස්කෘතියක් සඳහා මිනිසාගේ අනවරත අරගලය පිළිබඳ මතකයන් කිහිපයක් අවදි කර ගැනීමටයි.

එය තරමක් සරල කාරණයකි. එහෙත් සංස්කෘතිය යනු කුමක්ද? යහපත් සංස්කෘතියක් සඳහා අරගලයක් යනු කුමක්ද යන්න විසඳා ගැනීම සරල කාරණයක් නොවේ. එබැවින් අපි එම කාරණාවලට පිළිතුරක් සාදා ගැනීම පළමු කාරණයක් ලෙස ගනිමු.

**පොදුකම තුළ වෙනස්කම**

සංස්කෘතිය යනු කුමක්ද යන්න පිළිබඳ මෙම සඟරාවෙහි තැන් කිහිපයකම සාකච්ඡා වී ඇති බැවින් අපි මෙහි මෙම ලිපියට අදාළ වන සේ අත්‍යවශ්‍ය කරුණු කිහිපයක් පමණක් ඉදිරිපත් කරමු.

මිනිසා යනු සොබාදහමත්, එහි නියාමයනුත් අවබෝධ කර ගැනීමේ හැකියාවෙන් යුත් වෙසෙස් ගුණයක් සහිත සත්වයෙකි. එබැවින් ඔහු සොබාදහමේ නියමයන් තමන්ට අවශ්‍ය ලෙස භාවිතා කිරීමට උගත්තේය. ඊට මැදිහත් වීමට අවශ්‍ය උපකරණ සහ තාක්ෂණය නිපදවූයේය. හුදු රංචුවක් නැතිනම් රැළක් වෙනුවට අළුත් දේ නිපදවීමේ වුවමනාව පදනම් කරගත් සමාජය නමැති නව මිනිස් සංවිධානය



ඔහු ගොඩනැගුවේය. සහජාසය, ඉව වෙනුවට මිනිසුන්ට බල පවත්වන්නේ ඒ නිපදවීම පදනම් වූ සමාජ කොන්දේසි සහ නියමයන්ය. ඉහතින් සඳහන් කළ සොබාදහම නොවන මිනිසා විසින් නිපදවන ලද දේවල් එනම්, උපකරණ, යන්ත්‍ර සූත්‍ර සහ තාක්‍ෂණයද, සමාජ සම්බන්ධතා හා සමාජ ආයතන (පවුල, රජය, අධ්‍යාපන සහ ආගමික පද්ධති) විවිධ විශ්වාසයන් සහ වටිනාකම්ද, සම්මතයන්ද, භාෂාව සහ සංස්කෘතියන්ද, චාරිත්‍ර හා සම්ප්‍රදායන්ද, කලා හා ප්‍රකාශන ආකාරයන්ද ආදී සියල්ල සංස්කෘතියට අයත් දේ ලෙස සැලකේ.

සෑම සමාජයකටම සංස්කෘතියක් ඇතත් එක් එක් සමාජයට ඇත්තේ වෙනස් සංස්කෘතීන්ය. සංස්කෘතිය මුළු මානව සමාජයටම පොදු එකක් ලෙස වර්ධනය වී නැත. එහි විවිධතාවයන් රාශියක් ඇත. ලෝකයේ එක් තැනෙක සංස්කෘතිය වර්ධනය වී ඉතා ඉහළට වැඩී ඇති අතර තවත් තැනක එය ප්‍රාරම්භක අවධියේ වෙයි.

චින්ගීස් අයිත්මාතව් විසින් "සියවසක් පවත්නා දවස" නමින් රචනා කරන ලද නව කතාවෙහි ඔහු ලෝකයේ තැන් දෙකක එක විට සිදුවන සිදුවීම් දෙකක් විස්තර කරයි. එක් කොනක මිනිසුන් සමූහයක් මියගිය ඥාතියෙකුගේ අවසන් කටයුතු සඳහා මළ සිරුර තම සාම්ප්‍රදායික සුසාන භූමිය වෙත ගෙන යමින් සිටී. ඔවුන්ට ඒ සඳහා දිනක්ම ගතවේ. එය පැරණි නොදියුණු සිරිත් විරිත්, මතවාද සහිත පසුගාමී සංස්කෘතියකින් සමන්විත සමාජයකි. අවමංගල පෙරහැරේ ගමන් ගන්නා මිනිසුන්ට මහ පොළොවේ සිට අභ්‍යවකාශය කරා ගමන් ගන්නා අභ්‍යවකාශ යානයක් දර්ශනය වේ. ඒ කොනෙහි මිනිසුන් අභ්‍යවකාශය ජයගෙන ඇත. සමාජ සංවර්ධනයේ - සංස්කෘතික වර්ධනයේ මේ දුරස්කම ඉතා කුඩා අවකාශයන් තුළදී පවා අපට හමුවේ.

අනෙක් ප්‍රධානම කරුණ වන්නේ පංතිමය විෂමතාවයන් වර්ධනය වීම මූලික කොටගෙන සමාජය තුළ ඇති වී තිබෙන සංස්කෘතික විෂමතාවයන්ය. ආර්ථිකමය නැතිනම් පංතිමය විෂමතාවයට අමතරව භූගෝලීය ස්වභාවය, ඓතිහාසික පසුබිම, සමාජ සංවිධානයේ ආකාරය, ආගමික විශ්වාසයන් ආදිය පදනම් කොටගෙන විෂමතා ඇතිවී තිබේ. පංතිමය ස්වභාවය ඓතිහාසික වර්ධනය සමඟ බැඳී ඇති කරුණක් ලෙස සමාජය තුළ සමාජ ආධිපත්‍යය, ධූරාවලි සකස්වීම අනුව සංස්කෘතික විෂමතා දැකගත හැක. එය නිශ්චිත සමාජයක් තුළත් - අතරත් ඇති විෂමතාවයන් ලෙස හඳුනාගත හැක. ධූරාවලීන්ට සහ ආධිපත්‍යන්ට ගරු කිරීම සහ තීරණ ගැනීමේදී සමහර සංස්කෘතීන්ට වඩා සමානාත්මතා ප්‍රවේශයක් ඇති අතර සමහර සංස්කෘතීන්හිදී අධිකාරයට ගරු කරන ස්වරූපයක් ඇත.

කාන්තාවන් සහ පිරිමින් සඳහා වන භූමිකාවන් සහ අපේක්ෂාවන්ද සමාජ සංස්කෘතික විෂමතා පෙන්වන තැන්වලින් මූලික එකකි.

සාමූහිකත්වය මානව සමාජයේ පොදු ස්වභාවයක් වුවද සංස්කෘතික වර්ධනයේ පසුකාලීන හැරවුම් විසින් වෙනස්කම් ඇතිකොට ඇත. ධනවාදී ක්‍රමය බොහෝ සෙයින් පුද්ගලවාදය උස්කොට සලකන අතර සමාජවාදී මතවාදය සාමූහිකත්වය අගය කරයි. බටහිර ලෝකයේ සංස්කෘතිය තුළ බොහෝ සෙයින් පුද්ගලවාදය වෙත නැඹුරුව ඇති අතර ආසියානු සංස්කෘතීන් සාමූහිකත්වයට වැඩි නැඹුරුවක් දක්වයි. සන්නිවේදන ශෛලීන්, සමාජ චාරිත්‍ර හා ආචාර විධි, සංස්කෘතික වටිනාකම්, ආගමික විශ්වාසය සහ භාවිතයන් ආදී බොහෝ කරුණු සමඟ සංස්කෘතික විෂමතාවයන් දැකගත හැක.

අරගලයක් යන්න සාමාන්‍යයෙන් අර්ථ ගන්වන්නේ බාධාවන්, දුෂ්කරතාවයන් හා විරෝධයන්ට මුහුණ දෙමින්, ඒවා විඳ දරා ගනිමින් විශේෂයෙන්ම විපත්තිදායක සහ අභියෝගාත්මක අවස්ථාවල තම අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා ස්ථිරසාර ලෙස කටයුතු කිරීමයි; උත්සාහ දැරීමයි. ඒවා ස්වාභාවික බලවේග ජයගැනීමට කරන උත්සාහයන් හෝ සමාජීය ස්වභාවයන් ජය ගැනීමට කරන උත්සාහයන් විය හැක. සංස්කෘතිය යන ක්ෂේත්‍රය තුළ අපට ජය ගැනීමට ඇති එම දුෂ්කරතා මොනවාද? අභියෝග මොනවාද? සංස්කෘතිය තුළම සිදුවණ සංස්කෘතික අරගලයක් යන්නෙන් කුමක් අදහස් වේද?

ශ්‍රී ලංකාව යනු භූගෝලීය වශයෙන් වර්ග කි.මී. 65,610 විශාලත්වයෙන් යුතු භූමියකි යන කරුණ ගැන බොහෝ විවාද නැත. නමුත් ශ්‍රී ලංකාව යනු බහුජාතික, බහු ආගමික, බහු සංස්කෘතික රටක් වශයෙන් හැඳින්වුවහොත් එය බොහෝ විවාදයන්ට තුඩු දෙන හැඳින්වීමක් වේ. එය සිංහල - බෞද්ධ රාජ්‍යයක් ලෙස හැඳින්වුවද සියලු ශ්‍රී ලාංකිකයෝ එකපයින් එකඟ නොවෙති. සංස්කෘතිකමය වශයෙන් ඇති මේ භාෂාමය, ආගමික ආදී විෂමතාවයක්, එනම් විවිධ සංස්කෘතික කණ්ඩායම් අතර වෙනස්කම්, අන්තර් ක්‍රියා සහ ආතතීන් විසඳා ගත යුත්තේ



කෙසේද?

කෙනෙක් සිංහල බෞද්ධ රාජ්‍යය ගොඩනැඟීම පිළිතුර සේ දකින අතර, තව කෙනෙක් සිංහල රාජ්‍යයක් සහ දෙමළ රාජ්‍යයක් ලෙස දෙකඩ කිරීම පිළිතුර සේ දකිති. තවත් කෙනෙක් දකින්නේ සියලු දෙනා සමානාත්මතාවයෙන් ජීවත්වන සමාජයක්, රාජ්‍යයක් ගොඩනැඟිය යුතු බවයි. එබැවින් "යහපත් සංස්කෘතියක්" යන්න "ශ්‍රී ලංකාවේ භූමි ප්‍රමාණය" වැනි තනි එකඟතාවයක් ඇති සංකල්පයක් නොවේ.

"යහපත් සංස්කෘතියක් සඳහා මිනිසාගේ අනවරත අරගලය ගැන අපට සාකච්ඡා කරන්නට වන්නේ මේ විවාදයන් තිබියෙද්දීම අපගේ දැක්ම තුළ හිඳිමිනි"

කෙසේ වෙතත් සංස්කෘතිය තුළ මතුව ඇති විවිධාකර වූ විෂමතා, ඒ හේතුවෙන්ම හටගත් ප්‍රතිවිරෝධතා සහ මත ගැටුම්, පසුගාමීකම් ඉවත් කොට වඩාත් පොදු මානව සංස්කෘතියක් දිනාගැනීම, ගොඩනඟා ගැනීම සංස්කෘතික අරගලයකින් සිදු විය යුතුය. එවැනි යහපත් සංස්කෘතියක් සහිත සමාජයක් කුමන ලක්ෂණාවලින් සමන්විත විය යුතුද? ඒ පිළිබඳ ඇති වඩා පොදු පිළිගැනීම් මොනවාද?

ජාතිය, වාර්ගිකත්වය, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය, ආගම සහ වෙනත් අනන්‍යතාවයක් පිළිගැනීම සහ ඒවාට ගරු කිරීම, සියලු සමාජ අසමානතා දුරු කොට සමානව සැලකීම සහ සමාජ සාධාරණත්වය ගොඩනැඟීම සඳහා කටයුතු කිරීම, මිනිසුන් අතර අගතීන් අවම කිරීම සඳහා එකිනෙකා සතු අත්දැකීම් සහ දෘෂ්ටීන්ගේ විවිධතා තේරුම් ගැනීමට සහ ඉවසීමට හුරු වීම, අවශ්‍යතා ඇති අයට උපකාර කරන පුළුල් අවබෝධයන් ප්‍රවර්ධනය මඟින් දයානුකම්පිත සමාජයක් ගොඩනැඟීම, විවේචනාත්මක චින්තනය, ඉවසීම, විවිධ අදහස් සහ සාරධර්මවලට ගරු කිරීමට මඟ පෙන්වන අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම, අඛණ්ඩතාවය, විනිවිදභාවය සහ වගවීම සඳහා ප්‍රමුඛත්වය දෙන සදාචාරත්මක නායකත්වය දිරිමත් කිරීම මූලික කරුණ වේ.

එමෙන්ම සමාජයේ සාමූහිකත්වය සහ සහයෝගීත්වය ප්‍රවර්ධනය, මඟින් මුළු සංස්කෘතියේම ධනාත්මක වෙනස්කම්වලට මඟ පෑදෙන අතර ඒ සඳහා කටයුතු කිරීමද අපේක්ෂා කෙරේ. විවෘත හා ගෞරවණීය සංවාදයක් දිරිමත් කරන පරිසරයක් පෝෂණය කිරීම මඟින් සමාජය තුළ අවබෝධය සහ සහයෝගිතාවය සහ ප්‍රවර්ධනය සහ ඉදිරි දැක්ම හුවමාරුවට ඉඩ සැලසීම, නිරවද්‍යතාවය සහ සාධාරණත්වය අගය කරන මාධ්‍ය සම්ප්‍රදායක් දිරිගැන්වීම මඟින් විවේචනාත්මක චින්තනය සඳහා මඟ පෑදීම යන මේ සියල්ල යහපත් සංස්කෘතියක් ගොඩනැඟීම යන්නෙන් අදහස් වේ.

**සංස්කෘතික අරගලය හා අරගල සංස්කෘතිය**

බ්‍රිතාන්‍යයේ යටත්විජිතයක්ව

පැවති කොලනි 13කින් යුත් ඇමරිකා එක්සත් ජනදය 1775 වසරේදී බ්‍රිතාන්‍යයෙන් නිදහස් වීම සඳහා අරගලයක් දියත්කරන ලදී. එය 1784 දක්වා වසර 8 ක් ඇදී ගියේය. මේ අතර 1776 එක්සත් ජනපදයේ "නිදහස් ප්‍රකාශනය" ප්‍රකාශයට පත්කරන ලදී. ඇමරිකානු නිදහස් ප්‍රකාශනයටත් ඇමරිකානු විප්ලවයටත් වසර 100ක් පිරීම සිහිපත් කරමින් 1886 දී ලිබර්ටි ප්‍රතිමාව පිහිටුවන ලදී. මෙය ප්‍රංශය විසින් ඇමරිකා එක්සත් ජනපදය වෙනුවෙන් නිර්මාණය කොට දෙන ලද්දකි.

ලිබර්ටි ප්‍රතිමාව ලොව ප්‍රකට සංකේතයකි. පිළිමයේ දකුණු අතේ ඇති පන්දම ප්‍රබුද්ධත්වය සංකේතවත් කරයි. වම් අතෙහි ඇති පුවරුව මත රෝම ඉලක්කම් වලින් 1776 ජූලි 04 යන දිනය සටහන්ව ඇත. ප්‍රතිමාව නිදහසේ රෝම දේවතාවිය වන "ලිබර්ටාස්" නියෝජනය කරයි. ඇගේ පාමුල කැඩී ගිය දම්වැල්වලින් නියෝජනය කරන්නේ කුරිරු පාලනයේ සහ පීඩනයේ දම්වැල් බිඳී යාමයි.

යම් ජන ප්‍රජාවක් ප්‍රබුද්ධත්වයෙන් පුරවාලන්නේ නම්, යටත්වැසි බවින්, වහල් බවින් මිදෙන්නේනම් එය එම සමාජය අත්කරගන්නේ මහා සංස්කෘතික ජයග්‍රහණයකි. ලිබර්ටි ප්‍රතිමාව යනු ඇමරිකා එක්සත් ජනපදයේ එම ජයග්‍රහණයන්ගේ සංකේතය වෙයි. එහෙත් ඊට පසුබිම වූයේ ඇමරිකානු විප්ලවයයි.

බොහෝවිට අප යහපත් සංස්කෘතියක් සඳහා වන අරගල ලෙස සලකන්නට හුරු වී ඇත්තේ විවිධ කලා මාධ්‍යයන් හරහා කරන මැදිහත්වීම්ය. එහෙත් ඒ බොහෝ කලා නිර්මාණයන් ප්‍රභවය වී ඇත්තේද වඩා යහපත් සමාජයක්, සංස්කෘතියක් අපේක්ෂාවෙන් මිනිසුන් මහපොළොව මත කරන ලද අරගලයන් තුළිනි.

ඇමරිකානු විප්ලවය ඇමරිකා එක්සත් ජනපදයට පමණක් නොව මුළුමහත් ලෝක සංස්කෘතියේම වෙනස් කිරීමකට ඉවහල් වූ අරගලයක් ලෙස සැලකේ. 1776 විප්ලවයෙන් බිහිවූ එක්සත් ජනපද නව ජාතියේ දේශපාලනික දාර්ශනික පරමාදර්ශ හැඩගැස්වීමේදී ඇමරිකානු විප්ලවය නිර්මාණාත්මක කාර්යභාරයක් ඉටු කළේය. රාජාණ්ඩුව ප්‍රතික්ෂප කිරීම සහ ජනරජ ආණ්ඩුවක් පිහිටුවීම ඇමරිකානු දේශපාලන චින්තනයේ පදනම විය. නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ සංකල්පය සහ ආණ්ඩු ඔවුන්ගේ නීත්‍යානුකූලභාවය ලබාගත්තේ "ජනතාවගේ කැමැත්තෙන්ය" යන අදහස ඇමරිකානු දේශපාලන සංස්කෘතියේ කේන්ද්‍රය විය. විප්ලවය පුද්ගල අයිතිවාසිකම් සහ නිදහසේ වැදගත්කම අවධාරණය කළේය. "ඇමරිකානු නිදහස් ප්‍රකාශනය" සියලු මිනිසුන් සමාන ලෙස නිර්මාණය කර ඇති අතර අහිමි කළ නොහැකි අයිතිවාසිකම්වලින් සමන්විත බව අවධාරණය කළේය. මෙම අදහස ඇමරිකානු සංස්කෘතියට ගැඹුරු බලපෑමක් ඇති කළේය. බ්‍රිතාන්‍ය යටත්විජිත අතීතයෙන් වෙන්ව ස්ථානගත වීමට බ්‍රිතාන්‍යට එරෙහිව ඇති වූ දේශප්‍රේමී යුද්ධය ඉවහල් වීය.

ඇමරිකානු විප්ලවය ලොව අනෙකුත් ස්වාධීන සහ විප්ලවීය ව්‍යාපාරයන්ට ආස්වාදය දෙමින් ගෝලීය බලපෑමක් ඇති කළේය. නිදහස, සමානාත්මතාවය සහ ස්වයං තීරණය පිළිබඳ පරමාදර්ශ යුරෝපයේ, ලතින් ඇමරිකාවේ සහ ලෝකයේ අනෙකුත් ප්‍රදේශවලද දේශපාලන හා සංස්කෘතික වර්ධනයට මඟපෑදීය. ඇමරිකානු විප්ලවයේද ආදර්ශය සහ බලපෑම සහිතව 1789 වසරේදී ප්‍රංශ විප්ලවය සිදුවිය. එතෙක් ප්‍රංශ සංස්කෘතියේ පැවති ප්‍රභූ පැලැන්තියේ සහ රාජාණ්ඩුවේ සංස්කෘතික ආධිපත්‍යයෙන් ප්‍රංශ සමාජය බිඳී යාම සිදුවිය; නිදහස, සමානාත්මතාවය සහ සහෝදරත්වය යන විප්ලවවාදී සටන් පාඨය ලොව පුරා රැලි නගා ව්‍යාප්ත විය; සමානාත්මතාවය පිළිබඳ සාකච්ඡා ස්ත්‍රී පුරුෂ සමාජභාවී භූමිකාවන් දක්වා ව්‍යාප්ත විය.

මේ ආකාරයෙන්ම හෝ ඊටත් වැඩියෙන් ලෝක සංස්කෘතියට බලපෑම් කළ අරගලයක් වශයෙන් පැරිස් කොමියුනය පෙන්වා දිය හැක. එය අත්හදා බැලීමේ සහ නිර්මාණශීලීත්වයේ ආත්මීය ලක්ෂණයන්ගෙන් සමන්විත විප්ලවයක් ලෙස සැලකේ. ප්‍රංශ මිලිටරිවාදයේ සහ ඒකාධිපති පාලනයේ සංකේතයක් වශයෙන් සලකනු ලැබූ වෙන්ඩෝම් කුළුණ පෙරළීම වැනි සංකේතාත්මක ක්‍රියාවන් කොමියුන සාමාජිකයින් අතින් සිදුවිය.

1917 රුසියානු විප්ලවය මඟින් ඇති කරන ලද සංස්කෘතික ප්‍රබෝධය රුසියානු සමාජය ගව් ගණනාවකින් ඉහළට ඔසවා තබන ලදී. යහපත් සංස්කෘතියක් ගොඩනැගීමට රුසියානු විප්ලවයේ දායකත්වය කිසිවෙකුට අමතක කළ නොහැක. රුසියානු විප්ලවය සෝවියට් සමාජය පිම්මකින් අභ්‍යවකාශ යුගයක් කරා රැගෙන යන ලදී. ඒ අතරතුර සමාජ සංස්කෘතියේ සෑම අංශයක්ම ඉහළට ඔසවා තැබිණි. ලිවීමට හෝඩියක් නොමැතිව සිටි කිර්ගීසියානු ජනයා වෙනුවෙන්

හෝඩියක් නිර්මාණය විය. ඉන් අකුරු උගත් චින්ගීස් අයිත්මාතව් වැනි ලේඛකයෝ ලෝක සාහිත්‍යට තම කෘතීන් එකතු කළෝය. සත්තකින්ම මුළු සෝවියට් දේශය පුරාම අධ්‍යාපනය ඉහළට ගෙන ඒම මඟින් මහා සංස්කෘතික ජයග්‍රහණයන් රාශියක් අත්පත් කරගැණිනි. රුසියානු විප්ලවය සෙවණේ වැඩුණු සමාජ සත්තා යථාර්ථවාදී කලා සම්ප්‍රදාය සහ එයින් බිහි කරන ලද නිර්මාණ ප්‍රමාණය ඉතා විශාලය.


ඉහත සියලු සමාජ විප්ලවයන් අපට සලකන්නට වන්නේ යහපත් සංස්කෘතියක් සඳහා වන මිනිසාගේ අනවරත අරගලයේම කොටස් ලෙසයි. යහපත් සංස්කෘතියක් සඳහා වන මිනිසාගේ අරගල ගොන්නට වැටෙන්නේ මේ සමාජ අරගල පමණක් ද නොවේ. ඔව්හු විසින් විද්‍යා, තාක්ෂණික ක්ෂේත්‍ර තුළ පර්යේෂණ කරමින් සිදු කරන විවිධ සොයාගැනීම් සහ නිර්මාණයන්ද වැටෙන්නේ මේ යහපත් සංස්කෘතියක් සඳහා වන අරගල තුළටමය.

1913 අප්‍රේල් 21 වී.අයි. ලෙනින් "විශිෂ්ට තාක්ෂණික ජයග්‍රහණයක්" යනුවෙන් ප්‍රව්දා පුවත්පතට ලිපියක් ලියයි. ඉන් කියවෙන්නේ ලෝක ප්‍රකට රසායන විද්‍යාඥයෙකු වූ විලියම් රැම්සේ විසින් ගල් අඟුරුවලින් ගෑස් ලබාගැනීමේ ක්‍රමයක් සංවර්ධනය කිරීම පිළිබඳවය. මෙම සොයාගැනීම සමාජ සංස්කෘතියේ වර්ධනයට ලබාදෙන දායකත්වය ගැන ලෙනින් පවසන්නේ ඉතා උද්යෝග යකිනි. "සෑම නිවෙසකම විදුලි ආලෝකය සහ උණුසුම මඟින් මිලියන ගණනක් "ගෘහස්ථ වහලුන්" ඔවුන්ගේ ජීවිතවලින් හතරෙන් තුනක් දුගඳ හමන කුස්සියේ ගත කිරීමේ අවශ්‍යතාවයෙන් මිදෙනු ඇත" යනුවෙන් ලෙනින් ලියයි.

මේ නව සොයාගැනීම් විද්‍යා පර්යේෂණ යහපත් සංස්කෘතියක් සඳහා වන අරගලයේම කොටස් නොවේද?

**සංස්කෘතික අරගලයේ මාධ්‍යය**

යම් සමාජයක් ජාතිවාදයෙන්, ආගම්වාදයෙන්, කුලවාදයෙන් ඔද්දල් වී ඇත්නම්, එය යහපත් සමාජයක් හෝ යහපත් සංස්කෘතියක් ඇති සමාජයක් නොවේ. පංති විෂමතාවයන් වර්ධනයවී දුප්පතුන්, වීදි දරුවන්, හිඟන්නන්, ගැට කපන්නන්ගේ සහ කුලියට මිනී මරන්නන්ගෙන් පිරුණු සමාජයක් යහපත් සමාජයක් හෝ යහපත් සංස්කෘතියක් නියෝජනය නොකරයි. හොරුන්, තක්කඩීන්, නායකයින් බවට පත් වූ සමාජයක් යහපත් දේශපාලන සංස්කෘතියක් ඇති සමාජයක් නොවේ. මිනිසුන් වහලුන් ලෙස සලකන, ස්ත්‍රීන් පීඩනයට ලක්කරන සමාජයක් යහපත් සංස්කෘතියක් ඇති සමාජයක් නොවේ. විවේචනාත්මක චින්තනයක්, දැක්මක් නැති සමාජයක්, එකිනෙකා නොඉවසන, විවිධ අදහස් නොඉවසන විවිධ අනන්‍යතා නොපිළිගන්නා සමාජයක්, අධ්‍යාපනය දුර්වල වූ



මිනිසුන්ගෙන් පිරුණු සමාජයක් යහපත් සංස්කෘතියක් ඇති සමාජයක් නොවේ. ඒවා අප විසින් ජයග්‍රහණය කළ යුතුව ඇත. උසස් සංස්කෘතික සමාජයක් ගොඩනැගිය හැක්කේ එවිටය. එය අරගලයකි. මිනිසා ඒ වෙනුවෙන් අනවරත අරගලයක යෙදේ. ඒ සඳහා ඔහු විවිධ මාධ්‍ය භාවිතා කරයි.

අප මෙම ලිපිය ආරම්භ කළේ යුද්ධයට එරෙහි ලෝක ප්‍රකට සිදුවීමක් වන පැබ්ලෝ පිකාසෝගේ "ගුවර්නිකා" පිළිබඳ සටහනකිනි. යුද්ධයට එරෙහි කලාව, විසම්මුතිය ප්‍රකාශ කිරීමේ යුද ගැටුම්හි මානව පිරිවැය ප්‍රකාශ කිරීමේ, සාමය සඳහා වන මිනිසුන්ගේ අභිලාෂය ප්‍රකාශයට පත්කිරීමේ ප්‍රබල මාධ්‍යයකි. විවිධ කලාකරුවෝ විවිධ මාධ්‍යයන් මගින් යුද්ධයේ විනාශකාරී ස්වභාවයට විරෝධය දැක්වීම සඳහා ඔවුන්ගේ නිර්මාණශීලීත්වය භාවිත කොට ඇත. සාහිත්‍ය, කාව්‍ය, දෘෂ්‍ය කලා, නාට්‍ය සහ චිත්‍රපට රාශියක් මේ වෙනුවෙන් බිහි වී ඇත.

පැබ්ලෝ පිකාසෝ විසින්ම තවත් යුද විරෝධී සිතුවම් ගණනාවක් ඇඳ ඇත. 1937 වසරේදීම ඔහු විසින් ඇඳින ලද "වැලපෙන කාන්තාව" (The weeping women) නම් චිත්‍රයද සැලකෙන්නේ යුද විරෝධී චිත්‍ර ගණයටය. 1951 ඇඳින ලද කොරියාවේ සමූලඝාතනයද (Massacare in Korea) ඊට අයත්ය.

ෆ්‍රැන්සිස්කෝ ගෝයා විසින් ඇඳින ලද "1808 මැයි තුන්වෙනිදා" නම් චිත්‍රයද යුද්ධයේ කුරිරු බව පෙන්වන ලෝක ප්‍රකට චිත්‍රයක් ලෙස සැලකේ. පැබ්ලෝ පිකාසෝ වැනි කලාකරුවන්ට ඔවුන්ගේ නිර්මාණ සඳහාද ගෝයා සහ ඔහුගේ චිත්‍රකලාව බල පා ඇති බව සැලකේ.

විශේෂයෙන්ම පළමු හා දෙවන ලෝක යුද්ධයෙන් සහ ෆැසිස්ට් මතවාදයෙන් ආසාධිත වූ ලෝකය එයට එරෙහි නිර්මාණ රාශියක් ඉදිරිපත් කළේය. චාලි චැප්ලින්ගේ Great dictator යුද්ධයටත් - ෆැසිස්ට්වාදයටත් මෙන්ම හිට්ලර් - මුසලෝනි චරිත ස්වභාවයටත් තදින් පහර දෙන චිත්‍රපටයකි.

**යහපත් මානව සමාජයක්, යහපත් සංස්කෘතියක් ගොඩනැගීමෙහිලා මිනිසාට ඇති ප්‍රධානතම බාධකය වන්නේ සමාජ අසමානතාවයයි. එහි අරම්භක හේතුව දේපළ බෙදීයාමේ විෂමතාවයෙන් හටගනී. එය ශ්‍රම සූරාකෑම හේතුවෙන් සිදු වේ.**

ස්ටීවන් ස්පිල්බර්ගේ ෂින්ඩ්ලර්ස් ලිස්ට් (Schindler's List) යුදෙව් ජනයා සංහාරය කිරීමට කටයුතු කරන නාසි ජර්මන් අරමුණෙහි බිහිසුණු බව පෙන්වන චිත්‍රපටයකි. මිනිසුන් එකිනෙකාට කළ හැකි ඇදහිය නොහැකි තරම් වන හොඳ සහ නරක මොනවාද යන්න සැමදා මතක් කරන චිත්‍රපටයකි. ස්පිල්බර්ග් විසින්ම අධ්‍යක්ෂණය කළ Saving Private Ryan යන යුද්ධයේ බිහිසුණු බව පෙන්වන තවත් ලෝ ප්‍රකට චිත්‍රපටයකි.

"යුද්ධය හා සාමය" ලියෝ ටෝල්ස්ටෝයි විසින් 1869 ලියා ප්‍රසිද්ධ කරන ලද කෘතියකි. මෙම කෘතිය තුළ රුසියාවේ නැපෝලියන් යුගය විස්තර කරයි. රුසියාවට සිදු වූ නැපෝලියන් ආක්‍රමණ හා එහි සිදුවීම් පදනම් කර ගනිමින් කතාව ගොඩනැගී ඇත. එය යුද්ධය හා සාමය පිළිබඳ ඉතා පුළුල් අදහසක් ගොඩනගයි. ටෝල්ස්ටෝයිට අනුව සාමය යනු යුද්ධය නොමැතිකම පමණක් නොව මිනිසුන්, ප්‍රජාවන් සහ ජාතීන් අතර සතුරුකම් නොමැතිකමද වේ. ඔහු තම කතාව තුළ ජාතීන් අතර යුද්ධය, ආයතන අතර යුද්ධය, පංති අතර යුද්ධය, පවුල් අතර යුද්ධය, පුද්ගලයින් අතර යුද්ධය සහ තමා තුළම සිදුවන අභ්‍යන්තර යුද්ධය ආදී ලෙස යුද්ධය පිළිබඳ පුළුල් දැක්මක් කරා පාඨකයා ගෙන යනු ලබයි. එය ලෝකයේ විශිෂ්ට කෘතියක් බවට පත්වන්නේ එබැවිනි.

බෲනෝ ආපිට්ස් විසින් රචිත "වෘකයින් අතර නග්නව" සහ "ඈන් ෆ්‍රෑන්ක්ගේ දිනපොත" අපට යුද්ධයෙහි ඇති කුරිරු බව පෙන්වා දෙමින් සාමයෙන් පිරුණු සමාජයක වුවමනාව, ඒ සඳහා කැපවීමෙන් වැඩ කරන මිනිසුන්ගේ අගය අපට පෙන්වා දෙයි.

යහපත් මානව සමාජයක්, යහපත් සංස්කෘතියක් ගොඩනැගීමෙහිලා මිනිසාට ඇති ප්‍රධානතම බාධකය වන්නේ සමාජ අසමානතාවයයි. එහි ආරම්භක හේතුව දේපළ බෙදීයාමේ විෂමතාවයෙන් හටගනී. එය ශ්‍රම සූරාකෑම හේතුවෙන් සිදු වේ.

1859 චාල්ස් ඩිකන්ස් විසින් රචිත "Tale of two cities" දෙනුවර අන්දරය නමින් සිංහලට පරිවර්තනය වී ඇත. යුරෝපීය අග නගර දෙකක් වන පැරීසිය සහ ලන්ඩනය අතර වෙනස, සමාජ අසමානතාව පෙන්වා දෙන මෙම කතාවේ පංති ගැටුම සහ එළඹෙන ප්‍රංශ විප්ලවය පුරෝකතනය

කරන්නකි.

වික්ටර් හියුගෝගේ "Les Miserables" 1862 වසරේ රචිත එකකි. එය මනුතාපය නමින් සිංහලට පෙරළා ඇත. ප්‍රංශ විප්ලවයත් පැරිස් කොමියුනයත් අතර ප්‍රංශ සමාජය පසුබිම් කරගත් මෙම කතාව මගින්ද පංති විෂමතාව හා එහි දුක්ඛිත බව මනා සේ පැහැදිලි කරයි. ධනවාදය දුප්පතුන්ට ශ්‍රමය පමණක් නොව සිරුර පවා විකුණන්නට බල කරන ආකාරය ඉන් පෙන්වයි.

1939 ජෝන් ස්ටෙයින්බෙක් විසින් රචිත "The Grapes of Wrath" පංති විෂමතාවය, සූරාකෑම, ධනවාදයේ අර්බුදය පෙන්වන කෘතියකි. "වෛරයේ මිදිඵල" නමින් මෙම කෘතිය සිංහලයට පරිවර්තනය කර ඇත. කතාවේ අවසානයේ ස්ටෙයින්බෙක් එක් අපූරු අත්දැකීමක් අපට මුණගස්වයි. තම දරුවා මිය ගිය මවක්, තමාට එරෙන කිරි කුසගින්නේ මිය යමින් සිටින මිනිසෙකුට දී ඔහු ජීවත් කරවයි. එම සිදුවීම මඟින් මහඟු මිනිස් ගුණයක් ස්ටෙයින්බෙක් ඔසවා තබයි. ඉතාමත්ම දුෂ්කර තත්වයක් තුළ පවා මිනිසුන් එම ගුණයන් රැකගන්නා බවට හැඟීමක්, විශ්වාසයක් මෙම කෘතිය පාඨකයා තුළට ගෙන යයි. පීටර් පෝල් රූබෙන්ස් 1630දී සිමොන් සහ පෙරෝ (Cimon and Pero) නමින් අඳින ලද චිත්‍රයද මෙවැනි අත්දැකීමක් චිත්‍රයට නැඟීමකි. කුසගින්නේ මියයාමට සලස්වන ලද මිනිසෙකුව ඔහුගේ දියණිය විසින් තම මව්කිරි දී රැක ගනියි.

Modern Times 1936 වසරේ චාලි චැප්ලින් විසින් ලියන, අධ්‍යක්ෂණය කොට නිෂ්පාදනය කළ චිත්‍රපටියකි. අද දක්වාත් රසිකයින් අතර ජනප්‍රිය එය ධනවාදයේ අමානුෂික බව, පංති ගැටුම, පරාරෝපණය ආදී සංකල්පයන් රාශියක් සාකච්ඡාවට ගෙන එන, එළිදරව් කරන චිත්‍රපටියකි.

1852 හැරියට් බීචර් ස්ටෝව් විසින් රචිත "Uncle Tom's Cabin" "ටොම් මාමාගේ කුටිය" නමින් සිංහල බසට පරිවර්තනය කොට ඇත. එය නූතන වහල්භාවයට එරෙහිව ජන මතයක් ගොඩනැඟීමෙහිලා විශාල මෙහෙයක් කළ කෘතියක් ලෙස සැලකේ. වහල්භාවයට ගත් ටොම් මාමා විසින් කියන කතාව මඟින් වහල්භාවයේ ඇති කටුක යථාර්ථය මතු කරයි.

හොවාඩ් ෆාස්ට් නම් ඇමරිකානු ලේඛකයා 1951 වසරේදී "ස්පාටකස්" නම් ඓතිහාසික නවකතාව රචනා කරයි. ස්පාටකස් යනු ක්‍රි.පූ. 103 - 71 කාලයේ සිටි වහල් නායකයෙකි. ඔහු වහල් ක්‍රමයට එරෙහිව මහා වහල් නැගිටීමක් සංවිධානය කරයි. රෝමය දස දහස් ගණනක් වහල් ජනයා ක්‍රෑර වධයට ලක්කොට මරා, මෙම අරගලය විනාශ කර දමයි.

මෙම සිදුවීම පදනම් කරගනිමින් හොවාඩ් ෆාස්ට් රචනා කරන ස්පාටකස් කෘතිය මඟින් වහල් බවේ කුරිරු ම්ලේච්ඡ ස්වභාවය මැනවින් නිරූපණය කරයි. සත්තකින්ම ඒ මඟින් විවේචනයට ලක් කරන්නේ ලාභය මත පදනම් වූ වත්මන් ධනේශ්වර සමාජයයි.

ඉන්දියාවත්, පාකිස්ථානයත්, බංගලාදේශයත් අද රටවල් තුනක් වුවද 1947ට කලින් එක රටක්ව පැවතියේය. හින්දු සහ මුස්ලිම් භේදය මත පළමුව පාකිස්ථානය ඉන්දියාවෙන් වෙන්ව ගිය අතර භාෂා ප්‍රශ්නය මත පාකිස්ථානයෙන් බංගලාදේශය වෙන්ව ගියේය. මේ වෙනස්වීම් හේතුවෙන් ඉන්දියාව තුළ ඇති වූ කම්පනය තවමත් අවසන්ව නැත. එමෙන්ම ජාතිවාදය සහ ආගම්වාදය පදනම් කරගනිමින් ඇතිවන ගැටුම්ද තවමත් අවසන්ව නැත.

මේ සම්බන්ධයෙන් ලියැවුණු ඉතාමත් දීප්තිමත්, විශාල පිළිගැනීමකට ලක් වූ කෘතියක් ලෙස කුෂ්වන්ත් සිං විසින් රචිත "Train to Pakistan" පෙන්වා දිය හැකිය. එය චිත්‍රපටියටද නැඟී ඇති අතර "අන්තිම දුම්රිය" නමින් සිංහලයටද පරිවර්තනය කර ඇත.

චමන් නහල් විසින් 1975 වසරේ රචිත අසාධි "Asadi" නම් නවකතාවද ඉන්දියාවෙන් පාකිස්ථානය වෙන්වීම පිළිබඳ කතාව ඉහත සංවේදී ලෙස ඉදිරිපත් කරයි. "ගින්නෙන් උපන් දරුවෝ" ලෙස එය සිංහලට පරිවර්තනය කර ඇත."බොම්බේ" චිත්‍රපටය මනිරත්නම් විසින් අධ්‍යක්ෂණය කරන ලද ආගම්වාදය ප්‍රශ්න කිරීමට ලක් කරන චිත්‍රපටයකි. අපර්ණා සෙන් විසින් 2002 ලියා අධ්‍යක්ෂණය කරන ලද " Mr and Mrs Iyar" ද එවැනිම හින්දු මුස්ලිම් විරසකභාවය සියුම් ලෙස ප්‍රශ්න කරන මානව ප්‍රේමය ඔසවා තබන සිනමා කෘතියකි.

1994 වන විට රුවන්ඩාව පාලනය කළේ හුටු ගෝත්‍රය මූලිකත්වය ගත් ආණ්ඩුවකිනි. රුවන්ඩාවේ ජීවත්වන හුටු සහ ටුට්සි ගෝත්‍රික දෙපිරිස අතර පැවති ගැටුම 1994 වනවිට උත්සන්නභාවයට පත් වූ අතර සන්නද්ධ හුටු මිලිටරිය මඟින් ටුට්සි ගෝත්‍රික ජනයා ලක්ෂ 05ක් 08ක් අතර ප්‍රමාණයක් මරා දමා ඇතැයි අනුමාන කෙරේ. මෙම සිවිල් යුද්ධය පදනම් කරගනිමින් ටෙරී ජෝර්ජ් අධ්‍යක්ෂණය කළ චිත්‍රපටයකි, "Hotel Ruwanda" මෙම සිවිල් යුද්ධයට මුහුණ දෙන

හුටු සම්භවයක් සහිත සැමියා සහ ටුට්සි ජාතික බිරිඳක් හා ඔවුන්ගේ දරුවන් පිළිබඳ ගෙතුණු කතාවක් "හොටෙල් රුවන්ඩා" මඟින් දිගහැරේ. මෙය සත්‍ය කතාවක් බව පැවසේ.

ලංකාව ජාතිවාදය පදනම් කරගත් යුද්ධයකින් වසර 30 ක් පමණ පීඩා වින්දේය. මෙම ගැටුම යුද ගැටුමක් ලෙස මතු වීමට පෙරම සිංහල, දෙමළ ජනයා අතර ආතතිය වැඩෙමින් තිබුණි. වැඩෙමින් පවතින මෙම තත්වය පදනම් කරගනිමින් මහාචාර්ය සුනිල් ආරියරත්න 1979 වසරේ "සරුංගලේ" චිත්‍රපටය අධ්‍යක්ෂණය කරන ලදී. එය යුද්ධය වෙනුවට සිංහල දෙමළ ජනයා අතර සහෝදරත්වය ඉල්ලා සිටි කෘතියකි. මෙම යුද ගැටුම මතුවන්නට පෙර සහ යුද්ධය පැවති කාලයේද, යුද්ධයෙන් පසු කාලයේද සිංහල දෙමළ සහ මුස්ලිම් ජනයා අතර ජාතිවාදය පදනම් කර ගනිමින් පැවති යුද ගැටුමට එරෙහිව කලා නිර්මාණ රාශියක් සිදු විය. "මාතා", "පුරහඳ කළුවර", "සෙල්වම්", "මේ මගේ සඳයි", "අලිමංකඩ" එසේ නිර්මාණය වූ චිත්‍රපට කිහිපයකි. මේ කලා නිර්මාණ බොහොමයක් යුද්ධය සහ ජාතිවාදය යටින් ඇති අමානුෂික හරය එළියට ගෙන ආවේය. "නැගෙනහිර වෙරළෙන් ඇසෙන" වැනි ටෙලි නාට්‍ය මගින්ද මෙම ගැටලුව සාකච්ඡාවට ගැනුණි.

ලාංකීය ගීත සාහිත්‍යද ජාතිවාදය හා ආගම්වාදයට එරෙහි ගීත රාශියකින් පිරී තිබේ.

අපි ඉහතින් සඳහන් කොට ඇති යහපත් සංස්කෘතියක් සඳහා වන ගුණාංගයන් දිනාගැනීම සඳහා ලෝකය පුරා මිනිස්සු අරගල කරමින් සිටිති. සමාජ ක්‍රමයක ඇති අසාධාරණ පීඩාකාරී ස්වභාවයට එරෙහිව මහමඟට බැසි මිනිසුන් විසින් කරන ලද අරගලයන්ගෙන්ද, සමාජ විප්ලවයන්ගෙන්ද මේ යහපත් සංස්කෘතියක් සඳහා වන මිනිසුන්ගේ අනවරත අරගලය පිරී ඇත. විද්‍යාගාර තුළ පර්යේෂණාගාර තුළ මානව සමාජයට යහපත් වූ දේ සොයාගැනීම සඳහා සිදුකෙරෙන පර්යේෂණයන්ගෙන්ද මේ අරගලය පිරී ඇත. වැඩබිම් තුළ, ගොවිබිම් තුළ මිනිසුන් විසින් නිෂ්පාදනයේ යෙදෙමින් කරන මැදිහත්වීම්වලින්ද මේ අරගලය පිරී ඇත. විවිධාකාර වූ සාහිත්‍ය කලා නිර්මාණ මගින් කරන මැදිහත්වීම්වලින්ද යහපත් සංස්කෘතියක් සඳහා මිනිසාගේ අනවරත අරගලය පිරී ඇත. අප ඉහතින් සාකච්ඡා කොට ඇත්තේ ඒ සඳහා වන උදාහරණ කිහිපයක් පමණි.





# නව සංස්කෘතිමය සමාජයක් කරා...


*නිහාල් වීරසූරිය*

මේ වනවිට ශ්‍රී ලංකාව තුළ නව ලිබරල්වාදී ආර්ථිකයත් ඊට අනුකූල සමාජ චින්තනයත්, පසුගාමී සංවර්ධනයත් විසින් අතිශය බරපතළ සංස්කෘතිකමය පරිහානියකට මඟ සලසා තිබේ. ඒ අනුව ලංකාව ආර්ථික වශයෙන්, සමාජීය වශයෙන් මෙන්ම සංස්කෘක වශයෙන්ද පිරිහුනු, සෝදා පාළුවට ලක්වුනු රටක් බවට පත්ව තිබේ.

මෙහි ආරම්භක ලිපි කිහිපයක් මඟින්ම වත්මන් සංස්කෘතික පරිහානියේ ස්වභාවයත්, එහි ප්‍රමාණයත්, එයට බලපා ඇති සාධකත් සාකච්ඡා කරනු ලැබ තිබේ.

ඉන් තේරුම් ගත යුතු කරුණ නම් කිසියම් රටක පවත්නා සංස්කෘතියේ ස්වභාවය හා එහි පිරිහීම සඳහා එම රටේ පවත්නා ආර්ථික ක්‍රමයත්, ඒ මත නිර්මාණය වන සමාජමය ආකල්ප හා මතවාදයනුත් ඍජු ලෙස බලපාන බවයි. මුදල් ඉපයීම ජීවිතයේ පරම අරමුණ ලෙස අර්ථකතනය කළ, ලාභය සඳහාම කටයුතු කරන, ඒ හමුවේ මානව බැඳීම්, සමාජ සාධාරණත්වයේ කොන්දේසි, අමු අමුවේ බිඳ දමන සමාජයක, ක්‍රීඩාව පවා වාණිජකරණය කොට, බුකිකරුවන්ගේ ඔට්ටු අල්ලන්නන්ගේ ගොදුරක් බවට පත්කළ සමාජයක, කලාව ප්‍රාග්ධන හිමියන් කිහිපදෙනෙක් අතට ගෙන පාලනය කරන සමාජයක සංස්කෘතිය සෝදාපාළුවට ලක්වීම පුදුමයක් නොවේ.

**ඕනෑම රටක සංස්කෘතිය එම රටේ ඒ මොහොතේ ක්‍රියාවට නැගෙන ආර්ථික ක්‍රමයෙන් හා දේශපාලන චින්තනයෙන් වියුක්තව පවතින්නේ නැත. ඒ නිසාම රටක සංස්කෘතිය නිර්මාණය කිරීමේලා ප්‍රබලතම බලපෑම කරන ආර්ථික ක්‍රමයත් දේශපාලනයත් වෙනස් නොකර සංස්කෘතිය පමණක් වියුක්තව ගෙන වෙනස් කළ**



**හැමදේම විකිණීමට හා මිලදී ගැනීමට හැකි වෙළඳපොළක්ද එහි දේවල් මිලදී ගන්නා ලෙස මිනිසුන්ට බලකරන වෙළඳ දැන්වීම් යුද්ධයක්ද නිර්මාණය කර තිබේ. එහි අවසන් ප්‍රතිඵලය වී තිබෙන්නේ අධි පරිභෝජනවාදී මනසක් සහිත ප්‍රජාවක් නිර්මාණය කිරීමය. වෙළඳපොළ තුළ භාණ්ඩ තිබුණද, ඒවා මිලදී ගන්නා ලෙස විවිධ ක්‍රම මගින් ජනමතයට මිලක් ලද, භාණ්ඩ මිලදී ගැනීමේ ආශාවෙන් ජනතාව පෙළුනද ඊට හරස්වන ගැටලුවක් තිබේ. ඒ අතේ මුදල් නැතිකමය. වත්කම් නැතිකමය. එවිට භාණ්ඩ මිලදී ගැනීම සඳහා කෙසේ හෝ මුදල් ඉපයීමේ මානසිකත්වයක් සමාජය තුළ ක්‍රමානුකූලව ගොඩනගනු ලැබේ.**

**හැකි වන්නේ නැත. සත්‍යය එයයි.**

සමාජයට කොතරම් හොඳ-නරක පිළිබඳ දේශනා පැවැත්වුවත්, සමාජයේ ජීවිතය ගැටගැසී ඇත්තේ ඊට ප්‍රතිවිරෝධී අරමුණු සමග නම්, දේශනාවලින් පමණක් හොඳ-නරක කියාදීමෙන් පමණක් සංස්කෘතිය වෙනස් කළ හැකි වන්නේ නැත.

ලංකාවේ සමාජය දෙස බලන්න. දැන් වසර 45කට වැඩි කාලයක් තිස්සේ වෙළඳපොළ විසින් හසුරුවන මිනිසෙක් නිර්මාණය කර තිබේ. හැමදේම විකිණීමට හා මිලදී ගැනීමට හැකි වෙළඳපොළක්ද එහි දේවල් මිලදී ගන්නා ලෙස මිනිසුන්ට බලකරන වෙළඳ දැන්වීම් යුද්ධයක්ද නිර්මාණය කර තිබේ. එහි අවසන් ප්‍රතිඵලය වී තිබෙන්නේ අධි පරිභෝජනවාදී මනසක් සහිත ප්‍රජාවක් නිර්මාණය කිරීමය. වෙළඳපොළ තුළ භාණ්ඩ තිබුණද, ඒවා මිලදී ගන්නා ලෙස විවිධ ක්‍රම මගින් ජන මනසට බල කළද, භාණ්ඩ මිලදී ගැනීමේ ආශාවෙන් ජනතාව පෙළුනද ඊට හරස්වන ගැටලුවක් තිබේ. ඒ අතේ මුදල් නැතිකමය. වත්කම් නැතිකමය. එවිට භාණ්ඩ මිලදී ගැනීම සඳහා කෙසේ හෝ මුදල් ඉපයීමේ මානසිකත්වයක් සමාජය තුළ ක්‍රමානුකූලව ගොඩනගනු ලැබේ. එවිට වංචා, දූෂණ, රැවටීම්, කොල්ලකෑම් ආදී සියලු දුර්ගුණයන් සමාජය තුළ මතුවේ. හැමදේකම මිල පමණක් හිතන වටිනාකම නොසලකන චින්තනයක් නිර්මාණය වේ.

නුවරඑළියේ තැපැල් කාර්යාලයේ වටිනාකම නොව එහි මිල ගැන පමණක් සිතන ජනාධිපතිවරයාගේ සිට මේ ප්‍රවණතාවය පහළට ගලා එයි. පවතින සංස්කෘතික පරිහානිය වෙනස් කිරීමට නම් එම තත්වය නිවැරදිව අවබෝධ කර ගත යුතුම වේ.

වඩා දියුණු මානවවාදී සංස්කෘතියක් නිර්මාණය කර ගැනීම සඳහා කල්පනා කරන අය ඒ සඳහා මානව සංස්කෘතිය වෙනස් වෙමින් ආ එහි ඉතිහාසය පිළිබඳ සරල හෝ අවබෝධයක් ලබා ගත යුතු වේ. ලෝකයේ විවිධ රටවල, විවිධ භූගෝලීය කලාපවල සංස්කෘතික ලක්ෂණ සමාන නැත. වෙනස්කම් පවතී. එකම රටේ පවා කාලය අනුව සංස්කෘතියේ වෙනස්කම් සිදුවේ. මේ වෙනස්කම් සඳහා බලපාන ප්‍රධාන සාධක දෙකක් තිබේ. එම සාධක දෙක නම් ඒ ඒ රටවල භූගෝලීය පරසරයේ ඇති වෙනස්කම් හා ඒ ඒ රට සමාජ සංවර්ධනයේ සිටිනා මට්ටමය. එනම් නිෂ්පාදන බලවේග යන්ගේ සංවර්ධනයේ මට්ටම හා ඒ අනුව බිහිවන ආර්ථික රටාවේ ස්වභාවය වේ.

මිනිස් සමාජය පදනම් වී තිබෙන්නේ නිෂ්පාදනය මතය. ඈත අතීතයේ ඉතාම නොදියුණු උපකරණ සහිතව සිටි මිනිසා නිපදවනු ලැබුවේ පරිභෝජනය සඳහාය. ඒ අනුව එම නිෂ්පාදන භාණ්ඩ පරිභෝජන භාණ්ඩ විය. එවිට එම යුගයේ සංස්කෘතිය ගොඩනැගුණේ එම නිෂ්පාදන ක්‍රමයට ගැලපෙන ලෙසය. ගෝත්‍රික ජනයා දඩයමේ ගොස් සතෙකු මරා ගත්හ. එය ඔවුන්ගේ නිෂ්පාදනය විය. ඉන්පසු ගෝත්‍රයේ සියලු දෙනා එක්වී එය ආහාරයට ගත්හ. ඒ නිසාම දඩයම තුළ සාමූහිකත්වය පැවති අතර පරිභෝජනය තුළද පැවතියේ සාමූහිකත්වයමය. එවිට එම සමාජය සාමූහික සමාජයක් විය.

පසු කලෙක පෞද්ගලික දේපළ ඇතිවූ විට තත්වය වෙනස් විය.

සංස්කෘතියද ඊට ගැලපෙන ලෙස වෙනස් විය. අතීතයෙන් උරුම වූ සමහර ලක්ෂණ පවත්වාගෙන ආවද ප්‍රධාන ලක්ෂණ තීරණය කළේ ඒ මොහොතේ පැවති ආර්ථික රටාව විසිනි. වහල් යුගයේදී මෙම රටවල සංස්කෘතියේ ලක්ෂණ එම වහල් ක්‍රමයට අනුව සකස්වී තිබිණ. වහලුන් මිනිසුන් ලෙස නොසලකන ලදී. නිෂ්පාදනය පරිභෝජනය සඳහා පමණක් නොව හුවමාරුව මූලික කර ගත් එකක් විය. එනම් හුවමාරු භාණ්ඩ නිෂ්පාදනය ප්‍රධාන ආකාරය විය. ඉඳහිට වෙළඳාමද සිදුවිය.

වහල් යුගයේ සංස්කෘතිය එම සමාජ ක්‍රමයට අනුරූපී විය. රෝමයේ සිටි දාර්ශනිකයෙක් වූ සිසරෝ පළ කරන ලද මතයක් වූයේ වහල්ලු යනු "කථා කරන උපකරණ" බවය.

ඉන්පසු වහල් ක්‍රමය බිඳවැටී යුරෝපා වැඩවසම් ක්‍රමය හරහා එයද බිඳවැටී ධනවාදය ඇති විය. ලංකාවේ ආසියාතික නිෂ්පාදන රටාවක් තුළ සිටි ලංකාවේ අතීත සංස්කෘතිය බිහිවූයේ ආසියාතික නිෂ්පාදන ක්‍රමයට අනුවය. අපට ධනවාදය හඳුන්වාදුන්නේ බ්‍රිතාන්‍ය පාලකයන් විසිනි. ඉන්පසු අපේ රටේ සංස්කෘතිය ධනවාදී ආර්ථිකයට හා ධනවාදී දේශපාලනයට අනුව වෙනස් විය. පැරණි සාමූහිකත්වයේ ලක්ෂණ තරමක් ඉතිරිවී තිබුණද 1977න් පසු තහවුරු කළ නව ලිබරල්වාදය තුළ එයද, අහෝසි විය.

දැන් ලංකාවේ සංස්කෘතිය නව ලිබරල්වාදයේ නිෂ්පාදන අවශ්‍යතා සමග නිර්මාණය වී ඇත. ධනවාදය නිෂ්පාදනය කරනුයේ වෙළඳ භාණ්ඩය. වෙළඳාම සඳහා නිපදවන විට වෙළඳාමේ අරමුණ වූයේ ලාභ ලැබීමය; අධික ලාභ ලැබීමය; තව තවත් ලාභ ලැබීමය. එවිට නිෂ්පාදනය තුළින්, වෙළඳාම තුළින්, සමාජය තුළින් සමාජ සාර්ධර්ම මනුෂ්‍යත්වය පළා යයි. විනයක්, පාලනයක්, ප්‍රමිතියක්, නැති විට රාජ්‍යය හසුරුවන අයද වංචා, දූෂණ හා හොරකම් අරමුණු කර ගත් දූෂිතයින් වූ විට මේ සමාජ පිරිහීම වඩාත් බරපතළ වේ. ආහාරයට ගන්නා කොස්වල කහට මතුවීම වැළැක්වීමට හාර්පික් දියකරන ලද වතුරින් කොස් මදුළු සෝදන, මාළු නරක් නොවීමට ෆෝමලින් යොදන, මී කිරි මුදවීමට ඇසිඩ් පාවිච්චි කරන තත්වයට සමහරු පත්වන්නේ ඒ අනුවය. මත්ද්‍රව්‍ය වෙළඳාම, මිනිස් ජාවාරම්, කාන්තාවන් බලහත්කාරයෙන් ගණිකා වෘත්තියේ යෙදවීම ආදී සියලු දුෂ්ටකම් මෙම ආර්ථික ක්‍රමය හා දේශපාලන ක්‍රම සමග ගැටගැසී තිබේ. එය එසේ නොවේ යැයි කිසිවෙකුට කිව නොහැක.

**සංස්කෘතියේ ඓතිහාසික ගමන් මඟේ තර්කනය අනුව බලන විට වඩාත් දියුණු, වඩාත් මානවීය සංස්කෘතියක් නිර්මාණය කිරීමට නම් වර්තමාන සංස්කෘතික විනාශයට හේතු වී ඇති නිෂ්පාදන රටාවත් එය රකින දේශපාලනයත් වෙනස් කළ යුතුය. එනම් ආර්ථික, සමාජයීය, දේශපාලන වෙනසක් අත්‍යවශ්‍ය වේ. ධනවාදී ක්‍රමයේ පවතින සංස්කෘතික පිරිහීම වෙනස්කර නව සංස්කෘතියක් නිර්මාණය කිරීමේදී මීට වඩා වෙනස් ආර්ථික ක්‍රමයක් නිර්මාණය කිරීම අත්‍යවශ්‍ය වේ.**

නිෂ්පාදනයේ එකම අරමුණ කෙසේ හෝ ලාභ ලැබීම බවට පත්කරගත් වෙළඳ භාණ්ඩ නිෂ්පාදනය වෙනුවට සමාජයේ ජීවත්වන මිනිසුන්ගේ අවශ්‍යතා සපුරාලන, ඊට සමත් මානව අවශ්‍යතා සැපිරීම සඳහා නිපදවන, නිෂ්පාදන රටාවක් ගොඩනැගීම නව සංස්කෘතියක් ගොඩනැගීමේ අත්තිවාරම බව පැහැදිලිය. මින් අදහස් වන්නේ අතීතයේ පැවති නිෂ්පාදන රටා වෙත ආපසු යාමක් නොවේ. කිසිදු ලාභයක් අපේක්ෂාවෙන් තොරව කරනු ලබන නිෂ්පාදනයක්ද නොවේ. නිෂ්පාදනය තුළ වෙළඳාම තුළ ලාභ ලැබිය යුතුය. එහෙත් නිෂ්පාදනයේ හා වෙළඳාමේ එකම අරමුණ, අධික ලෙස, අසීමිතව ලාභ ලැබීම වෙනුවට මිනිස් අවශ්‍යතා සැපිරීම ප්‍රමුඛ විය යුතුය.

ආර්ථිකය සඳහා මහජන සහභාගිත්වයක්, ආර්ථිකයේ සාධාරණත්වයත් මෙහිදී ඉතා වැදගත් වේ. නව ආර්ථික ක්‍රමය තුළ අරමුණ මිනිස් අවශ්‍යතා සපුරාලීම වූ විට, එම ආර්ථිකය ජනතාවගේ සවිඥාන සහභාගිත්වය සහිතව සිදුවන විට, එහි ප්‍රතිලාභ සමාජයට සාධාරණ ලෙස ගලායන විට, වෙනස් සංස්කෘතික තත්වයක් මතුවේ. තමන් ගැන පමණක් හිතන ආත්මාර්ථකාමී මිනිසා වෙනුවට සමාජමය වගකීම් සහිත මිනිසෙක්, සමාජයට ආදරය කරන සාමූහික මිනිසෙක් නිර්මාණය වේ. මිනිසුන් අතර අනවශ්‍ය තරගය වෙනුවට සාමූහික ප්‍රයත්න මගින් ජයග්‍රහණ ගැනීමට හැකි බව උගැන්වූ විට එය සංස්කෘතිමය වෙනසකට මඟ පාදනු ඇත.

පෞද්ගලිකත්වය මූලික වූ නිෂ්පාදන ක්‍රමයක් වෙනුවට සමාජමය නිෂ්පාදන ක්‍රමයක් ස්ථාපිත වූ විට ඊට ගැලපෙන මතවාද, සිරිත් විරිත් සම්ප්‍රදායන්ද නිර්මාණය වේ. මිනිසුන් මිනිසුන් අතර පැවති සතුරු, තරගකාරී ප්‍රතිවිරෝධය වෙනුවට එකිනෙකාට උදව් කරන එකිනෙකා රැකබලා ගන්නා සාමූහික සංස්කෘතියක් නිර්මාණය වේ. එසේම නිෂ්පාදනයේ හා බෙදාහැරීමේ

සමාජ සාධාරණත්වය තහවුරු වූ විට මිනිසුන්ගේ මූලික අවශ්‍යතා ඉටුවන විට, හෙට පිළිබඳ අවිනිශ්චිත බව නැතිවූ විට, මිනිසුන් භාණ්ඩවල වහලුන් වීම නවතා භාණ්ඩ, මිනිසුන්ගේ පරිභෝජනය සඳහා වූ දේවල් පමණක්ය යන්න තහවුරු කර ගත් විට සමාජයේ බොහෝ දුෂ්ටචරිත අතුරුදහන් වේ. ඒ සඳහා කිසියම් කාලයක් ගතවනු ඇත. නමුත් එය එසේ සිදුවේ. අධ්‍යාපනය, කලාව, මතවාද, ජනමාධ්‍ය එවැනි හොඳ සංස්කෘතියක් වෙනුවෙන් පෙනී සිටින විට, ජන මනස පෝෂණය කරන විට, ජනතාවට විනය සාමූහික පැවැත්ම කුඩා කල සිට පුරුදු කරන විට තත්වය වඩා වෙනස් වේ. එවිට නව සංස්කෘතියට පදනම වැටේ. අතීතයේ සිට එන හොඳම දේවල් රැකගනිමින් හා නව දේ එකතුකර ගත් නව සංස්කෘතියක් එලෙස නිර්මාණය වේ.

මෙහිදී **යළි යළිත් අවධාරණය කළ යුතු කරුණ වන්නේ දැන් පවතින කොල්ලකාරී ආර්ථික ක්‍රමයත්, ආර්ථික හා සමාජ ජීවිතයේ දැන් පවතින බරපතළ විෂමතාවයනුත්, ඇති-නැති පරතරයත්, පීඩාවත්, මෙලෙස තිබියෙදී සංස්කෘතිය පමණක් වෙනස් කළ නොහැකි බවය. වඩා හොඳ මානවවාදී සංස්කෘතියක් නිර්මාණය කිරීමේ මූලික පදනම පවතින්නේම මෙම සමාජ ආර්ථික ක්‍රමය වෙනස් කර මීට වෙනස් සමාජ ආර්ථික ක්‍රමයක් නිර්මාණය කිරීම තුළය.** සාමූහිකත්වයට මානව සබඳතාවලට මුල්තැන දෙන ලාභයට වඩා ජනතාවගේ අවශ්‍යතා ඉහළින් තබන, ආර්ථිකය තුළම, මිත්‍රත්වය, සහෝදරත්වය නිර්මාණය කරන, සියලු දෙනා සමාන හිමිකම් ඇති මනුෂ්‍යයන් ලෙස පිළිගනු ලබන නව සමාජයකට පමණක් නව සංස්කෘතියක් නිර්මාණය කළ හැකිය.

එහිදී සිය ඉතිහාසය පුරා මිනිසා විසින් නිර්මාණය කරන ලද, ජයග්‍රහණය කරන ලද, සොයාග න්නා ලද සියලු වටිනා දේ රැකගෙන ඒ මත නව සංස්කෘතිය ගොඩනැගේ. විශේෂයෙන් වත්මන් ධනවාදී ක්‍රමය තුළ නිර්මාණය කරන ලද නවීන විද්‍යාවේ, තාක්ෂණයේ, දැනුමේ පදනම මත එහෙත් එහි දුර්වලතා ඉවත්කර අනාගතය නිර්මාණය කරන ප්‍රගතිගාමී ලක්ෂණ සහිතව නව සංස්කෘතිය නිර්මාණය කළ යුතුවේ. එය යමෙකුට සමාජවාදය ලෙස, සමාජවාදී සංස්කෘතිය ලෙසද හැඳින්විය හැක.

විද්‍යාවේ තාක්ෂණයේ, දැනුමේ ජයග්‍රහණ මානව වර්ගයා විනාශ කරන ආයුධ නිපදවීම වෙනුවට, මත්ද්‍රව්‍ය නිපදවීම වෙනුවට මානව වර්ගයාගේ යහපත වෙනුවෙන්, යොදන සමාජයකදී ඒ මත නව සංස්කෘතියක් බිහිවේ. ලාභය එකම අරමුණ කර නොගත් සමාජයකදී මානව වර්ගයාට පරිසරයට ආදරය කිරීමට පොළඹවන සමාජයකදී අලුත් සංස්කෘතියක් හා සංස්කෘතික මිනිසෙක් බිහිවේ. ක්‍රීඩාව, කලාව, අධ්‍යාපනය වැනි ක්ෂේත්‍ර මුදල් ඉපයීමේ වාණිජ අරමුණුවලින් මුදා ඒවායේ සැබෑ මානවීය අරමුණ අනුව හසුරුවන සමාජයකදී ඊට අනුව ඊට ගැලපෙන නව සංස්කෘතියක් බිහිවේ. විද්‍යාවේ, තාක්ෂණයේ දියුණුව අධික ලාභ සඳහා මානව වර්ගයා සූරාකෑම වෙනුවෙන් නොව ඔහුගේ කාර්යන් පහසු කිරීම වෙනුවෙන් යොදවන සමාජයකදී, මිනිසාට විවේකය, විනෝදය, රසවින්දනය සඳහා ඉඩකඩ සලසන සමාජයකදී ජීවත්වීමේ පීඩාවෙන් මිනිසා මුදාගත් සමාජයකදී නව සංස්කෘතියක් හා සංස්කෘතික මිනිසෙක් නිර්මාණය වේ.

සමහර දියුණු ධනවාදී රටවල සංස්කෘතිය, පසුගාමී ධනවාදී රටවල සංස්කෘතියට වඩා සමහර ලක්ෂණවලින් දැනටත් ඉදිරියෙන් සිටින බව ඇත්තය. එම සමහර රටවල මිනිස් ආකල්ප, හැසිරීම්, විනය අපේ රටවලට වඩා ඉදිරියෙන් තිබෙන අවස්ථාද තිබේ. ඒ, එම දියුණු රටවල පවත්වාගෙන යන සමහර නීති රීති සම්ප්‍රදායත්, ජනතා අයිතීන් තහවුරු කර ඇති ප්‍රමාණය හා ආර්ථික දියුණුවේ මට්ටම අනුවය. එහෙත් සමස්තයක් ලෙස ගත් කල එම රටවල් තුළද සංස්කෘතියේ ගැටලු ඇත. වඩා දියුණු ප්‍රගතිගාමී සංස්කෘතියක් සඳහා පදනම වැටීමට නම් සමාජ ආර්ථික ක්‍රමයද වඩාත් දියුණු ප්‍රගතිගාමී හා මානවවාදී විය යුතුයයි අප සිතන්නේ මේ නිසාය.

උදාහරණ ලෙස අධ්‍යාපන ක්ෂේත්‍රය ගන්න. දැන් ඒ තුළ බරපතළ තරගකාරිත්වයක් ඇති වී තිබේ. පොදු පාසල් පද්ධතිය නොසලකා හැරීමත් රජය අධ්‍යාපනයට වෙන්කරන මුදල් ප්‍රමාණය අඩු කිරීමත් නිසා පාසල් පද්ධතිය බිඳවැටී 'ජනප්‍රිය පාසල්' කිහිපයක් සඳහා තරගයක් ඇතිවේ. එහි ප්‍රතිඵලය වන්නේ අධ්‍යාපනය තුළ සාමූහිකත්වය වෙනුවට, තනි තනිව ඉලක්ක හඹා යන දරු පිරිසක් බිහි වීමය. අනෙක් අතට එම තරගකාරිත්වය හා විභාග සමත්වීමේ, ලකුණු ගැනීමේ තරගය නිසා අධ්‍යයනයක් නැති කටපාඩම් කරන අධ්‍යාපන ක්‍රමයක් බිහි වී තිබේ. එහි ප්‍රතිඵලය දරා ගැනීමට නොහැකි, ජය පරාජය විඳගැනීමට නොහැකි, සමාජීය අත්දැකීම් නැති, පරිසරය හා සම්බන්ධයක් නැති

හුදකලා, දුර්වල පරපුරක් බිහිවීමය.

ඒ අතර පෞද්ගලික උපකාරක පංතිවලට යාමට සිදුවීම නිසා දෙමාපියන්ට පැටවෙන බරත් විශාල වේ. දරුවන්ට සමාජය හා ගැටීමට කාලයකුත් නැතිවේ. උදේ පාන්දර සිට මධ්‍යම රාත්‍රී දක්වා දරුවන් පංතිවලම ජීවත් වේ. මෙය සංස්කෘතික අර්බුදය බවට පත්ව තිබේ. එය විසඳිය හැක්කේ කෙසේද?

ඒ පළමුව රටේ ආර්ථිකය ශක්තිමත් කිරීමකි. ඉන් පසු අධ්‍යාපනයට වෙන්කරන මුදල් ප්‍රමාණය වැඩිකොට පාසල් පද්ධතිය දියුණු කර "ළඟම පාසල සැබෑ ලෙසම හොඳම පාසල" කිරීමෙනි. එසේම අධ්‍යාපනයේ අරමුණද වෙනස් කළ විට වෙනස් සංස්කෘතික ලක්ෂණ සහිත සිසු පිරිසක් හා ඔවුන් සමාජගත වනවිට නව සංස්කෘතික ලක්ෂණ සහිත ප්‍රජාවක් බිහිවේ. පාසල්, විශ්වවිද්‍යාල ආදී අධ්‍යාපන ආයතන පද්ධතියක් ගොඩනැගීමද සංස්කෘතික ජයග්‍රහණයකි.

මෙය සෞඛ්‍ය සේවය, ගමනාගමනය, වැනි ක්ෂේත්‍ර තුළින්ද ඉටුකළ හැක. දියුණු මාර්ග පද්ධතියක්ද සංස්කෘතික දියුණුවකි. ඒ සඳහා ධනවාදී ආර්ථික රටාව වෙනුවට සමාජවාදී මූලධර්ම මත ගොඩනැගෙන, රටට ගැලපෙන සාධාරණ ආර්ථික රටාවක් නිර්මාණය විය යුතුය. එවිට නිදහසේ ඉගෙන ගන්නා නිර්මාණශීලී ළමුන්ද, රෝගීන්ට බෙහෙත් කිරීම වෙනුවට නිරෝගී පරපුරක්ද මහමඟ විනයද සහිත නව සංස්කෘතික සමාජයකට පදනම වැටේ.

මුදල් ඉපයීම, අධික ලෙස ලාභ ඉපයීම, අසීමිතව භාණ්ඩ රැස්කිරීමේ කැමැත්ත ඇති කරන ආර්ථික පදනම වෙනස් කොට ඒ මත ගොඩනැගුණු ආකල්පද වෙනස් කළ විට සමාජ ජීවිතයේ විශාල දියුණුවක් ඇති කළ හැක. විද්‍යාවේ, තාක්ෂණයේ ජයග්‍රහණ ජනතාවගේ ජීවන තත්වය නගාසිටුවීමට යොදන විට, වැඩකරන කාලය අඩුකිරීමට පියවර ගත්විට සමාජයට දැනුම ලබාදීමට ඊට අදාළ මෙවලම් යොදා ගන්නා විට මානව දැනුම හා අධ්‍යාත්මික දියුණුවද ඉහළට ගෙන ආ හැක.

කලාව තවදුරටත් ලාභ උපයන කර්මාන්තයක් වනවා වෙනුවට ජනතාවගේ ආධ්‍යාත්මයට ආමන්ත්‍රණය කරන, ඔවුන් තුළ රසවින්දනය ඉහළ නංවන, මිනිසාට සමාජ අත්දැකීම් ලබාදෙන, මිනිසා තුළ මනුෂ්‍යත්වය ඇතිකරන මාධ්‍යයක් ලෙස යොදාගත් විට සංස්කෘතියේ විශාල දියුණුවක් ඇති වේ. කවියට, චිත්‍රපටවලට, ගීතයට, නාට්‍යයට අවස්ථා සලසන, ඒවාට උදවු කරන, ඒ වෙනුවෙන් රාජ්‍ය මූල්‍ය පහසුකම් සලසන ආර්ථික ක්‍රමයකදී සංස්කෘතියේ විශාල දියුණුවක් දැකිය නොහැකිද?

එබැවින් දැනටමත් අවධාරණය කර ඇති පරිදි දියුණු සංස්කෘතික සමාජයක් ගොඩනැගීම සෑම ක්ෂේත්‍රයකම කරන වෙනස්කම් තුළ සිදුවන්නක් වන අතර, ඊට පදනම වැටෙනුයේ සමාජ ආර්ථික රටාවේ වෙනසක් තුළින්ම පමණකි. නව දියුණු සංස්කෘතික සමාජයක් සඳහා ඒ මඟහැර අන් මඟක් අප ඉදිරියේ නැත.

මෙහිදී නව සංස්කෘතික සමාජයක්, නව සංස්කෘතික මිනිසෙක් නිර්මාණය කිරීමට සමාජ බලවේග සවිඥානිකව මැදිහත් විය යුතු අතර එම බලවේග අනාගත දියුණු සංස්කෘතිය නියෝජනය කරන හා දැනටමත් තමන් තුළ එම ලක්ෂණ ඇතිකරගත් අය වීමද අවශ්‍යය.

කෙසේ වෙතත් නව සංස්කෘතික සමාජයක් යනු නව සමාජ ආර්ථික රටාවක් සහිත, නව සමාජයක් මත නිර්මාණය වන්නක් බවත් එය සමාජය තුළ සිදුකෙරෙන ආර්ථික, දේශපාලන, සමාජ පරිවර්තනයක් සමඟ බැඳී ඇති බවත් අවධාරණය කළ යුතුය.



### සංස්කෘතික ජීවිතයක් වෙනුවෙන් සටන් පෙරමුණු දෙකක

# සටහන්



# 'ඔවුහු යුද වැදුණේ මව්බිම වෙනුවෙනි'

**සෝවියට් ලේඛක මිහායිල් ෂොලොහොව්**

පරිවර්තනය - චූලානන්ද සමරනායක

**1965 වසරේදී සාහිත්‍ය සඳහා වන නොබෙල් ත්‍යාගය පිළිගනිමින් නොබෙල් කමිටුව ඉදිරියේ සෝවියට් ලේඛක මිහායිල් ෂොලොහොව් විසින් පවත්වන ලද දේශනය**

මෙම සදානුස්මරණීය අවස්ථාවේදී සාහිත්‍ය පිළිබඳ නොබෙල් ත්‍යාගය මා හට පිරිනැමූ ස්වීඩන් රාජ්‍ය ඇකඩමියට නැවත වතාවක් මාගේ හෘදයාංගම ස්තුතිය පුදකර සිටීම මා'විසින් ඉටු කළ යුතුව ඇත්තා වූ ප්‍රියජනක යුතුකමක් සේ මම හඟිමි.

මා'විසින් දැනටමත් ප්‍රකාශ කෙරී ඇති පරිදි මෙම ත්‍යාගය පිරිනමනු ලැබීම මගින් මා තුළ උපද්දන ලද්දා වූ තෘප්තිය පිළිබඳ හැඟීම හුදෙක් මගේ වෘත්තීමය කුසලතා හා ලේඛකයෙකු වශයෙන් මගේ පුද්ගලික චරිත ස්වභාවයන් හට ජාත්‍යන්තර වශයෙන් පිළිගැනීමක් ලැබීමෙන් හටගත්තක් නොවන්නේය. එහෙත් මෙම ත්‍යාගය රුසියානුවෙකුට, සෝවියට් ලේඛකයෙකුට පිරිනැමීම පිළිබඳව මම සපුරා සතුටට පත්වෙමි. මම මෙහිදී මගේ දේශයෙහි වාසය කරනා විශාල සංඛ්‍යාවක් වූ ලේඛකයන් සියලුම දෙනා නියෝජනය කරමි.

සාහිත්‍ය ප්‍රභේදයක් වශයෙන් නවකතාව කෙරේ දක්වන ලද වක්‍ර පිළිගැනීමක් මෙම ත්‍යාගය මගින් පිළිබිඹු වන හෙයින් ඒ පිළිබඳව මගේ කෘතවේදිත්වය මම මීට පෙර වතාවකදී ප්‍රකාශ කර සිටියෙමි. නවකතාව, තත්කාලීන අවශ්‍යතා නිරූපණයෙහිලා බෙහෙවින් අසමත් යල් පිනූ ආකෘතියක්ය යනුවෙන් කෙරෙනා බොහෝ ප්‍රකාශයන්ට මම නොයෙක්විට සවන් දී ඇත්තෙමි; කියවා ඇත්තෙමි. එවන් දෑ ඇසීමෙන්, කියවීමෙන් මා විමතියට පත් බව අවංකවම ප්‍රකාශ කළ යුතුය. එහෙත් යථාර්ථවාදී ලෝකය පිළිබඳ වඩා පූර්ණ අවබෝධයක් ඉදිරිපත් කිරීමට ඉඩ සලසන්නේත්, මෙම විශ්වය හා එහි දැවෙන ප්‍රශ්න විෂයෙහි යමෙකුගේ ආකල්ප ප්‍රක්ෂේපණයෙහිලා මං පාදන්නේත් නවකතාව නම් වූ ප්‍රභේදයමය.

විශ්වයේ මධ්‍ය ලක්ෂ්‍ය ලෙස යමෙකුගේ ක්ෂුද්‍ර ආත්මය පෙරටුව ගැනීම වෙනුවට අප වටා පවතින විස්තෘත ලෝකය අවලෝකනය කිරීම හා නිරූපණය කිරීමට වඩා ප්‍රබල නැඹුරුවක් ඇත්තේ නවකතාව නම් වූ ප්‍රභේදය යැයි

යමෙකුට පැවසිය හැකිය. ස්වභාවයෙන්ම මෙම නවකතාව නම් ප්‍රභේදය යථාර්ථවාදී කලාකරුවා හට අතිශය පුළුල් අවකාශයක් විවර කර දෙයි.

කලාවේ නියුතු බොහෝ වත්මන් වගාඩම්බරකාරයෝ යථාර්ථවාදය ස්වකීය යුගය අවසාන කර ඇතැයි පවසමින් එය සපුරා ප්‍රතික්ෂේප කරති. එහෙත් යල්පිනූ මතවාද දරන්නෙකු යැයි අපවාදයට ලක්වීම පිළිබඳව බියකින් චකිතයකින් තොරව මම, මෙහිදී මා වනාහී ඊට මුළුමනින්ම ප්‍රතිපක්ෂ මතයක් දරන්නෙකැයිද එසේම, යථාර්ථවාදී කලාවේ ශක්‍යතා අවබෝධ කරගත්, ඊට කොන්දේසි විරහිත පක්ෂපාතීත්වය දක්වන්නෙකැයිද ප්‍රකාශ කර සිටිමි.

වර්තමානයේදී බොහෝ කොට නූතනවාදී අත්හදා බැලීම්වලට අදාළව, විශේෂයෙන්ම ආකෘතිය සම්බන්ධයෙන් වන්නා වූ අත්හදා බැලීම් පිළිබඳව කෙරෙනා සාහිත්‍යමය නව රැල්ලක් පිළිබඳව බොහෝ කතාබහ ඇතිව තිබේ. එහෙත් සිය කෘතීන් මගින් අප යුගයේ ජීවිතයෙහි තීරණාත්මක සාධකයන්, විවිධාකාර වූ සම්බන්ධතා හා ආකල්ප අනාවරණය කිරීමෙහි කලාකරුවෝ සැබෑ පුරෝගාමීහු වන්නෝය යන්න මගේ මතයයි.

සමස්තයක් වශයෙන් ගත්කල යථාර්ථවාදය හා යථාර්ථවාදී නවකතාව යන මේ ද්විත්වයම අතීතයේ විසූ ශ්‍රේෂ්ඨ නිර්මාණකරුවන් විසින් ඉදිරිපත් කරන ලද්දා වූ කලාත්මක අත්දැකීම් මත පදනම්ව ඇත්තේය. කෙසේ වෙතත් එහි සංවර්ධනයේදී නූතන වන්නා වූ බොහෝ වැදගත් අංගෝපාංගයන් ඊට එකතු වී තිබේ.

ජීවිතය ප්‍රතිනිර්මාණය කිරීම, මානව වර්ගයාගේ යහපත උදෙසා එය යළි හැඩගැන්වීම යන්න ස්වකීය සංකල්පය තුළ ගැබ්ව ඇත්තා වූ යථාර්ථවාදයක් පිළිබඳව මෙහිදී මම කතා කරමි. සැබැවින්ම මා මෙහිදී අදහස් කරනුයේ සමාජවාදී යථාර්ථවාදය යනුවෙන් අප විසින් විස්තර කරනු ලබන්නා වූ යථාර්ථවාදය පිළිබඳවය. එහි ගැබ්ව ඇති සුවිශේෂ ගුණය වන්නේ එමගින් ලොව ප්‍රතික්ෂේප කිරීම හෝ යථාර්ථයෙන් පලායාම භාරගන්නා
වූ දර්ශනයක් නොව මිනිසාගේ අරගලයේ මාවත ආලෝකමත් කරන දශලක්ෂ සංඛ්‍යාත මිනිසුන්ගේ හදවත් ආලෝලනය කරන්නා වූ අරමුණු ප්‍රකාශ වීමට මඟ පාදන්නා වූ දර්ශනයක් පළවීමය.

මනුෂ්‍ය වර්ගයා යනු පොළොවේ ගුරුත්වාකර්ෂණයෙන් මිදීගත් අජටාකාශග ාමීන් මෙන් රික්තයක් තුළ ඔබ මොබ යන්නා වූ, එකිනෙකාගෙන් වෙන් වූ, හුදකලා වූ පිරිසක් නොවේ. මේ මහපොළොව මත ජීවත් වෙන අපි එහි නියමයන්ට යටත් වෙන්නාසේම, ශුභාරංචියෙහි පැවසෙන්නාක් පරිදි එම නියාමයන් තුළ අයහපත, ප්‍රශ්න හා පරීක්ෂාවන් මෙන්ම වඩා හොඳ අනාගතයක් උදෙසා වන අපේක්ෂාවන්ද ගැබ් වී ඇත්තේය. ලොව ජනගහනයෙන් අතිවිශාල පිරිසක් එකබඳුම අපේක්ෂාවන්ගෙන් පොලඹ වනු ලබන අතරම එකිනෙකා වෙන් කිරීම වෙනුවට ඔවුහු මෙම අපේක්ෂා වන්ගෙන් එකට බැඳී සිටින්නෝය.

ස්වකීය දැනීන් හා ප්‍රඥා මහිමයෙන් සෑම සියලු දෙයම නිර්මාණය කරන්නෝ වැඩකරනා ජනතාවය. මෙම වැඩකරනා ජනතාව වෙනුවෙන් ස්වකීය පන්හිඳ කිසිදු ආකාරයක අවහිරයකින්, බාධාවකින් තොරව මෙහෙයවීමට ලැබීම තමන් ලබනා ඉහළම ගෞරවය යැයිද, තමන්ට ඒ සඳහා උපරිම නිදහස තිබිය යුතුයැයිද යන්න අදහන ලේඛකයින්ගෙන් මමද අයෙක්මි. මූලිකම පදනම වන්නේ එයයි. වත්මන් ලෝකය තුළ කලාකරුවෙකු හට හිමි ස්ථානය සෝවියට් ලේඛකයෙකු වශයෙන් මා දකින්නේ කෙසේද යන්න නිගමනය වන්නේ එමගිනි.

අප වෙසෙනා මෙම ලෝකය පිරී පවතිනුයේ අවිනිශ්චිතතාවෙනි. මුළුහදින්ම යුද්ධය ප්‍රාර්ථනා කරන එකම ජාතියක්වත් මේ මිහිපිට නැත්තේය. නමුදු යුද්ධයේ ගිනි උදුන වෙත සමස්ත ජනතාවම දක්කන්නට වලි කන අධම බලවේගයක් ඇත්තේය. දෙවන ලෝක සංග්‍රාමය නම් වූ විස්තර කළ නොහැකි තරම් දරුණු ලැව්ගින්නෙන් මතුවූ අළු හමුවේ ලේඛකයාගේ හදවත ක්‍රියාකාරීවීම නොවැළැක්විය හැකි, අනිවාර්ය සාධකයක් නොවන්නේද? මනුෂ්‍යත්වය ස්වයං විනාශය කරා පිරිහෙළීම අරමුණු කරගත්තා වූ සතුරු බලවේගයනට එරෙහිව නැගීසිටීමට අවංක ලේඛකයෙකු බැඳී නොසිටින්නේද?

එසේ නම් යුද්ධයේ උණුසුමින් බොහෝ දුරස්ව, මානව වර්ගයාගේ විඳවීම් පිළිබඳව උදාසීනත්වයෙන් යුතුව, දෙවියන් වහන්සේගේ ප්‍රතිරූපයක් මෙන් අබිසෙස් නොලබා, සැබෑ ජනතා පුත්‍රයෙකු ලෙස මානව වර්ගයාගෙන් එක් අංශුමාත්‍රයක් බවට පත්ව කලාකරුවා ඉටු කළ යුතු කාර්යභාරය කුමක් වන්නේද?

එය නම් අන්කිසිවක් නොව පාඨකයා හට සපුරා අවංක වීමයි; ජනතාවට සත්‍යවාදී වීමයි. විටෙක එය බෙහෙවින් අප්‍රසන්න දෙයක් වීමට පුළුවන. එහෙත් ඔහු එය නිර්භයව ඉටු කළ යුතුය. අනාගතය ගොඩනැගීම උදෙසා වන ස්වශක්තිය පිළිබඳ විශ්වාසය. අනාගතය උදෙසා වන තිර විශ්වාසය මානවයාගේ හදවත්හි තිරසර ලෙස පිහිටුවාලිය යුතුය. එසේම ලේඛකයා මුළු ලොව පුරාම සාමය උදෙසා සටන් වදිනා ජයග්‍රාහකයකු විය යුතු අතරම ඔහු සිය වදන් මගින් එවන් වූ ජයග්‍රාහකයන්, විරුවන් තවත් බිහි කළ යුත්තේය. එසේම ප්‍රගතිය කරා වන මාවත කරා ජනතාව ඒකරාශී කළ යුත්තේය.

මනුෂ්‍ය වර්ගයාගේ බුද්ධිය හා හදවතට බලපෑම් කිරීමේ සමත් විශිෂ්ට හැකියාවක් කලාව සතුව ඇත්තේය. මා අවංකව අදහන පරිදි යමෙකුට තමා කලාකරුවෙකු ලෙසින් හඳුන්වා ගැනීම සඳහා පූර්ණ හිමිකමක් ඇත්තේ, ඔහු තම කෘතිය මිනිසුන්ගේ හදවත් තුළ අලංකාර ලෝකයක් නිර්මාණය කිරීම උදෙසා යොදවන්නේ නම් හා ඔහු මනුෂ්‍ය වර්ගයා වෙත යහපත කැඳවන්නේ නම් පමණි.

සිය ඓතිහාසික ගමන්මඟේදී මගේ ජනතාව කිසිවිටක හුදකලා මං මාවත්වලට යොමුවී නැත. සැමවිටම ඔවුන්ගේ මාවත වූයේ නව ජීවිතයක් උදෙසා සටන්වැදි පුරෝගාමීන්ගේ, ගවේෂකයන්ගේ මාවතයි. මෙතෙක් මා විසින් ලියන ලද මෙන්ම මතුවට ලියවෙනු ඇත්තා වූ සෑම දෙයකදීම මගේ සැලකිල්ල යොමු වූයේ හා යොමු වනු ඇත්තේ ලේඛකයෙකු වශයෙන් මගේ කාර්යභාරය යනු අන් කිසිවක් නොව, මෙතුවක් කල් කිසිවෙකුට ප්‍රහාර එල්ල නොකළා වූද, එසේම තමන් විසින් නිර්මාණය කරනා ලද්දා වූ ලෝකය, එහි නිදහස හා ගරුත්වය ආරක්ෂා කරන්නේ කෙසේදැයි දන්නා වූ එසේම එහි මනාපය පරිදි අනාගතය ගොඩනැගීම උදෙසා වන හිමිකම ඇත්තාවූත් මෙම වීරෝදාර ජාතියට. ගොඩනගන්නන්ගේ ජාතියට, කම්කරු ජනතාවට මගේ උපරිම ප්‍රණාමය දැක්වීමය යන්න කෙරෙහිය.

මගේ කෘති මානව වර්ගයාගේ සිත්සතන් වඩ වඩා නිර්මල කිරීමට, වඩා යහපත්වීම සඳහා මිනිසාට මඟ පෙන්වීමට ඉවහල් වන්නේ නම්, මම ඒ පිළිබඳව උදක්ම සතුටු වෙමි.

එසේම මගේ කෘති මගින් තම සගයන් වෙත ආදරය දැක්වීමට මානව වර්ගයාගේ අභිවෘද්ධිය, පරමාදර්ශ උදෙසා සටන් වැදීමට මිනිසා පොළඹවනු ලබන්නේ නම් මම ඒ පිළිබඳවද අවංකවම සතුටු වෙමි.

අවසන් වශයෙන් මෙම රාත්‍රියෙහි මෙහි රැස්ව සිටිනා ඔබට හා නොබෙල් ත්‍යාගය ලැබීම සම්බන්ධයෙන් මට සුබ පැතුම් එවූ සියලු දෙනාටම ස්තුති කරනු කැමැත්තෙමි.

# ජාතිකත්වයේ සීමා ඉක්ම වූ මනුෂ්‍යත්වය...

ගමනකට පිටව යන මගියෙක්
වියදමට රැගෙන යන්නේ කුමක්?
පාන් සහ වයින් හැර වෙන කුමක්,
ඒත් ඔබ ඊට වද නොවිය යුතු.

ගරුසරුව අපි සලකමු ඔබට
ඔය පාන්, වයින් අතහැර එන්න.
කඳුකර ගැහැනියක් පාන් පුච්චා දේවි
ඇගේ සැමියා ඔබට වයින් පුරවා දේවි.

ගමනකට පිටව යන මගියෙක්
ඒ හැර ගෙන යන්නේ කුමක්?
ඔහු රැගෙන යයි තියුණු සිරියක්,
ඒත් ඔබ එය සිතට නොගනු මැන.

කඳුකරය ඔබ හොඳින් පිළිගනී
කිසිවෙක් ඔබට එරෙහිව ගියොත්
කඳුවැසියෝ සිරිය ඈද ගනිත්
ඔවුන්ගේ යුතුකම ඉටු කරත්.

ගමනකට පිටව යන මගියෙක්
සිතන්නෙද, ගෙන යතැයි තව කුමක්?
ගයන්නට මඟ දිගේ සොම්නසින්
රැගෙන යයි ඔහු පැරණි ගීතයක්.

අප ළඟත් ඒ වැනි ගී හුඟකි
බාගෙදා ඔබ ඒ අසා ඇති
නමුත් ඔබගේ ගීය ගෙන එන්න
කිසිසේත් එය බරක් නොව ඔබට...

සෝවියට් කිවියර **රසූල් ගම්සොතොව්**
'මගේ දගෙස්ථානය'
සිංහල පරිවර්තනය: මහින්ද සෙනරත් ගමගේ



සංස්කෘතික ජීවිතයක් වෙනුවෙන්
සටන් පෙරමුණු දෙකක
# සටහන්



# 'නව සංස්කෘතික මිනිසෙකු කාරකත්වය වෙත ගෙන ඒම'

ලියනගේ අමරකීර්ති
'සංස්කෘතික ජීවිතයක්'
**සමාජ පරිවර්තනීය සංවාද - 2019**

සංස්කෘතික මිනිසෙකු බිහිකර ගැනීමේ අවශ්‍යතාව පිළිබඳ දේශපාලන තලයෙහි කතිකාවක් ඇතිවී තිබීම ඉතා අර්ථවත් වර්ධනයකි. සමාජ පරිවර්තනය පිළිබඳ කතිකාවලදී ආර්ථික - දේශපාලන කාරකයෙකු කේන්ද්‍ර කර ගැනීම නිතර සිදුවන දෙයකි. එය අවශ්‍ය බව ඇත්තකි. එහෙත් එහිදී සිදුවන්නේ 'සංස්කෘතික' යන විශේෂණයෙන් හැඳින්විය හැකි බොහෝ වැදගත් අංග ලක්ෂණ නොසලකා හැරීමයි. ආර්ථික - දේශපාලන කාරකයා වටා සංස්කෘතිකවත්භාවය නිරායාසයෙන් පැන නැග එන බවක් විශ්වාස කරන්නාක් මෙනි. දැන් දැන් විපර්යකාරක සමාජ අරගලවලදී සංස්කෘතිකවත්භාවය පිළිබඳ මානයද ඉදිරියට එන බව පෙනේ.

සංස්කෘතිකවත්භාවය ඉතා ප්‍රභූවාදී අර්ථ දැනවිය හැකි බැවින් විචාරශීලීව භාවිත කළ යුතුය. සාමාන්‍යයෙන්
"Cultured" ඉංග්‍රීසි වචනයෙන් හැඳින්වෙන්නේ දැන උගත්, 'ඉහළ සංස්කෘතික අංග අත්පත් කරගත්' වැනි අදහසකි. එනම් අදාළ සමාජයෙහි ප්‍රභූ ස්ථරය විසින් සාධු සම්මත කරන ලද සංස්කෘතික අංග අත්පත් කරගත් අය සංස්කෘතිකවත් අය යැයි සැලකේ. සංස්කෘතිය පිළිබඳ වාම කතිකාව වර්ධනය කළ රේමන්ඩ් විලියම්ස් වැනි අය 'සංස්කෘතිය' යන්න හුදෙක් බූෂුවා උරුමයක් නොවන බව පෙන්වා දුන්හ. නිර්-ප්‍රභූ මනුෂ්‍ය අවකාශවල ඇති සංස්කෘතික ජයග්‍රහණ ගැනද ඔවුහු අවධානය යොමු කළහ.

සංස්කෘතිකවත්භාවය පිළිබඳ කවර තරම් ගැටලු තිබුණත් එම සංකල්පය අදාළ සමාජවල පවත්නා ප්‍රභූ කතිකාවෙන් නිදහස් කරගෙන සමාජ පරිවර්තන කාර්ය සඳහා භාවිත කළ හැකිය. අද වන විට අන්තර්ජාලය වැනි තාක්ෂණික ජයග්‍රහණ නිසා උසස් කලාව වැනි සංස්කෘතික සම්පත් සාපේක්ෂ

ප්‍රජාතන්ත්‍රකරණයට ලක්වී තිබේ. සාමාන්‍යයෙන් බුෂුවා උරුමයක්ව පැවති සම්භාව්‍ය පරම සංගීතය පවා තනිව හදාරන්නට අවශ්‍ය සම්පත් පහසුවෙන් අත්පත් කරගත හැකිය. ලෝකයේ ඕනෑම විශිෂ්ට සිනමා කෘතියක් වෙත ප්‍රවේශ වීමේ හැකියාව තිබේ. මිලාධික ඔපෙරා ශාලාවකට ගොස් ඔපෙරාවක් නැරඹීමේ අවස්ථාව නැති වුවත් ඔපෙරාව යනු උත්කර්ෂයට නංවන ලද බුෂුවා සංකේතයක් වීම වැළැක්විය හැකි මට්ටමට එවන් සංස්කෘතික සම්පත් පහසුවෙන් ළඟා කරගත හැකි තත්වයක් පවතී.

සංස්කෘතිකවත්භාවය හෝ සංස්කෘතික මිනිසා වැනි සංකල්ප මානව විමුක්ති අරගල සහ සමාජ පරිවර්තන කාර්යවලදී ප්‍රයෝජනවත් වන ආකාර කිහිපයක් ඇත. සංස්කෘතිකවත් මිනිසා යනු වෙනස් කරන ලද මිනිසෙකි. 'සංස්කෘතිය' යන සංකල්පය තුළ වෙනස් කිරීම සහ වගා කිරීම යන අර්ථ පවතී. මනුෂ්‍යයාගේ බාහිර සේම අභ්‍යන්තරයද වගා කළ හැකිය; පරිවර්තනය කළ හැකිය. 'ස්වභාවික මිනිසා' එපරිද්දෙන්ම සිටින සමාජයක් පරිවර්තනය කරන්නේ කෙසේද? සමාජ පරිවර්තනය කළ හැක්කේ තමාද සමග තම පරිසරය වෙනස් කළ හැකි යැයි සිතෙන මිනිසෙකුටය. සරල නිදර්ශනයක් ගනිමු. හොඳ සිනමා පටයක් සොයාගෙන නරඹන්නට හෝ හොඳ පොතක් සොයා ගෙන කියවන්නට තැත් කරන ස්ත්‍රී පුරුෂයෝ සමාජයෙහි සිටිති. ඔවුන් එමගින් කරන්නට තැත් කරන්නේ කුමක්ද?
ලිංගිකත්වය හෝ ආහාර වැනි අවශ්‍යතා වෙනුවෙන් හෝ යමක් ඉපැයීමේ ආර්ථික අවශ්‍යතා හෝ පසෙක තබා රස වින්දනය සොයන්නට තැත් කිරීමකි. සිනමාව, සාහිත්‍යය වැනි සංස්කෘතික වස්තුවක් හඹා යන අවස්ථාවේදී මිනිසා සිය පැවැත්ම පිළිබඳ උපයෝගීතා අවශ්‍යතා මොහොතකට පසෙකට තබයි. ඒ ප්‍රයත්නයේදී ඔහු හෝ ඇය 'ප්‍රායෝගික මිනිසෙකු' හෝ 'ආර්ථික මිනිසෙකු' නොවී සංස්කෘතික මිනිසෙක් වේ. මෙම නැඹුරුව සමාජ පරිවර්තනයේදී අවශ්‍ය වන ආරම්භක කොන්දේසියකි.

මෙම කරුණ සරල අත්දැකීමක් ඇසුරෙන් පැහැදිලි කරන්නට මට ඉඩ දෙන්න. මා ගැටවර විය ගත කළ කාලයේ පොතපත කියවමින්, සිනමාපට නරඹමින් අපේ ගමෙහි ගැවසුණු තරුණ අය සිටියහ. රුසියානු, ප්‍රංශ සාහිත්‍යය ආදී කලා ගැන මගේ අවබෝධය වර්ධනය කිරීමට ඒ අය බෙහෙවින් දායක වූහ. අද ඒ ගම්වල ඒ තරුණයා හෝ  තරුණිය නොසිටියි. ඒ අය නිදහස් වෙළඳ කලාපයේ හෝ ආසන්නම නගරයේ සුපිරි වෙළඳසැලක හෝ සේවකයන් බවට පත්වී සිටිති. ඔවුහු ආර්ථික මිනිසුන් හෝ ප්‍රායෝගික මිනිසුන් බවට පත්වී සිටිති. ඔවුන් නැවතත් විපර්යකාරකයන් බවට පත් කළ හැක්කේ ඔවුන්ගේ ජීවිතවල ආර්ථික මානය තිබියෙදීම පවා සංස්කෘතික මානය වර්ධනය කිරීමෙනි. මිනිස් ජීවිතයෙහි ප්‍රායෝගික මානය අත්හැර දමා කලාව වෙනුවෙන් රස්තියාදු වන අය බවට පත්කිරීම වර්ධනයක් නොවේ. හුදෙක් ආර්ථික යන්ත්‍රයෙහි ඇණ මුරුච්චි බවට ඌණනය නොවී සංස්කෘතිවත් ජීවිතයක් වෙනුවෙන් අරගල කරන තැනට ඔවුන් පත්කිරීම සමාජ පරිවර්තනයෙහි ආරම්භක පියවරකි.

'සංස්කෘතිය' යන්න ඉතා ගතානුගතික වූද, සංරක්ෂණවාදී වූද, දෘෂ්ටිවාදී කඳවුරු විසින් ග්‍රහණයට ගනු ලැබිය හැකි සංකල්පයක්ද වේ. සංස්කෘතිය යන්න ආරක්ෂා කරගත යුතු යමක් සේ එවැනි කඳවුරුවල විශ්වාස කෙරේ. එහෙත් එම සංකල්පය සමාජ පරිණාමීය සංකල්පයක් සේ භාවිත කරන අය

සංස්කෘතිය යන්න වටහා ගන්නේ අලුතින් සැකසිය යුතු දෙයක් ලෙසය. අපට අහවල් සංස්කෘතික උරුමය ඇති නිසා අප ශ්‍රේෂ්ඨ යැයි සිතන අය වෙති. එහෙත් හුදෙක් යම් සංස්කෘතික අංගයක් උරුම වන නිසාම යම් පිරිසක් ශ්‍රේෂ්ඨ වන්නේ කෙසේදැයි ඇසීමද සංස්කෘතිකමය කාරණයකි. සමාජය වඩා සාධාරණ වූද, යුක්තිගරුක වූද ලෙසට පරිවර්තනය කළ හැක්කේ තමන්ගෙන්ම එසේ ඇසීමේ ශක්තිය ඇති පිරිසකටය. ඇතැම් ජන පිරිස් තම 'සංස්කෘතික උරුමය' ලෙස ගෙන හැර දක්වන බොහෝ දේ හුදෙක් ඒ පිරිස පමණක් කළ නිර්මාණයක්ද? වෙනත් කණ්ඩායම් ඒ සංස්කෘතික උරුමය ගොඩනඟන්නට දායක වී නැද්ද?

මෙම ප්‍රශ්නය වඩාත්ම ගැටලු සහගත ලෙස පැන නගින්නේ ජාතික රාජ්‍යයක හෝ එක් ජාතික භාෂාවක සීමාවේ සිට සංස්කෘතිය යන්න වටහා ගන්නා විටය. සිංහල සංස්කෘතිය යන්න මොහොතකට ගනිමු. එය ලංකාව නමැති ජාතික රාජ්‍ය අවකාශය හෝ සිංහල භාෂාව නමැති වාග්මය අවකාශය තුළ වටහා ගැනීමට තැත් කිරීම ඉතා මෑත කාලීන දෙයකි. අප සිංහල සංස්කෘතිය යැයි හඳුන්වන දේ නිර්මාණය කරන්නට මේ ජාතික රාජ්‍යයෙන් සහ සිංහල භාෂා සීමාවෙන් පිට බොහෝ සංස්කෘතීන් දායක වී ඇත. නිදර්ශනයක් ලෙස සිංහල සාහිත්‍යය ගන්න. සීගිරි ගීයේ සිට නිදහස් පද්‍ය ඔස්සේ නූතන හයිකු කවිය දක්වා සිංහල සාහිත්‍ය නිර්මාණය කරන්නට සංස්කෘත, දෙමළ, ඉංග්‍රීසි, ජපන් සංස්කෘතීන් දායක වී තිබේ. එංගලන්තයේ ඉංග්‍රීසි නමින් හැඳින්වෙන සංස්කෘතිය නිර්මාණය කිරීමට ජර්මානු, ප්‍රංශ, ස්කැන්ඩිනේවියානු ආදී බොහෝ සංස්කෘතීන් දායක වී ඇත. මෙය ඕනෑම ජාතික භාෂා සංස්කෘතියක් සම්බන්ධයෙන් අදාළය. "කිසිම සංස්කෘතියකට මානව ජීවිතයෙහි සුපිෂ්පිත වීමට අවශ්‍ය සියලු දේ තනිව නිර්මාණය කරගත නොහැකිය" යනුවෙන් ගුරුදේව තාගෝර් වරක් කීවේය. එය ඇත්තකි. මානව ජීවිතය අර්ථසම්පන්න ලෙස එල දරා පොහොණී කර ගැනීමට අවශ්‍ය සියලු දේ තනි සංස්කෘතියක් තුළ පමණක් නිර්මාණය කළ හැකි යැයි සිතීම මුළාවකි.

එසේ සිතීම මානව විමුක්තියටද එරෙහිව සිටියි. සියලු මිනිසුන් නිදහස කරා මෙහෙය වන අරගල කළ හැක්කේ පොදු මානව නිදහස වෙනුවෙන් බොහෝ අයට දායක විය හැකි යැයි විශ්වාස කරන අයටය. සංස්කෘතික මිනිසා යනු එවන් පොදු මානව නිදහස වෙනුවෙන් අරගල කරන්නෙකි.

සංස්කෘතික මිනිසා යනු ප්‍රභූ සංස්කෘතික උරුමයක් කර පින්නාගෙන අවශේෂ මනුෂ්‍යයන් වෙතින් ඉහළට එසවී වැජඹෙන්නෙකු නොවේ. නියම සංස්කෘතික මිනිසා අනෙක් මනුෂ්‍යයාගේ ජීවන යථාර්ථ වෙත සහවේදනීය සහ සහකම්පනීය ලෙස ළං විය හැකි කෙනෙකි. සමාජ වෙනස් කිරීමෙහි කාරකයෙකු විය හැක්කේ එවැන්නෙකුටය.

'සංස්කෘතිය' යන සංකල්පය ආගම සමග සම්බන්ධ කර ආගමික අර්ථයකින් වටහා ගැනීම දැකිය හැකිය. ආගමද සංස්කෘතියෙහි කොටසකි. එහෙත් සංස්කෘතිය යනු ආගම පමණක් නොවේ. මනුෂ්‍ය සහෝදරත්වය, සමාජ සාධාරණය, යුක්තිය ආදිය පිළිබඳ ලෞකික කතිකාවද සංස්කෘතික මිනිසාගේ සැකැස්මේ කොටසකි. සංස්කෘතිකවත්භාවය පිළිබඳ අදහස හැකි තරම් ප්‍රසාරණය කිරීම පොදු මානව විමුක්ති අරගලයෙහි කොටසක් වන්නේ එහෙයිනි. ඒ අර්ථයෙන් ගත් කල විචාර බුද්ධිය, තාර්කික චින්තනය, භාවමය

ධාරිතාවෙහි වර්ධනය, රසවින්දන ශක්තිය, රසඥතාවය ආදී ලෞකික අදහස් සියල්ලම සංස්කෘතික මිනිසාගේ ජීවිතයෙහි කොටසකි. එසේම සංස්කෘතිකවත් මිනිසා තමාම පිළිබඳ විචාරාත්මක ආත්ම පරීක්ෂාවෙහි පුහුණුව ඇති කෙනෙකි. අනෙක් මිනිසා පිළිබඳ පරීක්ෂාව පමණක් කරන්නා එක්තරා ගැඹුරු අර්ථයකින් අසංස්කෘතික කෙනෙකි. තමා වසන ලෝකය පිළිබඳ විචාරාත්මක පරීක්ෂාව තුළට තමාද ඇතුළත් කර ගැනීමේ හැකියාව ඇති තැනැත්තාට ඵලදායක සමාජ පරිවර්තකයෙකු වන්නට පුළුවන.

මනුෂ්‍ය ජීවිතයෙහි නෛසර්ගික
අගය වටහාගෙන, එවන් මනුෂ්‍ය ජීවිතයක් වඩා හොඳින් ඵල දරන සේ පොහොණී කරන සමාජ-ආර්ථික ව්‍යුහ නිර්මාණය කිරීමෙහිලා දායක විය හැක්කේ ඒ අරගලය අතරතුරම පවා සංස්කෘතික මිනිසෙකු ලෙස ක්‍රියා කළ හැකි කෙනෙකුටය.

මෙම කෘතියෙහි සංග්‍රහ වන ලිපි මාලාව ලංකාවේ පළමු වරට මෙන් සංස්කෘතික විචාර දේශපාලන අරගලයෙහි කොටසක් බවට පත් කරයි. ඒ නිසා මෙම කෘතිය නිසා ඇති වන කතිකාව අපගේ විමුක්ති අරගලයෙහි අත්‍යවශ්‍ය පියවරකි. සංස්කෘතිකවත්භාවය යනු ගමන අගදී ගමනාන්තයකට එළඹි පසු අත්පත් කරගන්නා දෙයක් නොව ගමන යන අතරතුරුම පිරිපහදු වෙමින්, හැඩගැසෙමින් වැඩෙන්නකි. මෙම ලිපි ඒවා ලියූ රචකයන්ගේත්, ඒවා කියවන අයගේත් විඥානයෙහි ප්‍රසාරණය ගමන අවසානයෙහි නොව ගමන යන අතරතුරම ඇති කරන්නට ප්‍රයත්න දරයි. එය ඉතා සුබ ලකුණකි. එය නැවුම් ලකුණක්ද වේ. මෙහි ලිපි ලියන සියලු දෙනාම පාහේ නව ලංකාවක් ගොඩනගන්නට තැත් කරන සංස්කෘතික මිනිසුන් වන අතර ඒ ප්‍රයත්නය අතරම සංස්කෘතිකවත්භාවය අත්පත් කරගන්නට තැත් කරන තරුණ පිරිසකි. ඇතැම් නව න්‍යායික සංකල්ප වැඩෙහි යොදවන්නට මේ තරුණ චින්තකයන් මැදිහත් වන ආකාරය අනාගතය ගැන අපේක්ෂා දල්වයි.



# සංස්කෘතික ජීවිතයක් වෙනුවෙන් වූ ඓතිහාසික ප්‍රයත්නයන්

**සුජීව දිසානායක**

මානව ඉතිහාසයේ ආරම්භය අදින් වසර ලක්ෂ 200ක් පමණ ඈතට දිවයන බව විශ්වාස කෙරේ. එලෙස බිහිවූ මානවයා අද වන විට ඉතාම දියුණු සත්වයෙක් බවට පත්වී ඇත්තේ ඔහු වෙනස් කළ නොහැකියැයි සිතූ ජීවිතය පවා වෙනස් කරන තැනට ශක්තිමත් වී ඇති බැවිනි. මානවයා ශිෂ්ටත්වයට පත්වීමේදී ගංගා නිම්න ශිෂ්ටාචාරයන් කිහිපයක සිට ස්ථාවරත්වයට ගමන් කළ බව කිව හැකිය. ඒ සභ්‍යත්වයන් අතුරෙන් තුනක්ම ආසියාව මුල් කරගෙන බිහි වූ ඒවා වූ අතර මේවායෙන් පැරණිතම දියුණු නාගරික සභ්‍යත්වය සේ සලකන්නේ ඉන්දු නිම්න සභ්‍යත්වයයි. මෙලෙස සභ්‍යත්ව ගත වූ මිනිසා සංස්කෘතික වශයෙන් විශිෂ්ටත්වයට පත් වූයේ එක්වරම නොවේ. ඒ සඳහා ඔවුන් විශාල වෙහෙසක් මෙන්ම කැප කිරීමක්ද කළ බව පෙනේ.


ලොව ඕනෑම රටක සංස්කෘතිය යනු ඒ රටේ අතීත කැඩපතයි. සංස්කෘතිය තුළට ආගම, භාෂාව, සාහිත්‍යය කලාව, සියලු ඉදිකිරීම් හා නිර්මාණ ආදී අංගයන් ඇතුළත්ය. ලෝකයේ බිහිවුණ විශිෂ්ට සංස්කෘතීන්හි වර්ධනයට දැවැන්ත පිටුබලයක් සැපයු ප්‍රධානම අංගය වන්නේ අධ්‍යාපනයයි. පැරණි ගංගා නිම්න

සභ්‍යත්වයන් හතරෙහිම ඉතා දියුණු අධ්‍යාපනයක් තිබූ බවට පුරා විද්‍යාත්මක සාධක තුළින් කරුණු සනාථ කරගත හැකිය. එලෙස අධ්‍යාපන කටයුතු සඳහා ඉන්දු නිම්න සභ්‍යත්වයේ තිබූ ශාස්ත්‍ර ශාලාව දිගින් අඩි 230 ක්ද පළලින් අඩි 78ක් වූ අතර ඒ සා විශාල අධ්‍යාපන මධ්‍යස්ථානයක් ලොව වෙනත් කිසිදු පැරණි සභ්‍යත්වයකින් හමු වී නැත. මේ සභ්‍යත්වය තුළ හෝඩියක් තිබූ අතර එහි අක්ෂර 270ක් පමණ දක්නට ලැබුනු බවට පුරා විද්‍යාඥයෝ විශ්වාස කරති. මෙම සභ්‍යත්වයේ අධ්‍යාපන කටයුතු ආගමික නායකත්වයක් විසින් මෙහෙයවූ බවද විශ්වාස කෙරේ.

මෙලෙස ආසියානු මෙන්ම යුරෝපීය සභ්‍යත්වයන් දෙකෙහිම සංස්කෘතියේ වර්ධනයට අධ්‍යාපනය මෙන්ම කියවීමද ප්‍රබල බලපෑමක් කළ බව පෙනේ. යුරෝපය තුළ ආරම්භ වූ ප්ලේටෝගේ ඇකඩමි හා ඇරිස්ටෝටල්ගේ ලයිසියම් යන අධ්‍යාපන ආයතනයන් ග්‍රීක සභ්‍යත්වයේ අධ්‍යාපනයේ දියුණුවට විශාල රුකුලක් වී ඇත. යුරෝපය තුළ ආරම්භ නොවුණත් ආසියානු සභ්‍යත්වය තුළ අධ්‍යාපනයේ ඉහළම තලයට අයත් වන්නා වූ විශ්වවිද්‍යාල ආරම්භ වූ අතර ඒවා ආසියානු සංස්කෘතිය ඉස්මතු වීමට ප්‍රබල දායකත්වයක් සපයා තිබේ. එලෙස වර්ධනය වූ ආසියානු සංස්කෘතික ඉතිහාසය තුළ අපට අසන්නට ලැබෙන ඉතාම ප්‍රසිද්ධ විශ්වවිද්‍යාලය නාලන්දා විශ්ව විද්‍යාලයයි.

බෞද්ධ අධ්‍යාපන මධ්‍යස්ථානයක්ව තිබුණ මෙය විශ්වවිද්‍යාලයක් බවට පත් වූයේ ගුප්ත යුගයේ I කුමාර ගුප්ත රාජ්‍ය කාලයේදීය. ක්‍රි.ව. 07වැනි සියවසේ බලය දැරූ හර්ෂවර්ධන රජු මෙයට විශාල දායකත්වයක් සපයා ඇත. ඔහු ගම් 100ක ආදායම මේ විශ්වවිද්‍යාලයේ නඩත්තුවට ලබා දී ඇත. නාලන්දා විශ්වවිද්‍යාලයේ නේවාසිකව අධ්‍යාපනය හැදෑරූ හියුත්සාං හිමි මෙහි තිබූ මහල් 06ක ප්‍රධාන ගොඩනැගිල්ලක් පිළිබඳ තම වාර්තාවේ සඳහන් කරයි. මෙය ඇතැම් විට නාලන්දාවේ පිහිටි ශාස්ත්‍ර ශාලාව විය යුතුය. මෙයින් පිටවූ පසු අවට ශාලා 8කට ඇතුල් විය හැකිය. මෙහි ලැගුම් ගෙවල් දක්නට ලැබුණ අතර ඉතා අලංකාරව තැනූ ඒවා සිව් මහලින් යුක්ත ඒවා විය. ක්‍රි.ව. 07 සියවසේ හියුත්සාං දවස මෙහි ශිෂ්‍යයන් 10,000ක් පමණ අධ්‍යාපනය හැදෑරූ අතර ගුරුවරුන් 1500ට වඩා ඉගැන්වීමේ කටයුතුවල යෙදී සිටි බව කියවේ. මේ ආචාර්යවරුන්ගේ සේවය සඳහා තවත් එපමණ පිරිසක් මෙහි කටයුතු කළ බවද කියවේ.

යුරෝපා සභ්‍යත්වයේ පැරණි ග්‍රීක යුගය තුළ ඇකඩමි, ලයිසියම් වැනි විශිෂ්ට විද්‍යස්ථාන පිහිටා තිබුණද යුරෝපයේ පැරණි යුගයේ විශ්වවිද්‍යාලයන් පිළිබඳ අසන්නට ලැබෙන්නේ ඉතා අඩුවෙනි. නමුත් ආසියාව තුළ මේ වන විට තක්ෂිලා වැනි විශ්වවිද්‍යාලයන් බිහි වී තිබුණි. කෙසේ වෙතත් යුරෝපා සභ්‍යත්වයේ දැනට හමුවන පැරණිතම සරසවිය සේ සලකන්නේ ඉතාලියේ පිහිටි බොලොඤ්ඤෝ සරසවියයි. මෙය ක්‍රි.ව. 11වැනි සියවසේදී පමණ




ආරම්භ වී ඇත. මෙම සරසවියට අමතරව කේම්බ්‍රිජ්, ඔක්ස්ෆර්ඩ්, විටෙන්බර්ග්, පීසා, පැඩුවා එර්පුට් වැනි විශ්වවිද්‍යාලයන්ද යුරෝපය තුළ ක්‍රියාත්මක විය. මේවා අතුරෙන් එංගලන්තයේ ඔක්ස්ෆර්ඩ් සරසවියට වැදගත් ස්ථානයක් හිමි වන්නේ එය ඉංග්‍රීසි භාෂාව හා සම්බන්ධ ලොව පැරණිතම සරසවිය වීම නිසාවෙනි.

කියවීම මිනිසා සම්පූර්ණ කරන බවට විද්වත් මතයක් පවතී. එලෙස මිනිසාගේ කියවීමේ ශක්තිය වැඩි කරන්නට දායක වූ ප්‍රධානම ආයතනය වූයේ පුස්තකාලයයි. දැනට ලොව හමුවන පැරණිතම පුස්තකාලය සේ සලකන්නේ ඊජිප්තුවට අයත් ඇලෙක්සැන්ඩ්‍රියාවේ පිහිටි පුස්තකාලයයි. ක්‍රි.පූ. 03වැනි සියවසේ ජීවත් වූ ටොලමි ෆිලඩෙල්ෆස් නම් පාලකයා දවස මෙම පුස්තකාලය ආරම්භ වන්නට ඇතැයි විශ්වාස කරනු ලැබේ. ආසියාව තුළ දක්නට ලැබුන පුස්තකාල අතුරෙන් නාලන්දා විශ්වවිද්‍යාලයේ පුස්තකාලයට හිමි වන්නේද විශේෂ වැදගත්කමකි. එය කොටස් තුනකින් සමන්විත විය. ඒ, රත්නෝදදී, රත්න රංජනි හා රත්න සාගරි වශයෙනි.

සමාජය තුළ ජීවත්වන පුද්ගලයා සංස්කෘතික මිනිසෙකු ලෙස වර්ධනය කිරීමට ඔහුගේ හෝ ඇයගේ රසාඥතාවය වැඩිවීමද ප්‍රබල හේතුවක් වන්නේය. යුරෝපා සංස්කෘතියේ මෙන්ම ආසියා සංස්කෘතියේද පුද්ගලයාගේ කලා රසාඥතාවය වර්ධනයට හේතු වූ විෂයක් වූයේ නාට්‍යයයි. යුරෝපා සභ්‍යත්වයේ නාට්‍යකරණයේ පියා සේ සලකන්නේ සොෆොක්ලීස්ය. ඔහුට අමතරව යුරිපිඩීස්, ඊස්කිලස්, ඇරිස්ටොෆනීස් ප්‍රබල නාට්‍යවේදීන් මේ සභ්‍යත්වය තුළ ජීවත් වූ ප්‍රබල නාට්‍යවේදීන්ය. ඔයිඩිපස් රෙක්ස්, ඇන්ටිගන් වැනි සොෆොක්ලීස්ගේ නාට්‍යයද ෆ්‍රොග්ස් ද ක්ලවුඩස් වැනි නාට්‍ය නිර්මාණද මිනිසාගේ සංස්කෘතික ජීවිතය පොහොසත් කිරීමට සමත් වූ නිර්මාණයන්ය. මොවුන් අතින් ශෝකාන්ත නාට්‍යය මෙන්ම සුඛාන්ත ස්වරූපයේ නාට්‍යයද රචනා වී තිබේ. හෝමර්, පින්ඩාර්, සැෆෝ වැන්නවුන්ගේ ගේය කාව්‍ය නිර්මාණයන්ද මිනිසාගේ භාවාත්මක ජීවිතය වර්ධනය කිරීමට ඉවහල් වී ඇත. හෝමර් නම් මහා කවියා රචනා කරන ලද ඉලියඩ් හා ඔඩිසි මහා කාව්‍යය දෙක මිනිසා සංස්කෘතික වශයෙන් වර්ධනය කිරීමට දායකත්වයක් සැපයූ නිර්මාණයෝ වෙති.

මිනිසා තුළ ගොඩනැගෙන කලා හැකියාවන්ද ඔවුන් සංස්කෘතික ජීවීන් බවට පත් කිරීමට රුකුලක් වෙයි. පුරාතනයේ මිනිසුන් තම කලා හැකියාවන් ඔප් නංවමින් විවිධ දෑ නිර්මාණය කළහ. මිසරයේ දක්නට ලැබෙන මහ දැවැන්ත පිරමීඩත් ශ්‍රී ලාංකේය භූමියේ දක්නට ඇති ජේතවනාරාමය වැනි දැවැන්ත චෛත්‍යය නිර්මාණත් ඒ අතර සුවිශේෂී ගෘහ නිර්මාණයන් වෙයි. දෙවියන්, සත්වයන්, පාලකයන් මෙන්ම සාමාන්‍යය මිනිස් රූප මූර්තිමත් කිරීමට ලොව පුරා ජීවත් වූ කලාකරුවන් ක්‍රියා කර ඇත්තේ ඔවුන් ක්‍රමානුකූලව සංස්කෘතික ජීවිතයකට පරිවර්තනය වීමත් සමගය.

මානව ඉතිහාසයේ සංස්කෘතියේ මනා පැවැත්ම සඳහා නීති රීතිද සැලකිය යුතු බලපෑමක් කරනු ලැබ තිබේ. ලෝක ඉතිහාසයේ අපට හමුවන පැරණිම නීති සංග්‍රහයක් සේ සලකන්නේ හමුරාබි නීති සංග්‍රහයයි. එය පැරණි ශිෂ්ටාචාරයන්හි පැවති නීති සම්ප්‍රදායක් විය. පුරාණ රෝම සභ්‍යත්වයේ අංශ 12ක් යටතේ නීති පද්ධතියක් ක්‍රියාත්මක වූ අතර ඒවා රෝම සභ්‍යත්වයේ ඉදිරි ගමනට බලපෑමක් කරනු ලැබීය. වර්තමානයේ ලංකාවේ පවා ක්‍රියාත්මක වන රෝම ලන්දේසි නීතියට බලපෑමක් කර ඇත්තේද මේ නීති සම්ප්‍රදායයි. මෙවැනි තත්වයන් මිනිසා සංස්කෘතික සත්වයෙක් බවට පත් කිරීමට ප්‍රබල බලපෑමක් සිදු කළ අතර එම තත්වයන් මානව ඉතිහාසයේ ප්‍රගමනයටද දැවැන්ත දායකත්වයක් සපයා ඇති බව ප්‍රකාශ කළ හැකිය.




# දැනුමෙන්ඔබ්බට



## නිතරම ළඟ තබා ගත යුතු වැකිය

මේ හෝඩුවාව සොයාගෙන ඇත්තේ මනෝවිද්‍යාඥයින් යුවලක් විසිනි.
ඔවුන් දෙදෙනාද විවාහ වීමෙන් වසර 35ක් පමණ සතුටින් එකට ජීවත් වූ යුවලක්.
ඔවුන්ගේ විෂය පථය couple therapy එහෙමත් නැතිනම් විවාහ වූ හෝ විවාහ වීමට සිටින හෝ අය අතර ඇති විවිධාකාරයේ මතභේදයන්ට, සිත්රිදීම් හෝ නොගැලපීම් සඳහා මනෝවිද්‍යාත්මක ප්‍රතිකාරයන් සිදු කිරීමයි.
මේ මනෝවිද්‍යාඥයින් යුවල වසර 50ක පමණ තම සේවා කාලය තුළ ඔවුන්ට හමුවූ යුවල 40,000ක් පමණ විමර්ශනයට ලක්කර ඒ අතරින් සාර්ථකව සම්බන්ධතාවයන් පවත්වන්නට හැකි වූ අයගේ රහස ඔවුන් අනාවරණය කරගෙන තිබේ.
ඒ සාර්ථක සම්බන්ධතාවයන් පසුපස තිබී ඇත්තේ එක් වාක්‍ය කණ්ඩයකි. මේ නොම්මර එකේ වාක්‍ය කණ්ඩය අන් යමක් නොව “බොහොම ස්තුතියි” යන්නයි.
මනෝ විද්‍යාඥයින් යුවල පෙන්වා දෙන පරිදි “බොහොම ස්තුතියි” යන වචන කණ්ඩය සංකේතවත් කරන්නේ එක් අයෙකු විසින් අනෙකා අගය කිරීමේ මනෝභාවයයි.
“අපේ සහකරුවන් නොකරන දේ දැකීමට අපි හරි සමත්. නමුත් නොකරන දේ නොව කරනු ලබන හොඳ මෙන්ම නරක දැකීමටත් හොඳ දේ අභියස නොපැකිලව අගය කිරීමත් අවශ්‍යයි... නොසිඳෙන සබඳතාවයකට අනෙකාව උද්‍යෝගිමත්ව අගය කිරීමේ සංස්කෘතියක් ඔවුන් අතර තිබිය යුතුයි.” මනෝ විද්‍යාඥයින් යුවල පෙන්වා දෙයි.
“බොහොම ස්තුතියි”.

# දැනුමෙන්ඔබ්බට



## මිනිසුන් ජීවත්කරවන මානව බැඳීම්

1938 වසරේ එංගලන්තයේ හාවඩ් විශ්වවිද්‍යාලයේ දෙවන වසරේ ඉගෙනුම ලබමින් සිටි සිසුන් අතරෙන් 268 දෙනෙකු පාදක කරගෙන ඔවුන්ගේ සෞඛ්‍ය තත්වය කෙබඳුවේ දැයි අධ්‍යයනය කරන පර්යේෂණයක් ඇරඹිණි.

විශ්මයට කරුණ නම් මෙම පර්යේෂණය අරඹා දශක අටක් ගතවුවත් අදටත් ක්‍රියාත්මක වීමයි.

ඔවුන් අතරින් අදට ජීවතුන් අතර සිටින්නේ 19 දෙනෙකු පමණි. ඔවුන් දැන් වසර 95 ආසන්නයේ දිවි ගෙවති.1938 දී තෝරාගත් මේ පිරිසට අයත් වූයේ පිරිමි පුද්ගලයන් පමණක් වූ අතර පසුව ඔවුන්ගේ දුවා දරුවන්ද මේ පර්යේෂණය සඳහා ඇතුළත් කරගැණිනි. ඔවුහු සංඛ්‍යාවෙන් 1300ක් පමණ වන අතර දැන් 50-60 වයසවල ජීවත් වෙති.

ඉහතින් සඳහන් කළ පරිදි මේ පර්යේෂණයට ලක්වූවන් අතුරින් සමහරක් දෙනා මියගියහ. තවත් සමහරු විවිධ රෝගාබාධවලට ගොදුරු වූවෝය. සමහරු මානසික රෝගීහුය; මත්පැන්වලට ඇබ්බැහිවූවෝය.

රෝගී වූ මෙන්ම නිරෝගීව ජීවත්වන මොවුන් ව්‍යාපාරිකයින්, වෛද්‍යවරුන්, දේශපාලඥයින් ආදී විවිධ වෘත්තීන්ට අයත් වූවන්ය.

මේ දශක අට තුළ මොවුන්ගේ විවිධ තොරතුරු එක් රැස්කර ගනු ලැබ තිබේ. ජීව දත්ත, මත විමසුම්, ලේ පරීක්ෂා මෙන්ම සීටී ස්කෑන් වැනි පරීක්ෂණද ඒ අතර වේ.

මේ පරම්පරා තුනක අධ්‍යයනයෙන් අනාවරණය වූ විශේෂතම කාරණය ලෙස පර්යේෂකයින් ප්‍රකාශ කරන්නේ ශාරීරික මෙන්ම මානසික සෞඛ්‍යයේ යහපත් බවට හා දිගු ආයුකාලය සඳහා විශාල දායකත්වයක් සපයා ඇත්තේ තෘප්තිමත් මානව බැඳීම් බවයි.

මුදල්, දේපළ හෝ තාන්න-මාන්න ආදියට වඩා ප්‍රේම සබඳතා, සාර්ථක විවාහ සබඳතා, මිත්‍රත්වයන්, පවුල් සබඳතා, වෘත්තීමය මෙන්ම ක්‍රීඩා හා සමාජ කටයුතුවලදී ඇතිවන බැඳීම් හා ශක්තිමත්නම් සතුටින්, තෘප්තිමත්ව හා සෞඛ්‍ය සම්පන්නව වැඩි ආයු කාලයක් ජීවත්වීමේ හැකියාව ඇති බව මේ දීර්ඝ පර්යේෂණයෙන් අනාවරණය වී තිබේ.

# දැනුමෙන්ඔබ්බට



## Hanging Coffees

ස්ටොක්හෝම් නගරයේ සිටි කාලයේදී, නිතර ගිය පොඩි කෝපි කඩයක් තිබිණි.
දිනක් මා එහි සිටින විටදී, දෙදෙනෙක් කවුන්ටරය ළඟට පැමිණ,
"කරුණාකර කෝපි පහකට මුදල් ගන්න, අපට දෙකයි, Hanging Coffees 03 යි..."
ඔවුහු මුදල් ගෙවා, ඔවුන්ගේ කෝපි දෙක රැගෙන පිටත් වූහ.
Hanging Coffees කියන්නේ මොනවද?" මම වේටර්ගෙන් ඇසීමි.
"ඉන්න, ඔබට දැනගන්න පුළුවන් තව ටිකකින්" ඔහු කීය.
මේ කාලය තුළ තවත් සමහරු පැමිණ කෝපි පානය කර පිටව ගියහ...
තවත් කෝපි ඇණවුමක් ලැබිණි. එය කෝපි 07ක් සඳහා වූ අතර, එය කාන්තාවන් තිදෙනෙකු විසින් ඉදිරිපත් කරන ලදී. ඒ ඔවුන් සඳහා 03ක් සහ Hanging Coffees 04ක් ලෙසය.
මට නැවතත් ඇති වූයේ පුදුමයකි. මේ Hanging Coffeesවල තේරුම කුමක්දැයි මම කල්පනා කරන්නට වීමි.
හදිසියේම, යාචකයකු පැමිණ (ඔහු නිවාස නොමැති කෙනෙකු මෙන් පෙනිණි) කවුන්ටරය වෙත පැමිණ නිර්ව්‍යාජව මෙසේ ඇසීය.
"ඔබලා ළඟ Hanging Coffee තියෙනවද...?"
"ඔව් අපි ළඟ තිබෙනවා." මුදල් අයකැමි තරුණයා එසේ පවසා ඔහුට කෝපි එකක් නිකුත් කළේය.
මෙම සුප්‍රසිද්ධ 'Hanging Coffees' ගැන මා නොදැන සිටි පිළිතුර ලැබුණි.
මිනිසුන් කෝපි වෙනුවෙන් කල්තබා ගෙවනුයේ, උණුසුම් පානයක් ලබා ගත නොහැකි ඕනෑම කෙනෙකුට ලබා ගැනීම පිණිසය.
මෙම සම්ප්‍රදාය ඉතාලියේ නේපල්ස්හි ආරම්භ වූවකි. පුදුම සහගත ලෙස එය ලෝකයේ නගර පුරා ව්‍යාප්ත වී ඇත. 'Hanging Coffees' පමණක් නොව සැන්ඩ්විච් හෝ අඩු වියදම් ආහාර වේලක්ද කෙනෙකුට ඇණවුම් කර මුදල් ගෙවා පිටව යාම කළ හැකිය.
තමා ගෙවූ කෝපි පානය ලබාගන්නා පුද්ගලයා කවුරුන්දැයි ඔවුන්ට දැන ගැනීමට අවශ්‍ය නැත. තමන් මුදල් ලබාදුන් බව පෙන්වීමට වුවමනාවක් නැත. තමන් වෙනුවෙන් මුදල් ගෙවූයේ කවුදැයි ලබාගත් පුද්ගලයා දන්නේද නැත. අදෘශ්‍යමාන මානව බැඳීමක් ක්‍රියාත්මක වනවා පමණි.

# දැනුමෙන්ඔබ්බට

## හෘදසාක්ෂියේ නඩු තීන්දුව

"මේ අවුරුදු පහළොවක කොල්ලෙක්...! කඩේකින් පාන් සහ චීස් රොටියක් සොරකම් කරද්දී අහුවුණේ. මුරකාරයගෙන් බේරිලා යන්න හදද්දි ගබඩාවේ රාක්කෙකුත් කැඩිල ගිහින්...."

අධිකරණයේ දිගහැරුණු නඩුවේදී අපරාධය ඇසූ විනිසුරු ළමයාගෙන් මෙසේ ඇසීය.

"ඔබ ඇත්තටම පාන් සහ චීස් රොටි සොරකම් කළාද...?"

"ඔව්!" පිරිමි ළමයා බිම බලාගෙන පිළිතුරු දුන්නේය.

විනිසුරු, "ඇයි...?"

කොලුවා, "මට ඒක ඕනෙ වුණා."

විනිසුරු, "ඔබට මිලදී ගන්න බැරිද...?"

කොලුවා, "සල්ලි තිබුණේ නැහැ."

විනිසුරු, "ඇයි ගෙදරින් සල්ලි ඉල්ල ගත්තෙ නැත්තේ?"

කොලුවා, "ගෙදර ඉන්නේ අම්මා විතරයි. එයත් අසනීපයෙන්. රස්සාවක් කරන්නේ නැහැ."

විනිසුරු, "ඔබ රැකියාවක් කරන්නේ නැද්ද...?"

කොලුවා, "ඉස්සර කාර් එකක් හේදුවා. අසනීපයෙන් ඉන්න අම්මව බලාගන්න දවසක් නිවාඩු ගත්තා කියල මාව අයින් කළා."

විනිසුරු,"ඔබ කාගෙන්වත් උදව් ඉල්ලුවේ නැද්ද?"

කොලුවා, "උදේ ඉඳන් ගෙදරින් පිටවෙලා, පනස් දෙනෙක් විතර ළඟට ගියා. ඒත් උදව්වක් ලැබුණේ නෑ. ඒ හින්දා... අන්තිමේදී මම මේ තීරණයට ආවා."

ප්‍රශ්න කිරීම් අවසන් වූ පසු, විනිසුරුවරයා තීන්දුව ප්‍රකාශ කිරීමට පටන් ගත්තේය.

"සොරකම් කිරීම සහ විශේෂයෙන් බඩගිනි පිරිමි ළමයෙකු විසින් පාන් සොරකම් කිරීම ඉතා නින්දිත අපරාධයක් වන අතර, මෙම අපරාධයට අප සියල්ලෝම වගකිව යුතුයි...

මා ඇතුලු උසාවියේ සිටින සෑම පුද්ගලයෙක්ම වැරදිකරුවන් සහ අපරාධකරුවන් වන බැවින්, මෙහි සිටින සෑම පුද්ගලයෙකුටම ඩොලර් දහය බැගින් දඩ නියම කෙරෙනවා. ඩොලර් දහයක් නොදී කිසිවෙකුටත් මෙතැනින් යන්න බැහැ....!"

මෙසේ පැවසූ විනිසුරුවරයා තම සාක්කුවෙන් ඩොලර් දහයක් සහ පෑන අතට ගෙන, ලයිස්තුවේ පළමුවෙන් තමාගේ නම ලියන්නට පටන් ගත්තේය.

"ඊට අමතරව, බඩගිනි ළමයෙකු පොලිසියට භාර දීම නිසා, මෙම පාන් කඩයට ඩොලර් දහසක් දඩ ගසමි... පැය 24ක් ඇතුළත දඩ මුදල තැන්පත් නොකළහොත්, ගබඩාවට මුද්‍රා තැබීමට උසාවිය නියෝග කරනවා...

එසේම, බඩගින්නේ සිටින පිරිමි ළමයෙකු උසාවියට ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් පොලීසියට ඩොලර් දහසක මුදලක් දඩ නියම කරනවා...

මේ දරුවාට සම්පූර්ණ දඩ මුදලම දීලා, උසාවිය ඒ ළමයාගෙන් සමාව ඉල්ලනවා...!"

තීන්දුව ඇසීමෙන් පසු, උසාවියට පැමිණ සිටි අයගේ දෙනෙත්වලින් කඳුළු වැගිරෙන්නට විය.

ඒ ළමයාගේ මාංචුද ගලවා දැමිණි.

ළමයාද කඳුළු සඟවා ගත් විනිසුරුවරයා දෙස විටින් විට බැලුවේය.

art ආර්ට්



# පැකේජය

**කීර්ති වැලිසරගේ**

මම විවෘතව තිබූ දොරටුවෙන් මත්ස්‍ය ප්‍රදර්ශනාගාර පරිශ්‍රයට ඇතුල් වීමි.

පාර අද්දර සුවිසල් නාම පුවරුවේ,'Millennium Aquarium' ලෝහිත දීප්තියකින් ඔප් නැංවුණ වචන දෙකට පහළින්, නීල ජල තටාකයක හරිත ජලජ ශාක අතරින්, වා බුබුලු නංවමින් පිහිනා යන අත්‍යාලංකාර මත්ස්‍ය යුවළකගේ හා දෙදෙන වට කොට පිහිනා යන කුඩා මත්ස්‍ය සමූහයක මනස්කාන්ත දර්ශනයක් වේ. ප්‍රදර්ශනාගාරය විවෘතව තැබෙන වේලාව ලෙස සඳහන්ව ඇත්තේ පෙරවරු දහයේ සිට පස්වරු පහ දක්වා වන කාල පරාසයයි. වේලාව දොළහමාර පසුවෙමින් තිබේ. එහෙත් කිසිවෙකු පැමිණ ඇති බවක් නොපෙනේ.

මා පැමිණියේ රුචිරගේ ඇණවුමෙනි. 'ඔතෙන්ට ඕන නම් වැඩිම වුණොත් ඔයාගෙ ඔෆිස් එකේ ඉඳන් කිලෝ මීටර තුනක් ඇති. විනාඩි දහයෙ ගමන.' ඔහු වැඩි දුරටත් කියා සිටියේ ය. සුරතල් මසුන් ගැන කිසිදු උනන්දුවක් නැති මා, යා යුත්තේ ඇයිදැයි විමසූ විට ඔහුගේ කෙටි පිළිතුර වූයේ, 'ගිහින් බලන්න' යන්න පමණි. දින දෙකකට පසු 'ගියාද?'යි ඔහු නැවත කෙටි විමසුමක් කර තිබිණි. යන්නට බලාපොරොත්තු වන බවට පිළිතුරු සැපයුවත්, ඒ සඳහා අවකාශය පාදා ගන්නට මට තවත් සතියක කාලයක් වුවමනා විණි. මොකක් හරි දෙයක් ඇති. නැත්තන් රුචිර දෙවෙනි වතාවටත් මතක් කරන්නෙ නැහැ.

මා ඇතුල් වනු දුටු මුර කුටිය අසල හුන් ආයතනයට සම්බන්ධ යැයි සිතිය හැකි පුද්ගලයෙක් ප්‍රවේශ පත්‍ර කවුන්ටරය පෙන්වා සිටියේය. ඉන් එහා වූයේ සුරතල් මසුන් අලෙවි සැලය. එහි වීදුරු ටැංකිවලින් වැඩි හරියක් හිස් බව බැලූ බැල්මටම පෙනී ගියේය. කුඩා දරුවෙකු සමඟ ඉන් පිටතට ආ පුද්ගලයෙක් දොරටුව දෙසට යයි. හැඬුම්බර මුහුණින්, දරුවා ගාටන්නේ බලාපොරොත්තු කඩ වූ විලාසයක් පෙන්වමිනි.

මා විමතියට පත් කරවමින්, අසල මේසයක පරිගණකයක් ඉදිරියේ කිසියම් කාර්යයක නිරතව සිටි යුවතිය, තමන් කරමින් සිටි කාර්යය අතරමඟ නවත්වන්නට සිදුවීමෙන් ඇතිවූ කරදරකාරී බව මුහුණින් පළ කරමින් පැමිණ, මට ලබා දුන් ප්‍රවේශ පත්‍රයේ මිල රුපියල් දහසක් විණි. මඳක් තාවර වුව ද, ආපසු හැරිය නොහැකි බැවින් මම ඊට මුදල් ගෙවීමි. දාහක්!

මා ආපසු එනතුරු තරමක නොඉවසිලි සහගත බවකින් බලා හුන්, මට කවුන්ටරය පෙන්වූ පුද්ගලයා, මා රැගෙන ආ ප්‍රවේශ පත්‍රය ඉල්ලා, ඉන් කොටසක් කඩා ගෙන, ඉතිරිය මා අත තබමින් මට සුබ පැතුවේය.

"මිස්ටර්?" "ටෙරන්ස් මාලිම්බඩ''

"ඕ - මිස්ටර් මාලිම්බඩ - මම තලිතරත්න - මිස්ටර් මාලිම්බඩ මොකක් හරි ආයතනයකින් ද - නැත්නම්?"

"නෑ - නෑ- මම - මට පෞද්ගලිකව පොඩ්ඩක් බලන්න විතරයි." "හරි -හරි මිස්ටර් මාලිම්බඩ - අපි ඉස්සෙල්ල බලල ඉමු නේද?"

'ඉස්සෙල්ලා' යි ඔහු කීවේ තවත් යමක් පසුව පවතින බවට තමා තුළ ඇති විශ්වාසයකින් මෙනි. ඔහුගේ වචන ගුප්තාර්ථයක් හැඟවූවත්, මම ඒ ගැන නොතැකීමි.

තලිතරත්න සැරසී සිටියේ දුඹුරු කොඩිරෝයි කලිසමකින් සහ දියෙන් මතුවන මත්ස්‍යයෙකුගේ රුවක් හා ඒ අකුරු ඉස්මතු වූ ළා අළු පැහැයක් ගත් ටී ෂර්ට් එකකිනි. තමා අනුව පැමිණෙන්නැයි මට සන් කරමින් ඔහු ඉදිරියට ගමන් කළේය. මින්මැදුරේ දෝනාව දෙබිතෙහි ඝන වීදුරුවෙන් සෑදුණු කුටීර පේළියෙහි විසිතුරු මසුන් වූවේ කිහිපයක පමණි. ඉතිරිවා හිස්වද, ආලෝකයෙන් තොරවද පැවතිණි. තලිතරත්නට ඒ පිළිබඳ කිසිදු හැඟීමක් ඇති බවක් නොපෙනිණි. අඳුරු ගුහාවක් බඳු එහි වායු සමීකරණ ක්‍රියාත්මක නොවේ. මධ්‍යාහ්නය බැවින් දෝ ග්‍රීෂ්මය සැලකිය යුතු තරම් ඉහළ ගොස් තිබේ. කඩිනමින් වංකගිරිය පසු කරනා තලිතරත්න පසුපසින් මමද වහ වහා ගමන් කොට පිටතට පැමිණියෙමි. ෂූහ්....මා කිසිවක් ගැන ප්‍රශ්න කරතැයි බියෙන් මෙන් එද්දී වරක් හෝ පසුපස නොබැලූ ඔහු, දුරකථන ඇමතුමකට පිළිතුරු දෙමින්ම ඉදිරියට යනු පෙණිනි. හිස් මාළු ටැංකි කිහිපයක් අතරින්, දහදිය වගුරුවා ගෙන ගමන් කිරීමට නම් ඔවුන් මෙපමණ මුදලක් අය කළේ ඇයි? මා තුළ නොසන්සුන් හැඟීමක් ජනිත වුවද, නැවත තලිතරත්න මෙසේ නොනැවතී මා කැටුව යන්නේ කොහිදැයි දැන ගැනීමේ අවශ්‍යතාවද මතු විණි. තවත් ස්වල්ප දුරක් ගමන් කළ ඔහු, දකුණු පස මල් වැලින් ආකූල වූ දිගු ආරුක්කුවක් යටින් මා කැටුව ගොස් එළිමහන් ජල පොකුණු පද්ධතියක් අබිමුව නැවතුණේය.

ඒ නම් අපූරු දර්ශනයකි.

එකිනෙක කුඩා දිය අගලින් සම්බන්ධ වූ, සමබිමෙහි වන පොකුණු වට ගණනාවක්, සැලකිය යුතු බිම් පෙතක් වසා ගෙන එහි විය. මම දහදිය නැගෙන ගෙල ද, නළල ද ලේන්සුව ගෙන පිසදා ගතිමි.

"මේ තමයි මිස්ටර් මාලිම්බඩ තැන"

එපමණක් පැවසූ තලිතරත්න මන්දහාසයකින් යුතුව, ආසන්නයේම වන, පොකුණු වටයේ එක් පොකුණක් දෙස ගිජුව බලා සිටින්නට වූයේය.

මනා ලෙස සැකසූ තිරුවාණ බෝල්ඩරයන්ගෙන්, තෘණ පඳුරින් හා ගැටිය වසා ගෙන පොකුණු කරා නැමුණු ජලාශ්‍රිත හා ජලජ ශාක පදාසයන්ගෙන් සෑදුණු ජල තල මත, ඉවුරු දෙපස තැන තැන වන සිහින් කඳැති ගසින් හා වැල් වියන් අතරින් පෙරී එන හිරු කිරණ දිස්න දිණි. තලිතරත්න නිරීක්ෂණය කරන, බාධාවකින් තොරව හිරු කිරණ පතිත වන පොකුණේ, තද රක්ත වර්ණයෙන්ද, රන්, නිල් හා කහ වර්ණයෙන්ද යුතු අත්‍යලංකාර මත්ස්‍ය යුවළක වට කර ගත් කුඩා මත්ස්‍ය සමූහයක් අපූර්ව චමත්කාරයක් ප්‍රදර්ශනය කරමින් යුහුව පිහිනා යති. ප්‍රවේශ ද්වාරය අසල දුටු දැවැන්ත නාම පුවරුවේද චිත්‍රණය කොට තිබුණේ මේ දැකුමම බව මට මොහොතකින් සිහිපත් විය. කුඩාවුන් මැද මහා යුවළ කැපී පෙණුනු අතර, ඔවුන්ගේ පිට දිගට වන තද නීල වර්ණ වරල අපූර්ව චලනයකින් යුක්ත විය. රෝස මුසු සුදු සහ කහ වර්ණයෙන් යුත් කුඩා පරිවාර මත්ස්‍ය සමූහය ඔවුනොවුන් පරයමින් අයස්කාන්ත දැවැන්ත යුවල හා ස්පර්ශ වෙමින් පිහිනා ගියේය. අප පසුකොට ආ ජලයද, මසුන්ද රහිත බහුතරයක් වූ වංකගිරියේ කුටීර පිළිබඳ කුකුස මසිතින් වහා අතුරුදන් වීමට මේ විචිත්‍රත්වයම ප්‍රමාණවත් විය. එහෙත් මගේ පෙර සිත හඳුනා ගෙන සිටියාක් මෙන් තලිතරත්න ඒ පිළිබඳ කෙටි සඳහනකින්ම කතාව පටන් ගත්තේ ය.

"මිස්ටර් මාලිම්බඩට පේනව ඇති ඇයි අර මින් මැදුර අත්ඇරෙන්න ඇරල තියෙන්න කියල - හේතුව මෙහේ මුළු අවධානෙ දැන් යොමු වෙලා තියෙන්නෙ මේ පැත්තට නිසා - තව පොකුණු වටයක් අලුතෙන් හදා ගෙන යනව එහායින් - මේක අපේ සර්ගෙ - සර් මේ ටිකේ මැලේසියා ගිහින් ඉන්නෙ - මීට කලින් එහෙම කණ්ඩායමක් එක්ක සෑහෙන කාලයක් කරපු පර්යේෂණවලින් පස්සෙ තමයි මෙහෙ ඇවිත් පටන් ගත්තෙ - කෙටියෙන්ම කියනව නම් මේ තුන්වෙනි පොකුණෙ ඉන්නෙ තිලාකාෆ් ජෝඩුවක් - පැටව් රංචුවත් ඒ විශේෂෙම තමයි - තිලාපියා විශේෂෙකුයි - නයිල් තිලාපියා කියල - කාෆ් විශේෂෙකුයි - ක්‍රෑෂන් කාෆ් කියල - ඒ දෙගොල්ලන්ගෙ ජාන තමයි මෙතැනදි භාවිත වෙලා තියෙන්නෙ - පර්යේෂණාගාරයක ජාන තාක්ෂණයේ විශිෂ්ට ජයග්‍රහණයක්! ගොඩක් විස්තර තිබුණට ඒවා අපිට අවශ්‍ය නෑ - මුල් විශේෂ දෙකේම සංකලන ලක්ෂණයි - දෙකේම නැති ලක්ෂණයි - බිහේවියර් එකකුත් එක්ක අමුතුම විශේෂයක් - හැබැයි පේනවනෙ - හැඩේ විතරක් සිල්වර් කාෆ්ලට ටිකක් විතර කිට්ටුයි - මම කිව්වෙ අර බිහේවියර් එකක් -

මොනම මත්ස්‍ය විශේෂයකටවත් නැති - ඒ ඔක්කොම එක්ක අද වෙනකොට ලෝකෙ හැමෝගෙම අවධානෙ දිනාගෙන ඩොලර් මිලියන ගණන් එහා මෙහා වෙන සුපිරි ව්‍යාපාරයක්! මෙහෙ තාම පටන් ගත්ත විතරනෙ"

"දැන් බලන්න මිස්ටර් මාලිම්බඩ මේ දෙන්න වටේ රංචුවත් එක්ක - මේ එක පොකුණු වළල්ලක තියෙනවා එකකට එකක් සම්බන්ධ පොකුණු හයක් - අර තියෙන්නෙ හුඟක්ම හෙවණට පළවෙනි එක - වටේ ගිහින් හය වෙනි පොකුණෙන් ආයෙම පළවෙනි පොකුණට එන්න පුළුවන් - එනව - සම්බන්ධ වෙනව දිය අගල් දිගේ - ඒක චක්‍රයක් - ආයෙම මුල ඉඳන් ගමන - මිස්ටර් මාලිම්බඩ එන්න ඇත්තෙ තොරතුරකටනෙ - අනවශ්‍ය ප්‍රසිද්ධියක් කොහොමටවත් දෙන්නෙ නෑ - තොරතුරු වුණත් - මොකද අවශ්‍ය කෙනා - ආයතනෙ එනව - අපේ වෙබ් සයිට් එකෙත් යම් සීමාවකට විතරයි තොරතුරු තියෙන්නෙ - සර් මේ ගමන ගිහින් ආවට පස්සෙ මින් මැදුර ගලවල ප්‍රදර්ශන පොකුණු චක්‍රයක් එතැනත් හදන්න තමයි සැලසුම් වෙලා තියෙන්නෙ - සාමාන්‍ය සේල්ස් සෙක්ෂන් එකත් වැහිල."

තලිතරත්න නොකඩවා විස්තර කරයි. රුචිරගේ ඉල්ලීම හැරුණු කොට මෙහි ඒමට වෙනත් කිසිදු හේතුවක් නොතිබුණු බව ඔහුට කීමේ තේරුමක් නැත. එහෙත් ඔහුගේ විස්තර කිරීමෙන් අනතුරුව හට ගත් කුහුලින් යුක්තව මම පොකුණ වඩාත් උනන්දුවෙන් නරඹන්නට වීමි.

තිලාකාග් යුවළද, ඔවුන්ගේම වරල් සමුදායක් මෙන් චලනය වෙමින් ඇදෙන කුඩා මසු පරිවාරයද, කෙනෙකු සිත වහා ඇද ගන්නේ කාන්දම් බලයකින් මෙනි. ජලජ ශාකවල මෙන්ම, ඉතා අඩුවෙන් වැටෙන රුක් සෙවණැලිවලද, දිදුලන ඡායා පතිත වූ පොකුණු පත්ලේ සුදු වැල්ල, නිල් පළිඟුවක් වන් ජල තලය විනිවිද පැහැදිලිව දර්ශනය වේ.

"මේ ජාතිය විතරද මිස්ටර් තලිතරත්න මේ පොකුණුවල ඉන්නෙ?"

විසිතුරු මත්ස්‍ය ලොව අප්‍රමාණ විවිධත්වය වෙනුවට මේ එකම මත්ස්‍ය විශේෂය පමණක්? මගේ ප්‍රශ්නයට තලිතරත්නගේ පිළිතුර වූයේ, තරව පියවුණු දෙතොලින් යුත් මුවෙහි ගන්වා ගත් වටහා ගත නොහැකි මඳ සිනාවක් පමණි. ඉවසීමෙන් සවන් දෙන්නැයි කෙරෙන ආයාචනයක් සහිත බැල්මක් ඔහුගේ දෙනෙත්වල සටහන් විණි. අනතුරුව කතා කරන්නට පටන් ගත් ඔහුගේ වචන මගේ ප්‍රශ්නයට පිළිතුරු නොව, ඔහුගේ විස්තරයේම දිගුව බව පැහැදිලි විය.

"හරි - මේ තුන්වෙනි පොකුණෙ මේ ඉන්න මාළු ටික බලල කවුරු හරි හැරිල යනව නම් ඒකෙන් විතරක් මේකෙ විස්මය තේරුම් ගන්න බෑ - අවම වශයෙන් රංචුව වට දෙක තුනක් යන තුරු නිරීක්ෂණේ කළොත් විතරයි ඒක යම් තරමකට වත් තේරුම් ගන්න පුළුවන් වෙන්නෙ - ඒකට සති දෙක තුනක් වත් ඕනෙ - සමහර විට ඊට වැඩි වෙන්නත් පුළුවන් - ඒක කරන්න අමාරුයි - ඒ නිසා මම පැහැදිලි කරල දෙන්නම්"

මා මවිත කරවමින් තලිතරත්න කියා සිටියේය. තව? ඔහුගේ බැල්ම, ස්වරය හා ඉරියව් සියල්ලේ උනන්දුව හා විෂය ආසක්තය උතුරා යමින් ඇත.

"දැන් සමහරක් වෙලාවට රංචුව දවසක් වගේ - සමහර වෙලාවට ඊටත් වැඩි කාලයක් එකම පොකුණෙ ඉන්නව - සමහරක් දාට පොකුණු දෙක තුනකට වුණත් මාරු වෙන්න පුළුවන් - ඒකට බලපාන හේතු අතරේ ටෙම්පරේචර් එකත් ප්‍රධානයි - මුල් පොකුණු දෙකට වැඩියි මේකෙ රස්නෙ - ගස් හෙවණ යොදල තියෙන්නෙ - පළවෙනි එකේදි හොඳටෝම හෙවණ - පස්සෙ අඩු වෙවී සූර්යාලෝකෙ ක්‍රමයෙන් වැඩිවෙන්න - ඊළඟට පහේ ඉඳන් අඩු වෙන්න පටන් ගෙන ආයෙ මුලට එන්න -

දැන් මිස්ටර් මාලිම්බඩට පේනව නේද මේ හැම පුංචි ඇයොම වගේ මේ ලොකු දෙන්නගේ දෙපැත්තෙන් ගෑවි ගෑවි යන හැටි - එහෙම ස්පර්ශ වෙවී යන්නෙ බෙදිල කියල තමයි කියන්නෙ - ඒ කියන්නෙ ධේනුව වටේ පිරිමි පැටවුනුයි පිරිමි තිලාකාග් වටේ ගැහැනු පැටවුනුයි... එහෙම ආකර්ෂණයක් තියෙනවලුනෙ... මෙහෙම කට්ටිය ගෑවි ගෑවි ජීනන්නෙ හරිම ප්‍රමෝදෙකින් - ඒක පේනව - මහ දෙන්නත් ඒකට ඉඩ දීගෙන ඉන්නෙ හරියට දරු පැටවු ටිකක හුරතලයක් ඉවසගෙන ඉන්න අම්ම තාත්තෙක් වගේ - දරු පැටවීම තමයි. ඒත් ඒක හුරතලයක් ඉවසන හැටියට ගත්තොත් වැරදියි - එතැන තියෙන්නේ වෙන දෙයක් - බැලූ බැල්මට කොහොමටවත් පේන්නෙ නැති අරුමයක් ඔතන සිද්ධ වෙනව - ඒක තමයි ඇත්තටම වෙන දේ - ලොකු තිලාකාග් දෙන්නගෙ ඇඟ ඇතුළෙන් පිට කරන ශ්‍රාවයක්... කියන්නෙ ජීරක එන්සයිමයක් - ඒක ජෙලි වගේ කොරපොතු අස්සෙන් ගලාගෙන එනව - ඒකෙ තමයි ආකර්ෂණේ තියෙන්නෙ - ඒක තවර ගන්න තමයි පුංචි ඇයො ඔහොම ඇතිල්ලෙන්නෙ - ඒකෙන් වෙන්නෙ පුංචි ඇයොන්ගෙ

ශරීර ඇතුළට ඒ එන්සයිමය ගිහින් ඒගොල්ලො ජීරණේ වෙලා පිටවෙන සාරය ලොකු දෙන්න කොරපොතු අස්සෙන්ම අවශෝෂණය කර ගන්න එක - ඒක නොකඩවා සිදු වෙවී මේ පොඩි අය අහෝසි වෙනව - අලුත් අය එකතු වෙනව - ඒගොල්ලත් ඒ වගේම තමයි - මේ ජීරණ අවශෝෂණ ක්‍රියාවලිය සිද්ධ වෙන්නෙ දෙගොල්ලන්ගෙම මනෝ රසායනිකයකුත් ක්‍රියාත්මක වෙලා කියල තමයි කියවෙන්නෙ - දැන් මේ ජෝඩුව ආරම්භෙ ඉඳන්ම ඉන්න ජෝඩුවලින් එකක් - තව තුනක ඉන්නව මෙහෙදිම හැදිච්ච ජෝඩු -

"ආරම්භෙ ඉඳන් කිව්වෙ - කොච්චර කාලයක්ද දැන් මේ ලොකු ජෝඩුවට?"

"ගේනකොටත් ඇති මාස හය හතක් - දැං ගෙනල්ලත් අවුරුද්දකට කිට්ටුයි - එතකොට මෙච්චර විශාල නෑ..."

"මේ දෙන්න හැමදාම ඉන්නවද?"

මා ඇසුවේ ක්ෂණිකව සිතෙහි මතු වූ ඊළඟ ප්‍රශ්නයයි. "හැමදාම කිව්වෙ මිස්ටර් මාලිම්බඩ?

"මැරෙන්නෙ නැද්ද?"

මගේ දෙවන පැනයත් සමඟම ඇති වූ තැතිගැන්මක් බඳු හැඟුමකින් මමම මොහොතකට සැලී ගියෙමි. එහෙම වෙන්න බෑ - මම මොනවද මේ හිතන්නෙ? අහන්නෙ? තලිතරත්නගේ දෑස් මොහොතකට කුඩා විණි. මහ තිලාකාෆයන්ගේ ආයුෂ ගැන ඔහුට සූදානම් පිළිතුරක් නැති බව ඔහුගේ ඊළඟ වචනවලින් පැහැදිලි විය.

"ආ - නෑ - මේ තාම නම් එහෙම අවස්ථාවක් ගැන දැන ගන්න නෑ - ඇත්තම කියනව නම් මිස්ටර් මාලිම්බඩ අපේ සර්ගෙන් එහෙම දෙයක් ගැන කියවෙලා නෑ - මේ අය ගැන තියෙන විස්තරයක වත් දැකල නෑ - ඒත් මට හිතෙන විදියට කවදහරි මැරෙනව ඇති - එහෙම නොවෙන්න බෑනෙ... ඒත් අසාමාන්‍ය ජීවිත කාලයකට පස්සෙ... ප්‍රශ්නෙ තියෙන්නෙ ඒක හරියටම කියන්න නම්..."

ඒ වචනත් සමඟම තලිතරත්න, ඔහුගේ 'සර්' මඳක් ඈත සිට, ඉඟට ගසා ගත් දෑතින් ඔහු දෙස බලා සිටිනු දුටුවාක් මෙන්, අවුලට පත් වූ බවක් පෙණිනි. එහෙත් ඔහු එය ව්‍යාජ සිනහවකින් වසා ගෙන යළි පුරුදු විස්තරයට වහා අවතීර්ණ වූයේය. නුවුවමනා දේ හාරා අවුස්සන්නට යාමෙන් ඇති ඵලය කුමක්ද? මා ගැනම උපන් නුරුස්නාවකින් මම හැකිළී ගියෙමි.

"දැං මිස්ටර් මාලිම්බඩ මේ පුංචි ඈයො මං කිව්වෙ එක පාරට දකින්න බෑ - කැමැත්තෙන්ම තමයි එහෙම - අර - ඇතිල්ලෙන්නෙ - ජේනවද? ඒ ස්පර්ශයේ - අර ජෙලි එක තවර ගන්න එකේ සුවයක් - වින්දනයක් හරි සුවඳක් හරි මොකක්ම හරි ඇති - ඔන්න දැන් මේ දෙන්න කට්ටියත් අරන් ඊළඟ පොකුණට යන්න හදන්නෙ - මෙහෙම යන අතරෙම මේ ගල් ගාල් අයින්වලම අභිජනනෙත් සිද්ධ වෙනව - වැඩී ගෙන එනකොට ඒ කණ්ඩායමුත් සංක්‍රමණෙට එකතු වෙනව -

කොහොම වුණත් ලොකු දෙන්නට ළං නොවී, නොගෑවී වැඩෙන්නේ ඉතාම කලාතුරකින් රංචුවෙන් ඈත් වෙන එක්කෙනෙක් දෙන්නෙක් විතරයි - එහෙම කෙනෙක් අඳුන ගත්තම අපිට පුළුවන් එයාව වෙන් කරගන්න - හොඳට වැඩුණම ඒ අයගෙන් ජෝඩුවක් තව පොඩි රංචුවක් එක්ක අලුත් පොකුණකට දාගන්න පුළුවන් - හැබැයි එහෙම එක්කෙනෙක් හැදෙන සම්භාවිතාව දහ දාහකට එක්කෙනෙක් - සමහර විට ඊටත් වැඩි ගාණකට එක්කෙනෙක් වෙන්නත් පුළුවන් - දුර්ලභයි."

මම ගල් ගැසී ගත් වන ම, වියළී යන දෙතොල් දිවෙන් තෙමා ගැනීමට යත්න දැරීමි.


"අර මං කලින් කියපු දේ - ආයෙත් එතැනට ආවොත් ඒක මායාවක් වගේ - පොඩි ඈයො ටික ලොකු දෙන්නට එහෙම ස්පර්ශ වෙවී යනකොට දිගට බලා හිටියොත් ජේනව අන්තිමේ පොඩි උන්ගෙ පිට කවචෙ විතරයි - ඇතුළෙ මාංශමය කොටස් ඔක්කොම ක්ෂය වෙලා අන්තිමේ කටු ටිකෙත් සාරය උරා ගත්තට පස්සෙ - එතකොට ප්‍රාණයක් නෑ - පුංචි සබන් බුබුලක් වගේ අහෝසි වෙලා යනව - අර ඉන්නව නේද දෙන්නෙක් - සුදුවට - හිටියට තව ටික වෙලාවයි - එහෙම වුණාට අලුත් කණ්ඩායම් එකතු වෙන නිසා අඩුවක් ජේන්නෙවත් වෙන්නෙවත් නෑ - ලොකු අය පැලෑටියක් - අපි දාන කෑම ටිකක් කටට ගත්තට පෝෂණේ සම්පූර්ණයෙන්ම අර විදියට තමයි - ඒකනෙ මේ පෙනුම - ශක්තිය ඔක්කොම - දැන් අපි බිස්නස් එක හැටියට කරන්නෙ මිස්ටර් මාලිම්බඩ සාමාන්‍යයෙන් කරනව වගේ මාළු ජෝඩුවක් ටැංකියක් විකුණනව වගේ - ටිකට් විකුණගන්න මොන්ටිසෝරි ළමයි එනකල් බලන් ඉන්නව වගේ නෙමෙයි - ඒ කලින් - මෙතන පාරෙ තිබුණු සෙල්ලම් බඩු කඩ ඔක්කොම ගලවන් ගිහින් - මොකද? වැඩක් නෑනෙ - අපි දැන් කරන්නෙ තිලාකාෆ් ජෝඩුවක් එක්ක රංචුවක් මේ විදියට තමුන්ට ඕන තැනක පොකුණු වළල්ලක්

හදල ලස්සනට කර ගෙන යන්න - ගෘහෝද්‍යානෙක හරි එපාට්මන්ට් එකක කොමන් කම්පවුන්ඩ් එකක හරි හොටෙල් ගාඩ්න් එකක හරි කැමති තැනක අපේ උපදෙස් - කම්කරු - තාක්ෂණ ශිල්පීන් ටීම් එකක් යොදවල සම්පූර්ණයෙන් නිම කරල දෙන්න - කියන්නෙ පැකේජ් එකටම - තරමක ගාණක් වෙනව - නමුත් වටිනවනෙ - සූම් මීටින් එකක් අරේන්ජ් කරගෙන අපිට පුළුවනි සර් එක්ක කතා කරන්න - මිස්ටර් මාලිම්බඩ කැමති නම් ඔෆිස් එකේ ඉන්නව තාරුක කියල මැනේජර් කෙනෙක් - කතා කරන්න පුළුවනි.”

හදිසියේම කිසියම් අපහසුතාවයකින් මගේ හිස භ්‍රමණය වන්නට විය. දකුණු පස වූ සිමෙන්ති ගැටියේ හිඳගත් මම අපහසුතාව මඳක් සමනය වන තුරු සිටින්නට සිතුවෙමි. මා සිමෙන්ති ගැටියේ හිඳ ගනු බලා කතාව නැවැත්වූ තලිතරත්න, මගේ අපහසුතාවයට හේතු විමසනු ඇතැයි සිතුවත් එය සිදුවූයේ නැත. පිළී ගන්ධයක අප්‍රිය බවකින් හකු පාඩා මුලට කෙළ ගලා එමින් වමනයක සංඥා පහළ වුවද, මම ආයාසයෙන් ඒ මැඩගෙන නැඟී සිටින්නට උත්සාහ කළෙමි.

“අද උදේ ආව මිස්ටර් මාලිම්බඩ දන්නවත් ඇති - හුඟක් ප්‍රසිද්ධයි එයා - ආකිටෙක්ට් - බාසුරු කියල - එයා ඩිසයින් කරන අලුත් ගේක ගාඩ්න් එකට - තරමක ඉඩක් නම් ඕනෙ ...”

තලිතරත්න මා පොළඹවන්නේ කුමකටදැයි මට තේරුම් ගත හැකිය. මා කිව යුත්තේ කුමක්ද? නැවතද මා හිස බමන්නාක් මෙනි - නෑ - මම හිස දෙපසට සැලී යද්දී මටම කියා ගතිමි. රුචිර - මොකක්ද මේ? මගේ දෑස තදින් පියවී තිබුණේ තත්පර කිහිපයක් පමණි. ඒ තත්පර කිහිපය ගෙවී ගොස් දෑස් විවර වත්ම, තලිතරත්නගේ නොවෙනස් බලාපොරොත්තුව දැල්වෙන දෑස මා වෙත එක එල්ලේ යොමුව තිබෙනු දැක ගත හැකි විය.



සංස්කරණය:
තලතා ගුණසේකර

# මැතිවරණය දා මගේ කුඩා හිම්දිරිය

පෙරළිලා
පිණි බිංදු බවුසරයක්
දාස්පෙතියා මල් ගොල්ලට

තටු පොඟවගෙන පින්නෙන්
ගොඩබසී
දාස්පෙති මල් මතට
පැණි කුරුළු හෙලිකොප්ටර

ලා තැඹිලි පාට ගෑ
දිමි මොටෝ බයිසිකල්
ගේට්ටුවෙන් පිට වී ගොටුවේ
ඇදෙනවා අතු දිගේ පහළට

කඳුවැටිය
මිහිදුම් සිගරෙට්ටු උර උර
අළු කඩයි, නිම්නයට

කරක කරක
ඕලු මල් ස්ටාර්ට් කරවන යතුර
ඉර බසී - දොළ දියට

පැහැදිලිව පෙනෙයි දැන් දොළ පතුල
පැහැදිලිව දිලෙයි දැන් තුරු වදුල
අපැහැදිලි කිසි දෙයක
ඡායාවකුදු නැති උදයක
පැහැදිලි අපේක්ෂකයෙක් නැති තැන
මං ප්‍රාර්ථනා කෙරුවා

'කැනබීස් යෝධයා පැමිණ
පෙරදිග බන්ධනාගාරය සිඳ බිඳ
මුදාගෙන සිරකරුවන්
අම්බරයට විසිකරත්වා!" කියා
ඔව් - මම ප්‍රාර්ථනා කෙරුවා

**රුවන් බන්දුජීව**

# ඕ...

ඕ සෙමින් මා අසලින් ඇඟිලි තැබුවාය
මම සෙමින් ඒ ඇඟිලි මත
අත තැබුවෙමි

සීතල උණුසුමක්
ඉසියුම් නහර දිගේ
ගමන් කරන්නට වීය

දෙකොපුල් රෝස පැහැ ගැන්වී
"නිසලව හුන් ඇගේ ලිහිල්
කෙස් රොදක්
මා මුහුණේ හැපෙත්ම"
ත්‍රීවිලය බ්රේක් කළේය.

මම බෝඩිමටද
ඇය ගෙදරටද යා යුතු
ශ හන්දියට අප පැමිණ තිබුණි

හිතවතිය මේ අහඹු වෙන්වීම්
කොතරම් අරුමැසිද
සමනල වැවේ වාන් දොරටු
හැර ඇති බැවින් පාර වසා තිබුණි

**සමන් පෙරමුණ**

# කීර්තිය

කීර්තිය
ඔබ කෑම පිසිනවිට
කුස්සියේ උදුනකින් පිටවන
කළු දුමාරයක් පමණය

ඉතින් එයින්
පුදුම වන්නේ කුමකට
උඩඟු වන්නේ කුමකට

සාමාන්‍යම දෙයකි දුමාරය
එයින් සිදුකරන්නේ
දසුන් පථ වසාලීම විතරය...

**කමලා දාස්**
**පරිවර්තනය : ලක්ශාන්ත අතුකෝරළ**

කාටත්
ලේසි නැති කාලෙක
හිනා නැති
සඳ වන් ළඳක්
මුතු දසනින් සිනා සිසී
අරුමැසි ගුණ
දත් බෙහෙතක කියා සිටී

දත සුදු දකෝ
කොයි කාලෙත් එහෙම වෙතී
දත් පා හිනා පා
නොයෙකුත් හීන දෙතී

මෙනෙවිය
අපට දත් මිටි කා දතුත් නැතී
ටෙලිවිෂණයෙන්වත්
ඔය වැනි හිනා වටී

**අනුර කේ. එදිරිසූරිය**

ගමන් තුනකින්
එකම අරමුණක
ඔරලෝසුවේ
කටු...

**අනුරසිරි හෙට්ටිගේ**




පෝරිසාද ධාරානිපාත වර්ෂාවේ වැහි කල්පනාවකට වැටුණා.

"වැස්ස වැස්ස වැස්ස. රජවරු ධාර්මික වුණාම එහෙම තමයි. අකාල වැහි කාල වැහි. ගම්දනව් යටවෙන්න ගලනවා. එදා වේල හොයාගන්න බැරි වුණු එකාට වැස්ස කියන්නේ බඩගින්න."

පෝරිසාදගේ වැහි කල්පනාව මැද්දට ඈතින් ලතෝනියක් කඩා වැදුණා.

"මෙන්න එකෙක් කුණු කාණුවට වැටුණෝ..."

පෝරිසාද එක පිම්මේ එතන. කුණු කාණුව පිටාර ගලනවා. ඒකට වැටුණු මිනිහෙක් දනිපනි ගානවා. පෝරිසාද ෂෝට පිටින්ම වතුරට පනින්නයි හැදුවේ.

"හෝව් හෝව් මල්ලී මල්ලිට බෑ. පලපුරුදු අය වෙන ඉන්නවා. ඒ අයට තව පුළුවන්."

"පල, පල, පල, මොන පලපුරුදුද වැවරවුමේ ජීවත් වෙන අපිට එනවා ගිලෙන එවුන් බේරාගන්න හැටි කියලා දෙන්න."පෝරිසාද ෂෝට ගලවලා යට ඇඳුමට බැස්සා.

"මල්ලියා, මල්ලියට තේරෙන්නේ නෑ ඕවා. හැත්තෑ පස්වසරක පලපුරුද්ද එහෙමද? මේ අන්තිම අවස්ථාවත් දීලා බලමු දෙයියා." අර පැන පැන දෙන පොර නලියන්න ගත්තා.

"හරි හරි තමුසේ කවුද ඕයි, ඉක්මනට ඉක්මනට අරූ ගිලිලා මැරෙයි." පෝරිසාද බෙරිහන් දෙනවා.

"මම නෙවෙයි අරූ. සමාවෙන්න අරූ කිව්වේ අපේ අවසනාවන්ත සිහින පැටියට. "

"ඉතින් කවුද ඩෝ ඌ ගෙනෙන් ඉක්මනට මෙතෙන්ට."

"මිත්‍රවරුනි, මම පොරක් සුපිරි පොරක් මම ස්විම්ං චක්‍රවර්ති"

"කතා නෙවෙයි බැහැපං වැඩේට මම චක්‍රවර්ති නෙවෙයි මම වසවර්ති."

"මම මේ දියේ ගිලෙන මිත්‍රයාට කියන්නේ. ඉක්මනට කටයි නහයයි අතින් වහගෙන මං කියන දේට උත්තර දෙන්න. මට සහය වන්න."

චක්‍රවර්ති දියේ ගිලෙන එකාට බණ දෙසන්න ගත්තා.

"දැන් එතකොට දියේ ගිලෙන එකා නහයයි කටයි වහගන්න ඕන ද?"

පෝරිසාද ඔරොප්පුවට ඇහුවා.

"ඔව් නේන්නම් මිත්‍රවරුනි,. නැත්නම් කොහොමද අපි සාකච්ඡාවෙන් සම්මුතියෙන් යුතුව මොහු ගලවා ගන්නේ. "

"උත්තර දෙන්නත් ඕනද?" පෝරිසාද කින්ඩියට ඇහුවා.

"නැතුව. නැතුව."

ගාම්භීර හඬින් චක්‍රවර්ති ටෝක් කළා.

"එතකොට ගොබ්බෝ, ඌ උත්තර දෙන්නේ කටෙන්ද පු....බීප් බීප් බීප් ?"

පෝරිසාදට මල පැනලා.

"ඔව් නේද අතෙන් කට වහගත්තම කටෙන් කතා කරන්න බැරි වෙනවානේ. එතකොට නම් ඉතින් බීප් බීප් බීප් බීප් තමයි. බුදු අම්මෝ ඉක්මනට කොටු කොටු කොටු දාන්න. වැඩිහිටියන්ට පමණයි. ලැජ්ජාවේ බෑ."

චක්‍රවර්ති ඇඹරෙන්න ගත්තා.

"අඩෝ තව මොහොතකින් අරූ ගිලෙන්නයි යන්නේ."

"ඕවත් වැඩද මල්ලි ඕවත් වැඩද....හරි හරි මිත්‍රවරුනි, ඔන්න මම  පැන්නා අල්ලා ගන්න මගේ කකුල් දෙකෙන්. හයියෙන් අල්ලා ගන්න හොඳේ."

කලින්ම අවස්ථාව ඉල්ලුව හෙංචයියා දුවගෙන ඇවිත් යටිකුරු සයනයෙන් ඇල වේල්ලේ බඩගාන ගොඩ පිහිනුම් චක්‍රවර්තිගේ කකුලෙන් අල්ලා ගත්තා.

"මල්ලිලා මොකක්ද මේ කලබලේ. අපි 2048 රට ගොඩගන්නවා කීවනේ. ඇයි මේ කලබල කරලා ඒකට බාධා කරන්නේ. කඳුළු ගෑස් එවන්නද අලුත් වැඩබලන පොලිස්පති අතේ. "

"මේ මොන මඤ්ඤං එක්ස්ෆයර් ඩේට් එකක්ද? කවුද ඩෝ උඹ. අර එකෙක් දියේ ගිලෙන්න හදනවා. පෙනෙන්නේ නැද්ද?

පෝරිසාදට නප්පියට තදවෙලා.

"එහෙම කතා කරන්න එපා. අපිත් වැඩ්ඩෝ තමයි. දෙවන වාරිකෙත් හම්බවුණ එකේ වැල් පාලමෙන් වංකගිරියට අතදාපු පොරක් මම. වැඩබලන... කෝ මේ වැඩබලන, අල්ලනවා අයිසේ මගේ කකුල් දෙකෙන්. බේරාගන්නා හැටි මම පෙන්වම්."

"හා හා මොකක්ද මේ කලබලේ. ඇයි එකෙක් බොම්බයි ළූනුවත් කාලද? ගාණත් සැරයි නේ. මැරෙන්නම කන්න ඇති නේද?"

වල පයයි. ගොඩ පයයි තණ්හාවයි තියාගෙන අප්පුච්චා එන්ටර් වුණා එතනට.

"නෑ සුදු ළූනු නෙවෙයි අමු කාලා. අරූ ගිලෙනකම් බේරාගන්න දෙන්නේ නෑ මුන්. අර එකෙක් දියේ ගිලෙනවා ඕ...යි.."

"කරදියේ පීනපු අප්පච්චිට ඕකත් කජ්ජක්ද අල්ලනවා මගේ කකුල් දෙකෙන්"

හෙංචයියෙක් පැනපු ගමන් කිරිසුදු කකුල් දෙකෙන් අල්ලපි. ඒ වීරයත් ඇල බන්ට් එකේ දපලා පෙරළුණා වතුරට පැත්තට ඔළුව දාලා.

දැන් අර කුණු කාණුවේ වැටුණු එකා අන්තිම අල්ලා ඉඳිල්ල අල්ලන් උඩ එනවා යට යනවා. පෝරිසාද කෝකටත් සූදානමේ ඉඳන් මේ හැත්තෑ පස් වසරක වික්‍රමයේ බෑයන්ට ඉඩ දුන්නා. අඩු පොලොන්නරුවේ රටේ ගොයියා විතරයි.

"හන් හන් හන් හා....මම මේ රෑ දහයට පත්තරෙන් දැකලා ආවේ. කෝ කෝ ඇලට පැනපු පොර. අපිට වැඩද ඕවා. අපි පරාක්‍රම සමුද්‍රයේ පැනපු එවුනුත් ගොඩ ගත්ත එවුන්. මගේ කකුලෙන් නෑ නෑ කකුල් දෙකෙන් අල්ලනවා. බයකට නෙවෙයි. අපි ඉතින් සර්ව සුභවාදීන් නේ. සූදෑනම් සරීරෙනේ."

"දැන් තොපේ වාරේ ඉවරයි යකුනේ, මේක ජනතාවගේ වාරේ. ඉඩ දීපියව් මට අර මිනිහා බේරා ගන්න." පෝරිසාද ඇලට පනින්න ඔන්න මෙන්න.

"කොහොම කිවුවත් අපි තරම් හොඳට ඔහෙට බෑ. අපිට අවුරුදු හැත්තෑ පහක පළපුරුද්ද"

හතර දෙනාම මොර දෙනවා.

ඔහොම කියාගෙන 2048 වීරයායි, බොම්බයි ළූනු කාරයයි, ගිලෙන එකාගේ කලිසම් කකුල් දෙකෙන් ඇද්දා.

"ඕඩි හෙලෙයි හෙලෙයියා. ඕඩි හෙලෙයි හෙලෙයියා. ගලවාගත්තා ගලවාගත්තා....ආ ආ ආ ආ."

"ගලවා ගත්තා රෙද්ද... නෑ ගිලෙන එකාගේ කලිසම."

පෝරිසාද මොර දුන්නා.

"හූ හූ හූ හූ ඔහොම නෙවෙයි දැක්කද හූ හූ මේම මේම අපි තමයි හරියටම ගලවා ගත්තේ." ඔන්න චක්‍රවර්තියි පොලොන්නරු ගොවියයි කෑගහනවා.

"අඩෝ...ව් තොපි ගලවා ගත්තේ ගිලෙන එකාගේ ජංගියනේ. දැන් තොපිට සනීපද?"

පෝරිසාදට යකා නැඟලා.

හැත්තෑ පස් වසරක පලපුරුද්ද වතුරේ යන එකාගේ යට ඇඳුමත් ගලවා ගනිද්දි මිනිහා බෝක්කුව යටින් වැටුණා වැවට. මෙච්චර වෙලා මුන්ගේ කකුල්වලින් අල්ලාගෙන හිටපු උන්ට වැට් එක වැදිලා හිට් වුණා. හිට් එකෙන් පිට් එකට එද්දි රටේ වාසනාවට උන්ගේ අත් අත හැරුණා. "බුදුඅම්මෝ..." හැත්තෑ පස් වසරක අත්දැකීම් වැවට වැටුණා. පෝරිසාද හරි වෙලාවට වැවට පැනලා ගිලෙන්න ගිය සාමාන්‍ය මිනිහා විතරක් බේරාගෙන ගොඩට ගත්තා. දැන් පෝරිසාදත් එක්ක ජනතාවම ගොඩ.

# තවත් එක් මරණයක් නොවූ මරණය...





අපි පාසලට ඇතුළු වීමු. දුයිෂෙන් ලිප මෙළවීමට ඉදිරිපත් නොවීය.
"නැගිටිනු" යැයි හෙතෙම අණ කළේය. අපි නැගිට්ටෙමු.
"තොප්පි ගලවාපල්ලා!"
අප අණ අනුව හිස් වැසුම් ඉවත් කළෙමු. ඔහුද තමා හැඳ සිටි 'බුදිඔනි' තොප්පිය* ගලවා දැමුවේය. මෙසේ කරන්නේ ඇයි දැයි අපි නොදත්තෙමු. හෙම්බිරිස්සාවෙන් පෙළමින් සිටි ඔහු කැළඹීමෙන් යුතුව කථා කළේය.
"ලෙනින් මිය ගියා. ලෝකයේ සියලුම රටවල මිනිස්සු දුක් වෙමින් සිටිනවා. නැගිට නිශ්ශබ්දව සිටපල්ලා. ලෙනින්ගේ පින්තූරය ඉදිරිපිට නිශ්ශබ්දව සිටගනිල්ලා. මේ දිනය සිහි තබා ගනිල්ලා"
කඳු මුදුන්වල සිට පෙරලී ගෙන ආ හිමපතනයට යටවී ගියාක් මෙන් අපේ පාසල නිශ්ශබද විය.
සිදුරු අස්සෙන් හමන සුළංවල ශබ්දයද 'සුරු' 'සුරු' ගාමින් කුඩා හිම කැට පිදුරු මත වැටෙන සැටිද ඇසේ. මහා නගර ගොළු විය. පොළොව දෙදරුම් කවන කම්හල් නිහඬ විය. හඬ නඟමින් දුවන දුම්රිය අතරමග නැවතිණ. මුළු මහත් මිහි තලයම දුක් සයුරේ ගිලිණ. අපේ ජනතාවගේ ඉතා සුළු කොටසක් වන අපි ආශ්වාස ප්‍රශ්වාස නොකරමින් කාටවත් නොපෙනෙන ඒ මඩුව තුළ අපේ ගුරුතුමාත් සමග ලෙනින්ගෙ පින්තූරය ඉදිරිපිට සීරුවන් සිටගෙන දුක්බරින් පිරුණු ඒ පැයේදී ලෙනින්ගෙන් සමුගත්තෙමු. ඔහුගේ මරණය නිසා දුක්වන ළඟම සහෝදර සහෝදරියන් හා සගයින් වශයෙනි, අප එලෙස දුක්වූයේ. හිස්වැස්මකින් සැරසී, තුවාල වූ අත වෙළාගෙන සිටි අපේ ලෙනින්, බිත්තියේ සිට අප දෙස බලාගත්වනම සිටියේය. පැහැදිලි, පාරිශුද්ධ ඔහුගේ බැල්ම අප දෙස බලා මෙසේ කියන්නාක් මෙනි, මට හැඟී ගියේ; "නුඹලාගේ අනාගතය කොතරම් සැපවත් දැයි නුඹලා දන්නවා නම්, ළමයිනේ!" ඒ මොහොතේදී ඔහු මගේ අනාගතය ගැන කල්පනා කරන බවක් මට හැඟිණි. දෑතින් නෙත් පිස දැමූ දුයිෂෙන් මෙසේ කීය;
"මම ප්‍රාදේශීය නගරයට යනවා. එහි ගිහිං පක්ෂයේ සාමාජිකයෙක් වෙනවා. ආපසු එන්නේ දවස් තුනකට පස්සේ...."
මට මුණපාන්ටවූ ශීත දවස් අතුරින් අතිශයින්ම දැඩි ශීතලක් දැනුණේ ඒ දවස් තුන තුළදීය. අපේ ලොවින් තුරන්වූ ඒ මහා පුරුෂයාගේ අඩුව පුරවනු වස් සොබාදහමේ දැවැන්ත බලවේගයන් මහත්වූ පරිශ්‍රමයක් දරන්නාසේය. කෝපයෙන් බුර බරා පැන නැගුණු මහා කුණාටුව හඬ නැගුවේය. කුඩා හිම කැට කුණාටුවට අසුව ඒ මේ අත විසිර ගියේය. ඇටකටු හිරිවැටෙන තරම් තද ශිතලක් පැන නැගිණි... කුණාටුව මෙල්ල නොවීය. බුර බුරා නගිමින් මහ පොළොව මත හැප්පුණු කුණාටුව හඬා වැළපුනේය...

57-59 පිටු

* 'බුදිඔනි' තොප්පිය - සිවිල් යුද්ධ කාලයේදී සහ සෝවියට් රජය පිහිටවූ පළමුවැනි දස වසර තුළදී රතු හමුදා භටයන් පැළඳි හිස්වැස්මකි.

සෝවියට් ලේඛක **චින්ගීස් අයිත්මාතොව්**
'ගුරු ගීතය'
(සෝවියට් දේශයේ නිර්මාතෘ වී.අයි. ලෙනින් මියගොස් ජනවාරි 21 දිනට සියවසක් පිරීම වෙනුවෙනි)

















## සංහාරයට එරෙහි මනුෂ්‍යත්වය

ගාසාහි යුද්ධයට මැදි වී සිටින පලස්තීන ජනතාවට සහය පළ කරමින් ලොව පුරා ජනතාව වීදි බසින අතරතුර ඊශ්‍රායලය, පලස්තීනුවන්ට එරෙහිව සමූලඝාතන අපරාධ සිදුකරන බවට දකුණු අප්‍රිකාව විසින් එක්සත් ජාතීන්ගේ යුක්තිය සඳහා වූ ජාත්‍යන්තර අධිකරණයට (ICJ) කරන ලද පැමිණිල්ලක් විභාග වෙමින් තිබේ. එයින් ඉල්ලා ඇත්තේ ගාසාහි සියලු ආකාරයේ යුද මෙහෙයුම් නතර කරන ලෙසට ඊශ්‍රායලයට නියෝගයක් නිකුත් කරන ලෙසටය.

රාජගිරිය, කලපළුවාව, අංක 298 හි පදිංචි ටී.එම්.ජී. සංජීක රශ්මින් වන මා විසින් ටී.ඩී.එල්. ප්‍රින්ටර්ස්හි මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.